# වාර්ෂික වාර්තාව 2018

## හා මූල්‍ය ප්‍රකාශන

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## දැක්ම

*"යාවජීව අධ්‍යාපනයේ විශිෂ්ඨත්වය, කාර්යක්ෂම බව හා සාධාරණත්වය මඟින් විවෘත හා දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ ආසියාවේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම්"*

## කාර්යභාරය

*"විවෘත දුරස්ථ අධ්‍යාපනය මඟින්, උසස් තත්වයක පවත්නා වූ ද, ලද හැකි වූ ද, ජීවිතයට අදාල වු ද අධ්‍යාපනයකට පිවිසීමේ ඉඩකඩ සලසා දීම හා දැනුම අගයන සමාජයක් තුල ඇත්තා වු අභියෝගයනට මුහුණ දීමට සමත්, යාවජීව අධ්‍යාපන අවස්ථා සැලසීම්"*

## ආයතනික අරමුණු

2018 සිට 2020 දක්වා කාල පරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලයේ ආයතනික අරමුණු පහත දැක්වේ.

1. විවෘත හා දුරස්ථ ඉගෙනුම් තුළින් උසස් ගුණාත්මකභාවය හා අදාළ අධ්‍යාපනය සැලසීම.

2. සිසුන්ගේ ජීවන කුසලතා දියුණු කරගැනීම සහ වෘත්තීය අභිලාශයන් සාක්ෂාත් කරගැනීමට සිසුන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම.

3. ශිෂ්‍යත්ව, පර්යේෂණ සහ නවෝත්පාදන පිළිබඳ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් වීම.

4. අධ්‍යාපන ප්‍රවේශය පුළුල් කිරීම හා යාවජීව ඉගෙනුම් සඳහා අවස්ථා වර්ධනය කිරීම.

5. ඵලදායි හා කාර්යක්ෂම ශාස්ත්‍රීය වාතාවරණයක් විශ්ව විද්‍යාලය තුළ නිර්මාණය කිරීම.

6. උසස් ගුණාත්මකභාවයෙන් යුත් පරිපාලන සේවාවක් සහතික කිරීම.

7. ජාතික හා සමාජීය සංවර්ධනය කෙරෙහි ආයතනික වගකීම් ඉටු කිරීම.

## උපකුලපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය පසුගිය තිස් අට වසර පුරාවට දිවයිනේ පුරවැසියන් හට උසස් අධ්‍යාපන අවස්ථා සැලසීමේ නියැලී සිටී. වාර්ෂිකව, දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින 40,000 ට අධික වැඩිහිටියන් සංඛ්‍යාවක් සඳහා අප උසස් අධ්‍යාපන අවස්ථා සලසා දෙනු ලැබේ.

2018 වර්ෂයේදී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ඉටු කරන වැදගත් භූමිකාව සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා රජය හා උසස් අධ්‍යාපන බලධාරීන් විසින් දිවයිනේ ගුණාත්මක උසස් අධ්‍යාපනය සඳහා වර්ධනය වෙමින් පවතින ඉල්ලුමට සැපයීම වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් ව්‍යාප්ත කිරීමට ව්‍යාපෘති යෝජනාවක් ඉල්ලුම් කරන ලදී. අපගේ කණ්ඩායම විසින් සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාව විශ්වවිද්‍යාල පාලක සභාව අනුමත කර ඇති අතර තවදුරටත් සාකච්ඡා කිරීම හා අවසන් කිරීම සඳහා අමාත්‍යාංශයට යවා ඇත.

මෙම ව්‍යාපෘති යෝජනාව හරහා අපගේ ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන රාශියක දැනට පවතින පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුග්‍රහය ඉල්ලා සිටින්නෙමු. මෙම මධ්‍යස්ථානවල ලියාපදිංචි වන ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අපට අවම ස්ථිර කාර්ය මණ්ඩලයක් ද අවශ්‍ය වේ. **ආර්ථික නියමයන්ට අනුව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අභිප්‍රාය වන්නේ ප්‍රතිපත්ති සැලසුම්කරුවන්ට ඉතා ආකර්ෂණීය වන්නා වූ, ශිෂ්‍ය ප්‍රමාණය ඉහළ නංවාගත හැකි වන ලෙස ගුණාත්මක අධ්‍යාපන අවස්ථාවන් සැළසීම බව අප විශ්වාස කරන්නෙමු.** එනම්, වැඩි සිසුන් සංඛ්‍යාවකට බලපාන ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල සේවා ප්‍රසාරණය කිරීමට අවශ්‍යවන  ආයෝජන ප්‍රමාණය, සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයකට අවශ්‍යවන ආයෝජන ප්‍රමාණයට සාපේක්ෂව ඉතා අවම වේ. එසේම, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයෙකු වෙනුවෙන් 2018 මූල්‍ය වර්ෂයේ පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රුපියල්.72,157.39 හා රු.5,948.19ක් විය. එනම් ඕනෑම සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයකට සාපේක්ෂව ඉතා අවම අගයකි.

වසර පුරාම අධ්‍යයනය කටයුතු සඳහා ඇති විවෘත භාවය, රැකියා නියුක්තිකයින්හට විවෘත විශ්ව විද්‍යාලය ආකර්ශණීය තොරාගැනීමක් වීමට හේතු වී ඇත. මේ නිසා විශ්වවිද්‍යාලයේ සිසු ප්‍රජාවගෙන් 80% ක්ම අඛණ්ඩ රැකියාවන්හි නියුක්ත වූවෝ වෙති. ඔවුන්ට සිය අධ්‍යාපනය තවදුරටත් දියුණු කර ගනිමින් අධ්‍යාපනික හා වෘත්තීමය ප්‍රගමණ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් ජාතික සංවර්ධනයට දායක විය හැකි වගකීම් සහිත පුරවැසියන් බවට පත්වීම සඳහා විවෘත විශ්වවිද්‍යාලය අවස්ථාවන් සළසයි.

2018 වර්ෂයේදි, ලෝක ව්‍යාප්ත විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු වෙමින් පවතින නවීන සංවර්ධනයන් සැලකිල්ලට ගෙන පාඩම් ද්‍රව්‍ය සංවර්ධනයට ප්‍රවේශවීමේදී විශ්වවිද්‍යාලය ඉතා වැදගත්

පියවරක් ගෙන ඇත. ඒ අනුව, පවතින විවෘත අධ්‍යාපන සම්පත් මත පදනම්ව සංවර්ධනය වන පාඩම් ද්‍රව්‍ය සහ පෙළපොත් විධිමත් කර ඇති අතර අවශ්‍ය මාර්ගෝපදේශ සහ පිරික්සුම් ලැයිස්තු සකස් කොට පාලක සභාවේ අනුමැතිය ලැබී ඇත.

2018 වර්ෂයේදී ඉන්දියාවේ, නව දිල්ලි, ආසියානු පොදුරාජ්‍ය මණ්ඩලීය අධ්‍යාපන මාධ්‍ය මධ්‍යස්ථාන අනුග්‍රහය සහිතව වෘත්තිකයන් වෙනුවෙන් විවෘත අධ්‍යාපන සම්පත් හා විවෘත අධ්‍යාපන අභ්‍යාස වෘත්තීය සංවර්ධනය අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා මෝස්තර, සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම පිළිබඳ අතිවිශාල විවෘත මාර්ගගත පාඨමාලා පර්යේෂණ ව්‍යාපෘති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කරන ලදි.

මෙම වර්ෂයේදී විශ්වවිද්‍යාලය නව උපාධි වැඩසටහන් ද්විත්වයක් ආරම්භ කරන ලදි. සෞඛ්‍ය විද්‍යා පීඨයේ මනෝවිද්‍යා හා උපදේශන දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් මාධ්‍යයෙන් පිරිනමන ලද ප්‍රථම මනෝවිද්‍යා උපාධිය වන මනෝවිද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන ආරම්භ කරන ලදි. දිවයිනේ ප්‍රථම විවෘත හා දුරස්ථ ඉගෙනුම් පහසුකම් ලද පුස්තකාල හා තොරතුරු විද්‍යාවේදී උපාධි (LIS) වැඩසටහන දියත් කරමින් දේශයේ ඉතිහාසයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තවත් ඓතිහාසික සංධිස්ථානයක් නිර්මාණය කිරීමේ අභිමානය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සතු වේ. මේ අතරතුර, විවෘත හා දුරස්ථ අධ්‍යාපන කරළිය හරහා යාවත්කාලීන හා කැපීපෙනෙන හා කලා උපාධියක් (BA) පිරිනැමීම මගින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාල කණ්ඩායමක් ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රය නැවත පරික්ෂා කිරීමට හා නැවත කියවීමට පමණක් නොව වෙළඳපළ වෙනස්වන වෘත්තීය අවශ්‍යතාවයන් වෙත ප්‍රතිචාර දැක්වීමටද කටයුතු කර ඇත. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ යෝජනාවක් මත සංගමයේ රාජ්‍ය තාන්ත්‍රිකයින්ට තරඟකාරි ජාතික විශ්වවිද්‍යාලයක් මගින් ඔවුන්ගේ වෘත්තීය කුසලතා සම්බන්ධව සුදුසු උපාධියක් ලබා ගැනීම උදෙසා මෙම කලා උපාධිය නිර්මාණය කරන ලදි. මෙම වැඩසටහන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය මගින් පිරිනමන අතර වැඩසටහන පරිපාලනය කිරීම සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කරන ලදි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය පුස්තකාලය විසින් ලෝක ව්‍යාප්ත වෙබ් අඩවි වල පවතින විවෘත අධ්‍යාපන සම්පත් ලැයිස්තුගත කර කාර්ය මණ්ඩලයට, ශිෂ්‍යයන්ට හා මහජනතාවට ලබා ගත හැකි ලෙස සකස් කිරීමට ව්‍යාපෘතියක් අරඹා ඇත.

2018 වසරේ සිට, අධ්‍යයන දෙපාර්තමේන්තු අනවශ්‍ය පරිපාලන බරකින් නිදහස් කරමින් ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම හා පිරිවැය ඵලදායී කරමින් පාඩම් ද්‍රව්‍ය ඇණවුම් කිරීම මෙහෙයුම් අංශය විසින් පවරාගෙන ඇත. මුද්‍රිත පාඩම් ද්‍රව්‍ය තොග අධීක්ෂණය කිරීම 2018 වර්ෂය තුළ OMIS පද්ධතියේ කොටසක් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

නව අධ්‍යයන වර්ෂය සඳහා කාල සටහන් සැකසීමේදී පන්ති කාමර උපරිම ලෙස භාවිතා කිරීම සඳහා සියළුම දෙපාර්තමේන්තු එකඟ වී ඇති වෙනස් නොවන පාසල් දින කාල පරාසයන් අනුගමනය කරයි. මෙතැන් පටන්, සමස්ත විශ්ව විද්‍යාලයේ සියළුම අධ්‍යයන ක්‍රියාකාරකම්වල කාල සටහන් සැකසීම,

ඉංජිනේරු තාක්ෂණ පීඨය පසුගිය වසර ගණනාවක් තිස්සේ සිදුකර ඇති පරිදි OMIS පද්ධතිය හරහා සිදු කෙරේ. ඒ සඳහා අවශ්‍ය පුහුණුව අදාල කාර්ය මණ්ඩලය වෙත දැනටමත් ලබා දී ඇත.

පසුගිය වර්ෂය පුරාවට සමස්ත විශ්ව විද්‍යාලය විසින් බාරගන්නා ලද විශාලතම කාර්යයක් වූයේ SLFQ (Sri Lanka Qualifications Framework) අනුකූලව වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමයි.

2018 වර්ෂයේදී, උපාධි වැඩසටහනකට ඇතුළත් වීම සඳහා අවශ්‍ය ඇතුළත්වීමේ සුදුසුකම් නොමැති ශිෂ්‍යයන් වෙනුවෙන් විද්‍යාව පිළිබඳ පදනම් පාඨමාලාව විශ්වවිද්‍යාලය විසින් යළි අරඹන ලදි. මෙම අරමුණ සඳහා විශ්වවිවිද්‍යාලයීය පදනම් පාඨමාලා පරිපාලනය කළ හැකි පදනම් අධ්‍යයන ඒකකය විශ්වවිද්‍යාලය විසින් ස්ථාපනය කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාවේ මගපෙන්වීම මත, විශ්වවිද්‍යාලය එහි ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය (Centre for Gender Equity and Equality) පිහිටුවන ලදි. මෙම මධ්‍යස්ථානය 2018 වර්ෂයේ ජනවාරි සිට ක්‍රියාත්මක වනු ඇත.

ශ්‍රී ලංකා පාසල් තුළ ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය සහ එහි බලපෑම ඇගයීමට ලක්කිරීම තුළ පොදුරාජ්‍ය මණ්ඩලීය ඩිජිටල් අධ්‍යාපන නායකත්ව පුහුණු ක්‍රියාමාර්ග වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් අනුග්‍රහය සහිතව පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ පාසල් ගුරුවරුන් අතර ශක්‍යතාව වැඩි දියුණු කිරීම හා පාසල් තුළ ඩිජිටල් අධ්‍යාපන වටපිටාවක් යොදාගැනීම ප්‍රවර්ධනය කිරීමයි.

2018 වර්ෂය සඳහා විවෘත විශ්ව විද්‍යාල ආසියානු සංගමයේ හොඳම අභ්‍යාස ප්‍රදානය සඳහා වන රන් හා රිදී පදක්කම්, ඉදිරිපත් කරන ලද පත්‍රිකා 350ක් අතුරින් විවෘත විශ්වවිද්‍යාලය දිනා ගන්නා ලදි. තවද, ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්වෙන 2020 ආසියානු විවෘත විශ්වවිද්‍යාල සංගමයේ සම්මේලනය වෙනුවෙන් සත්කාරකත්වය ලබාදීමේ ටෙන්ඩරය විශ්වවිද්‍යාලය විසින් ලබාගන්නා ලදි.

පසුගිය අවුරුදු කිහිපය තුළ විවෘත විශ්වවිද්‍යාලයීය කළමනාකරණය විශ්වවිද්‍යාල අධ්‍යයන ප්‍රජාවට විවිධ දිරිගැන්වීම් සපයමින් පර්යේෂණ සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. වර්තමානයේදී, පර්යේෂණ අරමුදල් වැදගත් සංදිස්ථානයක් වෙත ගෙන එමින් පසුගිය වසරේදී ඉල්ලුම් කරන ලද පර්යේෂණ අරමුදල් ප්‍රමාණය අයදුම් කල සියලු දෙනාටම සැපයීමට විශ්වවිද්‍යාලයට හැකි විය. සෑම අවසන් වසර ශිෂ්‍ය ව්‍යාපෘතියක් සඳහාම උපරිම 50,000/= ක් වශයෙන් අරමුදල් සම්පාදනය කිරීමට කටයුතු කරන ලදි. මෙම මූල්‍ය වර්ෂය වෙනුවෙන් පර්යේෂණ සඳහා වෙන් කරන ලද අරමුදල් තවදුරටත් වැඩි කරන ලදි.

විශ්වවිද්‍යාලයීය ආයතනික පර්යේෂණ වර්ධනය කිරීම උදෙසා දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ උපදේශ කමිටුව (CRADE) විශ්වවිද්‍යාලය විසින් නැවත ස්ථාපනය කරන ලදි. 2018 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසිය (OURS) සාර්ථකව පවත්වන ලදි. 2018 වර්ෂයේදී, විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ඇතිව පුස්තකාලය විසින් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට නිවසේ සිට සම්පත් වෙත ප්‍රවේශ වීමට හා ජර්නල් දත්ත සමුදාය වෙත දුරස්ථ ප්‍රවේශය සැලසීමට සකස් කරන ලදි.

කර්මාන්ත සබඳතා මධ්‍යස්ථානයෙන් සපයන ලද සහයෝගය සහිතව ඉතිහාසයේ ප්‍රථම වතාවට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම් පදනම් කරගෙන විවෘත විශ්වවිද්‍යාලය නමින් පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම්පත් යොමු කිරීමට හැකි විය. විශ්වවිද්‍යාලය හා කර්මාන්ත ක්ෂේත්‍රය අතර සහයෝගීතාව ගොඩනැගීම අරමුණු කරගෙන කර්මාන්ත සබඳතා මධ්‍යස්ථානය කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ අඛණ්ඩව කටයුතු කළේය. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ මෙම පහසුකම තවදුරටත් වර්ධනය විය.

ගෝලීය ත්‍රිමාණ මුද්‍රණ දිනයට සමගාමීව අධ්‍යාපන අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ පාසල් දරුවන් මූලික කරගෙන ත්‍රිමාණ මුද්‍රණ කඳවුර වැඩසටහන සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මෘදු රොබෝවිද්‍යාව පර්යේෂණ කණ්ඩායම ඇරයුම් ලබන ලදි. "මෘදු රොබෝවිද්‍යාව හා ගෝලීය ප්‍රවණතා" පිළිබඳ දේශනයක් ඉදිරිපත් කරන අතර මෘදු රොබෝවිද්‍යාව හා ආශ්‍රිත තාක්ෂණය හඳුන්වාදෙමින් තරුණ පාසල් දරුවන්ගේ දැනුම උසස් කිරීම හා වැඩි දියුණු කිරීම අපගේ පර්යේෂණ කණ්ඩායම විසින් සිදු කරන ලදි. නව සංකල්ප ඉස්මතු වන අතර එය ගෝලීය ප්‍රවණතාවයක් ලෙස ඉස්මතු වන බැවින් මෘදු රොබෝවිද්‍යාඥයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග මගහරවාගන්නේ කෙසේද යන්න පිළිබඳව තරුණයන් සමග අත්දැකීම් බෙදාහදා ගන්නා ලදි.

2018 ජනවාරි මස මන්නාරමේදී නව අධ්‍යයන මධ්‍යස්ථානයක් උත්සවාකාරයෙන් විවෘත කරන ලද අතර රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් රත්නපුර නව නගරයේ පිහිටා ඇති ඉඩමක් වෙන් කර ඇත. යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ යෝජිත සිව් මහල් ගොඩනැගිල්ල වෙනුවෙන් සාම්ප්‍රදායික බිම් කැඩීමේ උත්සවය මෙම වර්ෂයේදී සිදු විය.

ජපානයේ, ඔකයාමා සහ ඔසාකා විශ්වවිද්‍යාලයේ විද්‍යාව පිළිබඳ ජපන්-ආසියානු තරුණ හුවමාරු වැඩසටහන සඳහා උපාධි අපේක්ෂක සිසුන් 8 දෙනෙකුගේ නියෝජිත පිරිසක් හා ඉංජිනේරු තාක්ෂණ පීඨයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙක් සහභාගි විය. මෙම නිරාවරණය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් සඳහා අධ්‍යයන හැකියාවන්ගේ නව දර්ශනයක් විවර කරන ලද අතර අන්‍යෝන්‍ය අවබෝධයක් නිර්මාණය කිරීමට හා වෙනස් සංස්කෘතීන් වෙත ගෞරව කිරීම සඳහා උපකාරී විය.

තවද, මෙම වර්ෂය අතරතුර OpenUTube හා OpenCast යන විශ්වවිද්‍යාලයීය වීඩියෝ නාලිකා ද්විත්වය ද ආරම්භ කරන ලදි.

විශ්වවිද්‍යාලයේ මෙහෙවර ඉටු කිරීම හා රටේ පුරවැසියන්ට දැරිය හැකි උසස් අධ්‍යාපන අවස්ථා සැපයීම සඳහා අප සතු සම්පත් සීමාව තුළ අවශ්‍ය සියලු සහය සපයා දීමට විශ්ව විද්‍යාලයේ අප සැම කැප වී සිටින් බව මෙයින් ප්‍රකාශ කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එස්.ඒ.අරියදුරෙයි

උපකුලපති

# පටුන


**1 කොටස - සාමාන්‍ය……………………………………………………………………1**

**1.0** සාමාන්‍ය……………………………………………………………………2

1.1 විශ්ලේෂණය……………………………………………………………………2

1.2 පාලන අධිකාරිය……………………………………………………………………4

**2 කොටස - කාර්ය මණ්ඩලය……………………………………………………………………9**

**2.0.** ආයතනික ව්‍යුහය……………………………………………………………………10

2.1 කාර්ය මණ්ඩල තොරතුරු……………………………………………………………………12

2.1.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය……………………………………………………………………12

2.1.2 අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය……………………………………………………………………12

2.1.3 පුස්තකාල කාර්ය මණ්ඩලය……………………………………………………………………13

2.1.4 පරිපාලන කාර්ය මණ්ඩලය……………………………………………………………………13

2.1.5 වෙනත් විධායක කාර්ය මණ්ඩලය……………………………………………………………………14

2.1.6 අනධ්‍යයන කාර්ය මණ්ඩලය……………………………………………………………………14

**3 කොටස - ශිෂ්‍ය කාර්ය සාධනය……………………………………………………………………15**

**3.0.** ශිෂ්‍ය කාර්ය සාධනය……………………………………………………………………16

3.1 බඳවා ගැනීම්……………………………………………………………………16

3.1.1 දේශීය ශිෂ්‍යයන්……………………………………………………………………16

3.1.2 විදේශීය ශිෂ්‍යයන්……………………………………………………………………16

3.2 සම්පූර්ණ කිරීම……………………………………………………………………17

3.2.1 උපාධි ප්‍රදානෝත්සවය……………………………………………………………………17

3.2.2 සහතික පත්‍ර ප්‍රදාන……………………………………………………………………17

3.3 ශිෂ්‍ය ප්‍රජාවගේ ජයග්‍රහණ……………………………………………………………………18

**4 කොටස - පීඨ වාර්තා……………………………………………………………………22**

**4.0.** පීඨ වාර්තා……………………………………………………………………23

4.1 අධ්‍යාපන පීඨය……………………………………………………………………23

4.1.1 විශ්ලේෂණය……………………………………………………………………23

4.1.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම……………………25

4.1.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය……………26

4.1.4 නව පාඨමාලා / වැඩසටහන්……………………………………………………………………26

4.1.5 මාර්ගගත පාඨමාලා……………………………………………………………………27

4.2 ඉංජිනේරු තාක්ෂණ පීඨය……………………………………………………………………28

4.2.1 විශ්ලේෂණය……………………………………………………………………28

4.2.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම……………………29

4.2.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය……………30

4.2.4 නව පාඨමාලා/ වැඩසටහන්……………………………………………………………………30

4.2.5 මාර්ගගත පාඨමාලා……………………………………………………………………31

4.3 සෞඛ්‍ය විද්‍යා පීඨය......32
4.3.1 විශ්ලේෂණය......32
4.3.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම......34
4.3.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය......34
4.3.4 නව පාඨමාලා/ වැඩසටහන්......34
4.3.5 මාර්ගගත පාඨමාලා......35
4.4 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය......37
4.4.1 විශ්ලේෂණය......37
4.4.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම......39
4.4.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය......40
4.4.4 නව පාඨමාලා / වැඩසටහන්......40
4.4.5 මාර්ගගත පාඨමාලා......41
4.5 ස්වභාවික විද්‍යා පීඨය......42
4.5.1 විශ්ලේෂණය......42
4.5.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම......44
4.5.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය......45
4.5.4 නව පාඨමාලා/ වැඩසටහන්......46
4.5.5 මාර්ගගත පාඨමාලා......46

**5 කොටස - පර්යේෂණ සහ ප්‍රකාශන......48**

**5.0. පර්යේෂණ සහ ප්‍රකාශන......49**
5.1 පර්යේෂණ ව්‍යාපෘති/ පත්‍රිකා......49
5.2 ග්‍රන්ථ/ පේටන්ට්......50
5.3 සම්මාන......50

**6 කොටස - මධ්‍යස්ථාන සහ ඒකක......51**

**6.0. මධ්‍යස්ථාන සහ ඒකක......52**
6.1 ප්‍රාදේශීය අධ්‍යාපන සේවා......52
6.2 පුස්තකාලය......54
6.3 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය......55
6.4 වෘත්තීය උපදේශන ඒකකය......57
6.5 මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය......58
6.6 ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය......60
6.7 ජාත්‍යන්තර සබඳතා ඒකකය......61
6.8 ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය......66
6.9 අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය......70
6.10 උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය......73

**7 කොටස - අනාගත සැළසුම්......74**

**7.0. අනාගත සැළසුම් - 2019......75**

**8 කොටස - ගිණුම්……………………………………………………………………77**

**8.0.** ගිණුම් ........................................................................................................ 78

**8.1** පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර……………………………………………………78

**8.2** ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර……………………………………………………...78

**8.3** ව්‍යාපෘති ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සපයන ලද)…………79

**8.4** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)………………………………………………82

**8.5** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදනය කළ ආදායම)……………………………………82

**8.6** මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2018……………………………………………….. 82

**8.7** 2018 වසරේදී ලැබුණු යටිතල පහසුකම්…………………………………………….. 82

**9 කොටස - වෙනත් තොරතුරු/ මෙම වාර්තාවට අදාළ කාර්ය සාධනය………………………83**

**9.0.** වෙනත් තොරතුරු/ මෙම වාර්තාවට අදාළ කාර්ය සාධනය……………………………………84

**9.1** විගණකාධිපති වාර්තාව……………………………………………………………84

**9.2** පිළිතුරු වාර්තාව……………………………………………………………………95

**9.3** මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය……………………………………………………106

**9.4** මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය……………………………………………108

**9.5** මුදල් ප්‍රවාහ ප්‍රකාශය…………………………………………………………………110

**9.6** ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය………………………………………………………... 111

**9.7** මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්……………………………………………………………112

**9.8** අයවැය හා තථ්‍ය මුදල් සංසන්දනය කිරීම පිළිබඳ ප්‍රකාශය……………………………117

**9.9** ස්වභාවය අනුව වියදම් වර්ගීකරණය කිරීම…………………………………………118

**9.10** පසුගිය වර්ෂ පහ තුළ මූල්‍යමය ලෙස වැදගත් සිදුවීම්…………………………………119

**ඇමුණුම්……………………………………………………………………………121**

(අ) පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු (ඉංග්‍රීසි මාධ්‍යයෙන් සඳහන් කොටසෙහි ඇමුණුම්වල ඇතුළත් වේ. පිටු අංක 110-150)

(ආ) අධ්‍යයන/ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර - 2018…………………………122

අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර - 2018……………………………………………..…..124

# 1 කොටස - සාමාන්‍ය

## 1.0. සාමාන්‍ය

### 1.1 විශ්ලේෂණය




විවෘත හා දුරස්ථ ඉගෙනුම් විශ්වවිද්‍යාලයක් ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද්දේ වර්ෂ 1980 ජූනි මස 19 වැනිදාය. 1978 විශ්වවිද්‍යාල පනතෙහි අංක 16 හි 23 (01) හා 18 වගන්ති ප්‍රකාරව 1980 අංක 03 දරණ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ආඥා පනත අනුව ද ඉන් අනතුරුව සංශෝධිත 1983 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ආඥා පනත් අංක 01 හා 1996 ආඥා පනත් අංක 12 යටතේ එම ස්ථාපනය සිදු විය. මෙම ආරම්භක පියවරෙහි අවසාන අරමුණ වූයේ "යාවජීව අධ්‍යාපන අවස්ථා සැලසීමත් එමඟින් උසස් අධ්‍යාපනයට පිවිසීම තුළින් ජීවන අවස්ථා වැඩිදියුණු කර ගැනීමට සෑම පුරවැසියෙකු සතු හිමිකම සලසා දීමත්ය."

ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්වවිද්‍යාල 15න් එකක් වන විවෘත විශ්වවිද්‍යාලය, නීතිමය, ආයතනමය හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාවේ අනිකුත් විශ්වවිද්‍යාල හා සමානව ක්‍රියාකරයි. එසේ වුවද, වයස, පූර්ව අධ්‍යාපන සුදුසුකම්, ආදායම, භූගෝලීය සාධක සහ වෘත්තීමය වශයෙන් ඇති බාධා යන කරුණු කිසිවක් නොතකමින් උසස් අධ්‍යාපනය සඳහා ඉඩකඩ වඩාත් ප්‍රසාරණය කිරීම අරභයා විවෘත හා දුරස්ථ අධ්‍යාපන දර්ශනය කෙරෙහි එහි පවතින නිදහස් ස්වභාවය කරණකොට ගෙන අනිකුත් ජාතික තලයේ විශ්වවිද්‍යාලවලින් මෙම ආයතනය වෙන් කර දැක්විය හැකිය.

විවෘත විශ්වවිද්‍යාලය අධ්‍යාපන, ඉංජිනේරු තාක්ෂණ, සෞඛ්‍ය විද්‍යා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සහ ස්වභාවික විද්‍යා යන පීඨ පහට අනුයුක්ත අධ්‍යයන දෙපාර්තමේන්තු 25 කින් සමන්විත වේ. එමඟින් පවත්වාගෙන යනු ලබන අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව 62ක් වන අතර 39,908ක් වූ පිරිසකට අධ්‍යයන කටයුතු කරගෙන යනු ලැබේ. තවද විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන කෙටිකාලීන පාඨමාලා රාශියකි. ඒ අතර ආධුනිකයන් සඳහා දමිළ භාෂාව, ආධුනිකයන් සඳහා සිංහල භාෂාව,

පරිගණක හා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් විවිධ මට්ටමේ පාඨමාලා වැදගත් වේ. ප්‍රමාණයෙන් 62ක් වූ අධ්‍යයන වැඩසටහන්වල සංයුතියට සහතික පත්‍ර පාඨමාලා 17ක්, ඩිප්ලෝමා පාඨමාලා 09ක්, ප්‍රථම උපාධි පාඨමාලා 14ක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 06ක්, විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි පාඨමාලා 13ක්, එක් පදනම් පාඨමාලාවක් හා හුදෙකලා පාඨමාලා 04ක් ඇතුලත් වේ. ඒ අතර START@OUSL වැඩසටහන ද වේ. තවද දර්ශනවේදී හ දර්ශනශූරී උපාධි වැඩසටහන් ද පවත්වාගෙන යනු ලබන බව සඳහන් කළ යුතුය.

රැකියාවල නියුක්ත වැඩිහිටි පිරිස් හා සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීමේ අවස්ථා අහිමි වූ පිරිස්වලට අධ්‍යාපනය සඳහා වෛකල්පිත සැලසුම් ඉදිරිපත් කරමින් විවෘත විශ්වවිද්‍යාලය අධ්‍යාපන ක්ෂේත්‍රය උදෙසා කැපීපෙනෙන මං පෙත් විවර කර ඇත. ස්ව කැමැත්ත අනුව තම අධ්‍යාපන ක්ෂේත්‍රවල තෘතීය අධ්‍යාපනය කෙරෙහි යොමු වීමට, විවෘත විශ්වවිද්‍යාලයීය බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය පහත සඳහන් පුද්ගලයන් හට පහසුකම් සපයයි.

- වෘත්තීයමය වශයෙන් අඛණ්ඩව ඉදිරියට යාමට කැමැත්තක් දක්වන රැකියාවල නියුතු පිරිස්
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙ.) විභාගය සමත් වූ එහෙත් මූල්‍යමය ගැටළු, පවුලේ ප්‍රශ්න හෝ ලබා ගත යුතු ලකුණුවලට ළඟා නොවීම යන හේතු පදනම් කරගෙන සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීමට නොහැකිවන පිරිස්
- වෙනත් හේතූන් මත දැනුම ලබා ගැනීමට උනන්දුවක් දක්වන පිරිස්

## 1.2 පාලන අධිකාරිය

**විශ්වවිද්‍යාලයේ කුලපති:** විද්‍යාජෝති මහාචාර්ය.කොල්වින් ගුණරත්න

**විශ්වවිද්‍යාලයීය පාලක සභාව:**

**නිල බලයෙන් සාමාජික**

උපකුලපති: මහාචාර්ය.එස්.ඒ.අරියදූරෙයි

නියෝජ්‍ය උපකුලපති: මහචාර්ය.ජී.එම්.කේ.බී.ගුණහේරත්

**පීඨාධිපතිවරු**

අධ්‍යාපන පීඨය: මහාචාර්ය.පී.සී.පී ජවුෆර්
මහාචාර්ය.එස්.පී කරුණානායක මිය
(2018.03.04 සිට)

ඉංජිනේරු තාක්ෂණ පීඨය: ආචාර්ය.කේ.ඒ.සී.උදයකුමාර්
මහාචාර්ය.ඩී.ඒ.ආර් දොලගේ (2018.07.07 සිට)

සෞඛ්‍ය විද්‍යා පීඨය: මහාචාර්ය.ජී.ආර්.රණවක

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය: ආචාර්ය.එන්.එස්.අබේසිංහ

ස්වභාවික විද්‍යා පීඨය: මහාචාර්ය.එල්.කේ.සේනාරත්න
මහාචාර්ය.ජේ.සී.එන්.රාජේන්ද්‍ර (2018.10.17 සිට)

**සනාතන සභාව විසින් පත් කළ සාමාජිකයන් වනුයේ,**

මහාචාර්ය.ජේ.සී.එන්.රාජේන්ද්‍ර
මහාචාර්ය.කේ.එස් වීරසේකර (2018.10.16 සිට)
මහාචාර්ය.එච්.ටී.ආර්.ජයසූරිය

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කළ සාමාජිකයා වනුයේ,**

එම්.එම්. ක්‍රිශාන්ති මෙය

**රාජ්‍ය තොරතුරු අමාත්‍යාංශය විසින් පත් කළ සාමාජිකයා වනුයේ,**

ඩී.පී.යූ වේලාරත්න මිය

**උපකුලපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව විසින් පත් කළ සාමාජිකයා වනුයේ,**

මහාචාර්ය.එස්.ජී.ජේ.එන්.සේනානායක

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයන් වනුයේ,**

මහාචාර්ය.එන්.ආර්.අර්තනායක (2018.03.31 දක්වා)
මහාචාර්ය.එස්.කරුණාරත්න (2018.03.31 දක්වා)
ආචාර්ය.ඩබ්ලිව්.එම්.කේ විජේතුංග
(2018.03.31 දක්වා)
විජිත යාපා මහතා (2018.03.31 දක්වා)

නිශාන් ප්‍රේමරත්න මහතා (2018.03.31 දක්වා)
මහාචාර්ය.ලලිතා මෙන්ඩිස්
මහාචාර්ය.රන්ජිත් නන්දලාල් පතිරණ
ආචාර්ය.අනුර ඒකනායක
අතාවුද ජයවර්ධන මහතා
මහාචාර්ය.ආනන්ද ජයකොඩි (2018.04.19 සිට)
මහාචාර්ය.ඔලිවර් අබේනායක (2018.04.19 සිට 2018.07.25 දක්වා)
මහාචාර්ය.ආර්.ෂෙරීෆ් (2018.04.19 සිට)
යසස් ද සිල්වා මහතා (2018.04.19 සිට)
එන්.සෙල්වකුමාරන් මහතා (2018.04.19 සිට)
බර්නාර්ඩ් වසන්ත මහතා (2018.04.19 සිට)

## විශ්වවිද්‍යාලයීය සනාතන සභාව:

**නිල බලයෙන් සාමාජික**

| | |
|---|---|
| උපකුලපති: | මහාචාර්ය.එස්.ඒ.අරියදුරෙයි |

**පීඨාධිපතිවරු**

| | |
|---|---|
| අධ්‍යාපන පීඨය: | මහාචාර්ය.එස්.පී.කරුණානායක |
| ඉංජිනේරු තාක්ෂණ පීඨය: | මහාචාර්ය.ඩී.ඒ.ආර් දොලගේ |
| සෞඛ්‍ය විද්‍යා පීඨය: | මහාචාර්ය.ජී.ආර්.රණවක |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය: | ආචාර්ය.එන්.එස්.අබේසිංහ |
| ස්වභාවික විද්‍යා පීඨය: | මහාචාර්ය.ජේ.සී.එන් රාජේන්ද්‍ර |

**අධ්‍යක්ෂවරු**

| | |
|---|---|
| වැඩබලන අධ්‍යක්ෂ/ අධ්‍යාපනික තාක්ෂණික සහ මාධ්‍ය මධ්‍යස්ථානය: | ආචාර්ය.ඩබ්ලිව්.වී.ජේ.පෙරේරා |
| වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා: | ආචාර්ය.කේ.එච්.ජයවර්ධන |
| අධ්‍යක්ෂ/ ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය: | ආචාර්ය.එච්.රඹුක්වැල්ල |

**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**

| | |
|---|---|
| ප්‍රධානී/ මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන: | ඩී.එම්.ඩබ්ලිව්.මුණසිංහ මෙය |
| ප්‍රධානී/ ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන: | ආචාර්ය.ඩබ්ලිව්.එම්.එස්.වනසිංහ |
| ප්‍රධානී/ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන: | ආචාර්ය.කේ.ඒ.සී.අල්විස් |

| | |
|---|---|
| ප්‍රධානී/ කෘෂිකාර්මික සහ වැව්ලි ඉංජිනේරු විද්‍යාව: | ආචාර්ය. එච්.කේ.එල්.කේ ගුණසේකර |
| ප්‍රධානී/පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.එම්.ඊ.ආර්පෙරේරා |
| ප්‍රධානී/ සිවිල් ඉංජිනේරු: | එම්.එන්.සී.සමරවික්‍රම මහතා |
| ප්‍රධානී/ විදුලි සහ පරිගණක ඉංජිනේරු: | ආචාර්ය.කේ.ජී.එච්.යූ.ඩබ්ලිව්. රත්නායක |
| ප්‍රධානී/ගණිත සහ ඉංජිනේරු විද්‍යාවේ දර්ශණය: | සී.පී.එස්.පතිරණ |
| ප්‍රධානී/යාන්ත්‍රික ඉංජිනේරු: | ආචාර්ය.ඩී.එච්.ආර්.ජේ.විමලසිරි |
| ප්‍රධානී/භාෂා අධ්‍යයන: | ආචාර්ය.කේ.ආර්.එම් ද සිල්වා |
| ප්‍රධානී/ සමාජ අධ්‍යයන: | ආචාර්ය.එස්.එන්.මොරායස් |
| ප්‍රධානී/නීති අධ්‍යයන: | ඩබ්ලිව්.ඩී.ආර්.ඩී.ගුණරත්න මහතා |
| ප්‍රධානී/කළමනාකරණ අධ්‍යයන: | වී.සිවලෝගතාසන් මහතා |
| ප්‍රධානී/ගණිත: | එම්.ඒ.පී ද සිල්වා මෙය |
| ප්‍රධානී/ පරිගණක විද්‍යා: | ඩබ්ලිව්.පී.සී.ඩී. ද සිල්වා මහතා |
| ප්‍රධානී/ භෞතික විද්‍යා: | ආචාර්ය.කාර්තිකෙයන් |
| ප්‍රධානී/ රසායන විද්‍යා: | ආචාර්ය.සෙන්තිල්නිති |
| ප්‍රධානී/ උද්භිද විද්‍යා: | ආචාර්ය.එච්.එල්.ඩී.වීරහේවා |
| ප්‍රධානී/ සත්ව විද්‍යා: | ආචාර්ය.එන්.එන්.පුංචිහේවා |
| ප්‍රධානී/ වෛද්‍ය පර්යේෂණාගාර විද්‍යා: | ආචාර්ය.කේ.ඒ.ශ්‍රියානි |
| ප්‍රධානී/ ඖෂධ විද්‍යා: | පී.ඩබ්ලිව්.ජී.ඩී.පී සමරසේකර මෙය |
| ප්‍රධානී/ හෙද විද්‍යා: | ආචාර්ය.ඩබ්ලිව්.එන් ප්‍රියන්ති |
| ප්‍රධානී/ මූලික විද්‍යා: | එම්.ආර්.එම් හනීෆා මහතා |
| ප්‍රධානී/ මනෝවිද්‍යා සහ උපදේශන: | ආචාර්ය.ජී.පී.ගමගේ |

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය**

| | |
|---|---|
| රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය: | මහාචාර්ය.ජී.එම්.කේ.බී ගුණහේරත් |
| රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය: | මහාචාර්ය කේ.එස්.ඩී.පෙරේරා |
| කෘෂි කාර්මික සහ වැව්ලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය: | මහාචාර්ය සී.එස් ද සිල්වා |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය: | මහාචාර්ය.කේ.එස්.වීරසේකර |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය: | මහාචාර්ය.ටී.එම් පල්ලෙවත්ත |

| | |
|---|---|
| සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය: | මහාචාර්ය.එච්.ටී.ආර් ජයසූරිය |

**මහාචාර්යවරුන්**

| | |
|---|---|
| උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය එල්.කේ සෙනරත් |
| ද්විතීය හා තෘතීය අධ්‍යාපනය පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.පී.සී.පී ජවුෆර් |
| නීති අධ්‍යයනය පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.සී.ඊ.ගුණරත්න |
| භූ විද්‍යාව පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.ජී.ඩබ්ලිව්.ඒ.ආර්. ප්‍රනාන්දු |
| භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.ජේ.සී.එන්.රජේන්ද්‍ර |
| රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.එස්.එස්.ඉක්බාල් |
| ද්විතීය හා තෘතීය අධ්‍යාපනය පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.ජී.ඩී.ලේකම්ගේ |
| භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.වී.පී.එස් පෙරේරා |
| පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.සී.එන් හේරත් |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.ටී.එම්.පල්ලෙවත්ත |
| උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.එස්.ආර්.වීරකෝන් |
| රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.සමන් සේනානායක |
| කළමනාකරණ අධ්‍යයන පිළිබඳ මහාචාර්ය: | මහාචාර්ය.එන්.අබේසේකර |

**පුස්තකාලයාධිපති**

| | |
|---|---|
| පුස්තකාලයාධිපති: | ආචාර්ය.ඩබ්ලිව්.සෙනෙවිරත්න |

**පීඨ නියෝජිතයින්**

| | |
|---|---|
| නියෝ/ අධ්‍යාපන පීඨය: | ආචාර්ය.එස්.කුගමූර්ති |
| නියෝ/ අධ්‍යාපන පීඨය: | සී.හේවාපතිරණ මෙය |
| නියෝ/ ඉංජිනේරු තාක්ෂණ පීඨය: | ටී.එම්.ඩී.එන්.ටී. මැදගෙදර මෙය |
| නියෝ/ ඉංජිනේරු තාක්ෂණ පීඨය: | එච්.පැස්කුවල් මෙය |
| නියෝ/ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය: | ආචාර්ය.බී.එම්.පී. මෙන්ඩිස් |
| නියෝ/ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය: | ආචාර්ය.එන්.අබේසේකර |
| නියෝ/ ස්වභාවික විද්‍යා පීඨය: | ආචාර්ය.එස්.කේ විජේසේකර |
| නියෝ/ ස්වභාවික විද්‍යා පීඨය: | ඩබ්ලිව්.සී.උඩුවෙල මෙය |
| නියෝ/ සෞඛ්‍ය විද්‍යා පීඨය: | ආචාර්ය.ඕ.කේ.ඩී.යූ.පී නිශ්ශංක |
| නියෝ/ සෞඛ්‍ය විද්‍යා පීඨය: | ආචාර්ය.ඩී.ටී විජේරත්න |

**ආරාධනා මත**

| | |
|---|---|
| අධ්‍යක්ෂ/ වෘත්තීය උපදේශන ඒකකය: | ඒ.එල්.කේ.ඒ. ඒකනායක මෙය |
| අධ්‍යක්ෂ/ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය: | ආචාර්ය.ඩී.ඩී.එම්. රණසිංහ |
| ප්‍රධානී/ පරිසර අධ්‍යනය සහ තිරසාර සංවර්ධනය සඳහා මධ්‍යස්ථානය: | ආචාර්ය.ටී.කේ.වීරසිංහ |

**ලේකම්**

| | |
|---|---|
| නියෝජ්‍ය ලේඛකාධිකාරී/ අධ්‍යයන පරිපාලන: | පී.කේ.සෙනෙවිරත්න මහතා |

**විශ්වවිද්‍යාලයීය නිලධාරීන්:**

| | |
|---|---|
| උපකුලපති | මහාචාර්ය.එස්.ඒ අරියදුරෙයි |
| නියෝජ්‍ය උපකුලපති | මහාචාර්ය.කේ.බී ගුණහේරත් |
| ලේඛකාධිකාරී | ඩබ්ලිව්.එල්.වී ජයසේන මහත්මිය |
| පීඨාධිපති/ ස්වභාවික විද්‍යා පීඨය | මහාචාර්ය.ජේ.සී.එන්.රාජේන්ද්‍ර |
| පීඨාධිපති/ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | ආචාර්ය.එන්.එස්.අබේසිංහ |
| පීඨාධිපති/ ඉංජිනේරු තාක්ෂණ පීඨය | මහාචාර්ය.ඩී.ඒ.ආර්.දොලගේ |
| පීඨාධිපති /අධ්‍යාපන පීඨය | මහාචාර්ය.එස්.පී කරුණානායක |
| පීඨාධිපති/සෞඛ්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය.ජී.ආර්.ආර් රණවක |
| පුස්තකාලයාධිපති | ආචාර්ය.ඩබ්ලිව් සෙනෙවිරත්න |
| මූල්‍යාධිකාරී | ඩබ්ලිව්.එම්.කේ.ජී.ඒ වික්‍රමසිංහ මහතා |
| වැඩබලන අධ්‍යක්ෂ / අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය | ආචාර්ය.ඩබ්ලිව්.වී.ජේ පෙරේරා |
| වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා | ආචාර්ය.කේ.එච් ජයවර්ධන |

# 2 කොටස - කාර්ය මණ්ඩලය

## 2.0. ආයතනික ව්‍යූහය

විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය (රූපසටහන 2) සම්ප්‍රදායික විශ්වවිද්‍යාලයක ආයතනික ව්‍යූහය හා බෙහෙවින් එක සමාන වන අතර විවෘත හා දූරස්ථ අධ්‍යාපනික විශ්වවිද්‍යාලවලට විශේෂිත වූ අමතර තනතුරු එනම් අධ්‍යක්ෂ තනතුරු යනාදියත්, ප්‍රාදේශීය අධ්‍යාපනික සේවාවන්, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය යනාදී සේවාවලින් පමණක් වෙනස්කමක් දක්වයි. කුලපති තනතුර ගෞරවාන්විත තනතුරක් වන අතර උපකුලපති වරයා ප්‍රධාන විධායක නිළධාරියා වේ. ලේඛකාධිකාරී ආයතනයෙහි පරිපාලනය, ආයතන සතු ලිපි ලේඛන හා වත්කම්වලට වගකිව යුතු වේ.අනිකුත් නිළධාරීන් වනුයේ පීඨාධිපතිවරුන්, අධ්‍යක්ෂ/ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා, පුස්තකාලයාධිපති හා මූල්‍යාධිකාරීවරයාය.

## Organizational Chart – The Open University of Sri Lanka




D/IQAU – Director/Internal Quality Assurance Unit
D/SDC - Director/Staff Development Centre
D/C-SAP - Director/Self-funded Academic Programes
Head/FAU – Foundation Academic Unit
SAD - Senior Assistant Director
AD – Assistant Director
D/CGU – Director/Career Guidance Unit
D/NODES - Director/National On-line Distance Education Service
D/CESS – Director/Centre for Environmental Studies and Sustainable Dev.
SAR – Senior Assistant Registrar
W.Es. - Works Engineers
CSO – Chief Security Officer
D/ILC – Director/Industry Liaison Centre
D/CERC - Consultancy and External Resources Centre
CSC – Chief Student Counsellor
SAB – Senior Assistant Bursar
AR – Assistant Registrar
AIA – Assistant Internal Auditor
D/IRU – Director/International Relations Unit
D/S.W. – Director/Student Welfare
SC - Student Counsellor
D/PR – Director/Public Relations
AB – Assistant Bursar
PS – Personal Secretary

Approved by the Senior Management Committee held on 12.06.2017

*රූපසටහන **1** - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය*

## 2.1 කාර්ය මණ්ඩල තොරතුරු

ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා සපුරාලීමට ආයතනයෙහි කාර්ය මණ්ඩලයට 2018 වර්ෂය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලය 337 ක් ද (ස්ථිර) පරිපාලන කාර්ය මණ්ඩලය 80 ක් ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලය 611 ක් ද, පරිපාලන නොවන හා අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය 189 ක් ද ඇතුලත් වූහ.

### 2.1.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය:

| තනතුර | අධ්‍යාපන | ඉංජිනේරු තාක්ෂණ | සෞඛ්‍ය විද්‍යා | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | ස්වභාවික විද්‍යා | ප්‍රාදේශීය අධ්‍යාපන සේවා | අධ්‍යාපනික තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | - | 04 | - | 01 | 03 | - | - |
| මහාචාර්ය | 03 | 03 | - | 02 | 08 | - | - |
| සහාය මහාචාර්ය | - | - | - | 01 | 02 | - | - |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | 03 | 27 | 02 | 17 | 21 | 01 | 01 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | 21 | 19 | 10 | 22 | 30 | 07 | 01 |
| කථිකාචාර්ය | - | 08 | 01 | 09 | 13 | 4 | |
| කථිකාචාර්ය (පරිවාස) | 09 | 23 | 17 | 20 | 10 | 02 | 02 |
| එකතුව | **36** | **84** | **30** | **72** | **87** | **14** | **04** |

*1 වගුව : අධ්‍යයන කාර්ය මණ්ඩලය*

### 2.1.2 අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය:

| තනතුර | අධ්‍යාපන | ඉංජිනේරු තාක්ෂණ | සෞඛ්‍ය විද්‍යා | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | ස්වභාවික විද්‍යා | තොරතුරු තාක්ෂණ | ප්‍රාදේශීය අධ්‍යාපන සේවා | අධ්‍යාපනික තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|
| ඉංජිනේරු අධ්‍යාපන සහකාර | - | 02 | - | - | - | - | 06 | - |
| අධ්‍යාපන සහකාර | - | 01 | - | 01 | 02 | - | 02 | - |
| තාවකාලික ප්‍රදර්ශක | 03 | 44 | 21 | - | 58 | - | 24 | 09 |
| පර්යේෂණ සහකාර | 02 | 05 | - | - | - | - | - | - |
| තො.තා කාර්ය මණ්ඩලය | - | - | - | - | 01 | 08 | - | - |
| එකතුව | **05** | **52** | **21** | **01** | **61** | **08** | **32** | **09** |

*2 වගුව: අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය*

### 2.1.3 පුස්තකාල කාර්ය මණ්ඩලය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| පුස්තකාලයාධිපති | 01 |
| නියෝජ්‍ය පුස්තකාලයාධිපති | 01 |
| ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | 06 |
| සහකාර පුස්තකාලයාධිපති | 02 |
| සහකාර ලේඛකාධිකාරී / පුස්තකාල | 01 |
| පුස්තකාල තොරතුරු සහකාර | 20 |

***3 වගුව: පුස්තකාල කාර්ය මණ්ඩලය***

### 2.1.4 පරිපාලන කාර්ය මණ්ඩලය:

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ලේඛකාධිකාරී | 01 |
| මූල්‍යාධිකාරී | 01 |
| නියෝජ්‍ය ලේඛකාධිකාරී | 01 |
| නියොජ්‍ය මූල්‍යාධිකාරී | 01 |
| ජ්‍යෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 07 |
| ජ්‍යෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 03 |
| ජ්‍යෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක | 01 |
| සහකාර ලේඛකාධිකාරී | 09 |
| සහකාර මූල්‍යාධිකාරී | 02 |
| සහකාර අභ්‍යන්තර විගණක | 01 |
| **එකතුව** | **27** |

***4 වගුව: පරිපාලන කාර්ය මණ්ඩලය***

## 2.1.5 වෙනත් විධායක කාර්ය මණ්ඩලය:

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන විධායක නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨ පුද්ගලික ලේකම් | 01 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 01 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 01 |
| ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු | 02 |
| පුහුණු ඉංජිනේරු | 01 |
| ප්‍රධාන තාක්ෂණ නිලධාරී | 02 |
| කාර්ය මණ්ඩල තාක්ෂණ නිලධාරී | 02 |
| ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ | 01 |
| සහකාර අධ්‍යක්ෂ | 22 |
| නිරූපක | 01 |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණ නිලධාරී (උසස් ශ්‍රේණිය) | 10 |
| වැඩ ඉංජිනේරු (සිවිල්) - II | 02 |
| පාලක | 01 |
| සහකාර මුද්‍රණාලයාධිපති | 01 |
| අධ්‍යක්ෂ/ තො.තා | 01 |
| තොරතුරු පද්ධති කළමනාකරු | 01 |
| තොරතුරු පද්ධති නියෝජ්‍ය කළමනාකරු | 01 |
| අධ්‍යක්ෂ/ මෙහෙයුම් | 01 |
| වැඩ ඉන්ජිනේරු | 01 |
| **එකතුව** | **53** |

*5 වගුව : වෙනත් විධායක කාර්ය මණ්ඩලය*

## 2.1.6 අනධ්‍යයන කාර්ය මණ්ඩලය:

| ගණය | සංඛ්‍යාව |
|---|---|
| ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි | 341 |
| පුහුණු ශ්‍රේණි | 140 |
| සුළු සේවකයින් | 130 |
| **එකතුව** | **611** |

*6 වගුව : අනධ්‍යයන කාර්ය මණ්ඩලය*

සුළු සේවකයින් - වැඩ සහායක, කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය සියළුම ස්ථිර කාර්ය මණ්ඩල තොරතුරු පරිශිෂ්ටවල දක්වා ඇත.

# 3 කොටස – ශිෂ්‍ය කාර්ය සාධනය

## 3.0. ශිෂ්‍ය කාර්ය සාධනය

## 3.1 බඳවා ගැනීම්

### 3.1.1 දේශීය ශිෂ්‍යයන්

StART@OUSL වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව ද ඇතුළත්ව 2018 වර්ෂයේ සම්පූර්ණ සිසුන් බඳවාගැනීමේ සංඛ්‍යාව **39940** ක් විය.

| බඳවාගැනීමේ අදියර | පීඨය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | ඉංජිනේරු තාක්ෂණ | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | අධ්‍යාපන | ස්වභාවික විද්‍යා | සෞඛ්‍ය විද්‍යා | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | |
| සහතික පත්‍ර | 144 | 3039 | 608 | 04 | - | - | **3795** |
| ඩිප්ලෝමා | 120 | 284 | 1138 | 86 | - | - | **1628** |
| උපාධි | 5208 | 11090 | 328 | 3841 | 3986 | - | **24453** |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 30 | - | 3959 | - | - | - | **3989** |
| ශාස්ත්‍රපති | 15 | 426 | 651 | 110 | - | - | **1202** |
| StART@OUSL* | - | - | - | | - | 3866 | **3866** |
| වෙනත් | 02 | - | - | 03 | - | 970 | **975** |
| දර්ශනශූරි/ දර්ශනපති | 08 | 06 | 05 | 12 | 01 | - | **32** |
| එකතුව | **5522** | **14845** | **6689** | **4056** | **3987** | **4836** | **39940** |

***7 වගුව : 2018 වසරේ ශිෂ්‍ය බඳවාගැනීම් - දේශීය***

### 3.1.2 විදේශීය ශිෂ්‍යයන්:

| පීඨය | වැඩසටහන | සංඛ්‍යාව |
|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| | තරුණ සංවර්ධන කටයුතු ඩිප්ලෝමා පාඨමාලාව | 01 |
| | සමාජ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධිය | 01 |
| | ආරම්භක දෙමළ පාඨමාලාව | 01 |
| | පොදුරාජ්‍ය මණ්ඩල විධායක ව්‍යාපාර පරිපාලනපති/ රාජ්‍ය පරිපාලන | 01 |
| අධ්‍යාපන | ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය (ජාත්‍යන්තර) | 01 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | Start@ OUSL | 02 |

***8 වගුව: 2018 වසරේ ශිෂ්‍ය බඳවාගැනීම් - විදේශීය***

## 3.2 සම්පූර්ණ කිරීම්

### 3.2.1 උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 30, 31 වන උපාධි ප්‍රදානෝත්සව 2018 ජූනි 12, 13 සහ නොවැම්බර් 14 යන දිනයන්හි සැසි 07කින් යුක්තව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී (BMICH) පැවැත්විණි. උපාධි ප්‍රදානෝත්සව දේශන පවත්වනු ලැබුවේ ආචාර්ය.ඒ.ටී.ආරියරත්න සහ මහාචාර්ය.ටෝර්ස්ටන් හෙන්රි ෆ්‍රැන්සන් සහ කුලපති විද්‍යාජෝති මහාචාර්ය කොල්වින් ගුණරත්න යන විද්වතුන් විසිනි. ආචාර්ය උපාධි, පශ්චාත් උපාධි හා ප්‍රථම උපාධි යන අදියර යටතේ 4,765 දෙනෙක් උපාධි වරම් ලැබූහ. ඔවුන් විශ්වවිද්‍යාලයේ සියළුම පීඨයන් නියෝජනය කරන ලදි.

| පීඨය | දර්ශනශූරි | දර්ශනවේදී | ශාස්ත්‍රපති/ විද්‍යාපති | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | උපාධි | එකතුව |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන | 01 | - | 65 | 2651 | 80 | **2797** |
| ඉංජිනේරු තාක්ෂණ | 02 | 01 | 03 | 06 | 229 | **241** |
| සෞඛ්‍ය විද්‍යා | - | - | - | - | 247 | **247** |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | 01 | - | 98 | 18 | 1025 | **1142** |
| ස්වභාවික විද්‍යා | - | 03 | 11 | 06 | 366 | **386** |
| ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය (PGIE) | - | - | 09 | 04 | - | **13** |
| **එකතුව** | **04** | **04** | **186** | **2685** | **1947** | **4826** |

*9 වගුව : පීඨ අනුව උපාධි ප්‍රදාන*

### 3.2.2 සහතික පත්‍ර ප්‍රදාන

ඩිප්ලෝමා සහ සහතික පත්‍ර ප්‍රදානෝත්සව 2018 සැප්තැම්බර් මස ප්‍රාදේශීය මධ්‍යස්ථාන 7 ක දී පවත්වා ශිෂ්‍යයන් 2910 දෙනෙකුට සහතික පත්‍ර හා ඩිප්ලෝමා පිරිනමන ලදි. 4 වගුවෙහි ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන අඩංගු වේ.

| පීඨය / ප්‍රදාන | උසස් ඩිප්ලෝමා | ඩිප්ලෝමා | උසස් සහතික පත්‍ර | සහතික පත්‍ර | එකතුව |
|---|---|---|---|---|---|
| අධ්‍යාපන | - | 270 | 79 | 295 | 644 |
| ඉංජිනේරු තාක්ෂණ | 242 | 24 | - | 43 | 309 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | - | 361 | 525 | 517 | 1403 |
| ස්වභාවික විද්‍යා | - | 22 | - | 02 | 24 |
| එකතුව | **242** | **677** | **604** | **907** | **2380** |

*10 වගුව : පීඨය අනුව සහතික පත්‍ර ප්‍රදාන*

## 3.3 ශිෂ්‍ය ප්‍රජාවගේ ජයග්‍රහණ

ශිෂ්‍ය සුභසාධන ඒකකය හරහා, විවිධ පසුබිම් වලින් පැමිණි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් ඔවුන්ගේ කුසලතා ප්‍රමුඛස්ථානයට රැගෙන යන ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට හා කණ්ඩායම් වශයෙන් එක්ව වැඩ කිරීමට උපකාර කිරීමට දිරිගන්වන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් වෙත විශ්වවිද්‍යාලය තුළ තම ක්‍රීඩා ක්‍රියාකාරකම් වෙනුවෙන් සහය වීම සඳහා භෞතික අධ්‍යාපන ඒකකයට පාලක සභාවේ අනුමැතිය ප්‍රදානය කර ඇත.

විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් භෞතික යටිතල ව්‍යුහය උසස් කිරීම සඳහා විශ්වවිද්‍යාලය සැලසුම් සකස් කර තිබේ.

**<u>2017 උපාධි ප්‍රදානෝත්සවයේදී දිනාගන්නා ලද රන් පදක්කම් හා වෙනත් සම්මාන</u>**

**රන් පදක්කම්**

2016 අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා හොඳම කාර්ය සාධනය සඳහා ජේ.ඊ ජයසූරිය රන් පදක්කම

සම්මාන ප්‍රදානය : ඩී.ජයසූරිය මිය

සම්මානලාභියා : අයේෂා ශානිකා රඹුක්වැල්ල

2017 හෙද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධි විශිෂ්ටත්වය සඳහා අතබස්කා රන් පදක්කම

සම්මාන ප්‍රදානය : සභාපති, අතබස්කා විශ්ව විද්‍යාලය, කැනඩාව

සම්මානලාභියා : කේ.එම්.ආර් ප්‍රියදර්ශනී ධර්මරත්න මෙනවිය

2016 ක්‍රිෂාන්ති විජේතුංග ද සිල්වා අනුස්මරණ රන් පදක්කම

සම්මාන ප්‍රදානය : අයිවර් විජේතුංග

සම්මානලාභියා : එම්.එම්.ජී චතුර්ද මාන්නප්පෙරුම මෙනවිය

2017 ජන සන්නිවේදනය පිළිබඳ සමාජ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන අනුර ගුණසේන රන් පදක්කම

සම්මාන ප්‍රදානය : ජේ.ගුණසේකර මිය

සම්මානලාභියා : රඹුක්කන ලියනගේ සුවනි මිහිසර

2017 ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජ විද්‍යා ශාස්ත්‍රවේදී විශිෂ්ටත්වය සඳහා එච්.ඒ.ද එස් ගුණසේකර රන් පදක්කම

සම්මාන ප්‍රදානය : මහාචාර්ය එස්.එස් කොළඹගේ

සම්මානලාභියා : හපුආරච්චිගේ භාග්‍යා චංචලා පෙරේරා මෙනවිය

2017 කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ හොඳම කාර්ය සාධනය සඳහා වන රන් පදක්කම

සම්මාන ප්‍රදානය : කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව

සම්මානලාභියා : කේ.එම්.ඩබ්ලිව් චතුරි මදූශානි අබේරත්න

2017 වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී හොඳම ශිෂ්‍යයා සඳහා වන නන්දනී ද සිල්වා රන් පදක්කම

සම්මාන ප්‍රදානය : සෞඛ්‍ය විද්‍යා පීඨ තිළිණ අරමුදල

සම්මානලාභියා : කේ. කේ.යූ හර්ෂන නාත් අබේරත්න මහතා

2017 ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) හොඳම ශිෂ්‍යයා සඳහා වන ඕ.පී. කුල්ශ්‍රේෂ්ත රන් පදක්කම

සම්මාන ප්‍රදානය : ආචාර්ය.ඕ.පී කුල්ශ්‍රේෂ්ත

සම්මානලාභියා : තංගවේල් අභිනාශ් මහතා

ව්‍යාපෘතිය මත පදනම් වූ හොඳම තාක්ෂණික පත්‍රය සඳහා වන ඉංජිනේරු පර්යේෂණ ඒකක රන් පදක්කම

සම්මාන ප්‍රදානය : ඉංජිනේරු පර්යේෂණ ඒකකය

සම්මානලාභියා : රුබසින් කට්ටඩිගේ නාලක ප්‍රදීප් කුමාර

2017 ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධි හොඳම ව්‍යාපෘතිය සඳහා වන තුරෛරාජා රන් පදක්කම

සම්මාන ප්‍රදානය : ඉංජිනේරු පර්යේෂණ ඒකකය

සම්මානලාභියා : රුබසින් කට්ටඩිගේ නාලක ප්‍රදීප් කුමාර

2017 මෙකාට්‍රොනික්ස් ඉංජිනේරුවේදය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයන් සඳහා වන එස්.එම්. අබේගුණසේකර ද සිල්වා රන් පදක්කම.

සම්මාන ප්‍රදානය : මහාචාර්ය.ක්ලැරන්ස් ඩබ්ලිව්. ද සිල්වා

සම්මානලාභියා : තංගවේල් අභිනාශ් මහතා

2017 සිවිල් ඉංජිනේරුවේදය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන රන් පදක්කම

සම්මාන ප්‍රදානය : මහාචාර්ය. කෝලිත වීරසේකර

සම්මානලාභියා : ටී.ඒ.යූ සංජීවනී සඳරප්පෙරුම

2017 කෘෂිකර්මය පිළිබඳ කර්මාන්ත අධ්‍යයනවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන ලියනගුරුගේ අසී.ඇනෙට් ද සිල්වා රන් පදක්කම

සම්මාන ප්‍රදානය : ආචාර්ය රොෂාන් ද සිල්වා

සම්මානලාභියා : කේ.ජී.ඒ ඉරේෂා රසංජලී

2017 මෘදුකාංග ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන වර්චුසා අධ්‍යයන විශිෂ්ටතා රන් පදක්කම

සම්මාන ප්‍රදානය : සීමාසහිත වර්චුසා පුද්ගලික සමාගම

සම්මානලාභියා : පාතගම කුරුප්පුගේ තරිඳු

2018 සමාජ විද්‍යාව පිළිබඳ සමාජ විද්‍යාවේදී විශිෂ්ටත්වය සඳහා වන ගණනාත් ඔබේසේකර රන් පදක්කම

සම්මාන ප්‍රදානය : සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

සම්මානලාභියා : ඩී.එම්. ලක්ෂ්මි ධනපාල මෙවිය

2018 සමාජ විද්‍යා හොඳම ශිෂ්‍යයා සඳහා වන ගාමිණී කොරයා රන් පදක්කම

සම්මාන ප්‍රදානය : සීමාසහිත වර්චුසා පුද්ගලික සමාගම

සම්මානලාභියා : ඩී.එම්. ලක්ෂ්මි ධනපාල මිය

## <u>තිළිණ</u>

2017 හෙද විද්‍යා විශිෂ්ටත්වය සඳහා රොබර්ටා එල් කැරේ ප්‍රධානය

සම්මාන ප්‍රදානය : මහාචාර්ය රොබර්ටා එල් කැරේ

සම්මානලාභියා : කන්නිමි මුදියන්සේලාගේ රසිකා ප්‍රියදර්ශි ධර්මරත්න

2017 හෙද විද්‍යා පිළිබඳ චන්ද්‍රා ද සිල්වා අනුස්මරණ ප්‍රධානය

සම්මාන ප්‍රදානය : පී.එල්.එන් ද සිල්වා මහතා

සම්මානලාභියා : කන්නිමි මුදියන්සේලාගේ රසිකා ප්‍රියදර්ශි ධර්මරත්න

2016 නීති විද්‍යාව සඳහා වන ඇතුලත්මුදලි ප්‍රධානය

සම්මාන ප්‍රදානය : ලලිත් ඇතුලත්මුදලි

සම්මානලාභියා : දිමුන්ගුවාරිගේ සුභාෂ් මදුරංග ප්‍රනාන්දු මහතා

සූරිය ආරච්චිගේ භාග්‍යා කෞශල්‍යා ප්‍රේමරත්න මෙනවිය

2016 ඉඩම් නීතිය සඳහා වන ප්ලැසිඩස් විජේසේකර අනුස්මරණ ප්‍රධානය

සම්මාන ප්‍රදානය : මහාචාර්ය ඩී.එස්.විජේසේකර

සම්මානලාභියා : මාන්නප්පෙරුම මුදියන්සේලාගේ ගයානි චතුර්දා මාන්නප්පෙරුම මෙනවිය

## බාහිර ආයතන වෙතින් දිනාගන්නා ලද සම්මාන

1. විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ හොඳම උපාධි අපේක්ෂක ව්‍යාපෘතිය සඳහා 2017/2018 ඉංජිනේරු ඊ.ඩබ්ලිව් කරුණාරත්න ප්‍රධානය

   සම්මානලාභීන් : එම්. පී.ඩී.එස් මදුරංග මහතා
   පී.ජී.පී.එස්.අයි පනංගල මෙවිය
   ඒ.ජී.එම් ලොකුලියනගේ
   ආර්.කේ.එන්.පී කුමාර මහතා

2. 2017/2018 විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන් වෙනුවෙන් කාර්මික පුහුණුව සඳහා මිගාර රණතුංග ප්‍රධානය

   සම්මානලාභීන් : ජී.එල්.ඊ පෙරේරා මෙවිය
   කේ.ඒ.ඩී.ජී.පී දිල්රුක්ෂි මෙවිය

3. ''Pro Food Pro Pack & Agbiz 2018'' ප්‍රදර්ශනය
   - "ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කරන හොඳම නවෝත්පාදනය" ජයග්‍රාහකයා
   - හොඳම නවෝත්පාදන නිෂ්පාදනය ආයතන කාණ්ඩය
   - "ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කරන හොඳම නවෝත්පාදනය" – දෙවන ස්ථානය
   - වාණිජමය ජීව්‍ය ක්‍රියාවලිය

   සම්මානලාභීන් : කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තු ශිෂ්‍යයන් කණ්ඩායමක් වශයෙන් මෙම ප්‍රදර්ශන භාණ්ඩ ඉදිරිපත් කරන ලදි.

## වෙනත්

1. ශ්‍රී ලංකා පේෂකර්ම ආයතනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීයේ කර්මාන්ත අධ්‍යයනවේදී (ඇඟළුම් තාක්ෂණය හා කළමනාකරණය) හොඳම ශිෂ්‍යයා

   එච්.එම්.අයි.යූ.කේ නවරත්න මෙවිය වෙත ප්‍රධානය කරන ලදි

2. අනුර ද සිල්වා රන් පදක්කම - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ඇඟළුම් තාක්ෂණ හා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා හොඳම ශිෂ්‍යයා සඳහා පිරිනමන ලදි.

   එච්.එම්.ඩබ්ලිව්.හේරත් මෙවිය වෙත ප්‍රධානය කරන ලදි

# 4 කොටස - පීඨ වාර්තා

# 4.0. පීඨ වාර්තා

## 4.1 අධ්‍යාපන පීඨය

### 4.1.1 විශ්ලේෂණය




ශ්‍රී ලංකාව තුළ සහ කලාපය තුළ විවෘත සහ දුරස්ථ ඉගෙනුම තුළින් මූලික මානව උත්සාහයක් වශයෙන් අධ්‍යාපනයේ දැනුම සහ වෘත්තීය ව්‍යවහාරයන් වැඩිදියුණු කිරීමේ නායකයා ලෙස කටයුතු කිරීම යන තම තේමාව අනුව යමින් අධ්‍යාපන පීඨය සහතිකපත්‍ර මට්ටමේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා පුළුල් පරාසයක වැඩසටහන් ලබා දෙයි. ශ්‍රී ලංකාව තුළ දුරස්ථ ආකාරයට පෙරපාසල්, ප්‍රාථමික සහ ද්විතීයික සහ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සම්බන්ධ ගුරුවරුන්ට මූලික සහ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන් ලබා දෙන විශාලම ප්‍රතිපාදකයන් අතරින් එකක් ලෙස දැක්විය හැකිය. මෙම විද්‍යා පීඨය තුළින් ලබා දෙන වැඩසටහන් සඳහා ශිෂ්‍යන්ගේ ලියාපදිංචිය එක් අධ්‍යයන වර්ෂයක් සඳහා 7000කට වැඩි වන අතර සමත් වන ප්‍රතිශතය 80% කට ඉහළ අගයකි.

අධ්‍යාපන පීඨය තුළ පර්යේෂණ යනු අවශ්‍යම උපාංගයක් වන අතර කාර්ය මණ්ඩලය පර්යේෂණ ව්‍යාපෘති ගණනාවක සක්‍රීය ලෙස දායක වී සිටිති.

1. ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපන පිළිබඳ දෙපාර්තමේන්තුව.
2. මුල් ළමා විය සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

**ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපන පිළිබඳ දෙපාර්තමේන්තුව** විසින් අධ්‍යාපන පද්ධතියේ සිටින උපාධිධාරී නොවන විද්‍යා ගුරුවරුන් වෙනුවෙන් වැඩිදුර අධ්‍යාපනය සඳහා අවස්ථා සැපයීමේ අරමුණින් සහ සාම්ප්‍රදායික විශ්ව විද්‍යාල වලට ඇතුලත් වීමට සුදුසුකම් ලැබුවද ඇතුලත් වීමට අවස්තාව නොලැබුවන්ට උසස් අධ්‍යාපන අවස්ථා සැලසීම මෙන්ම ගුරු වෘත්තියට පිවිසීමට කැමැත්තෙන් සිටින විද්‍යා උපාධිධාරින්ට වෘත්තීය සුදුසුකම් සැපයීමට දැනට අධ්‍යයන වැඩසටහන් 10 ක් ඉදිරිපත් කරනු ලබයි.

**මුල් ළමා විය සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව** විසින් ද දැනට වැඩසටහන් 3 ක් පවත්වන අතර ප්‍රාථමික අධ්‍යාපනය පිලිබඳ අධ්‍යාපන ගෞරව උපාධි නව වැඩසටහනක් සිදුවෙමින් පවතී. අධ්‍යයන වැඩසටහන් පැවැත්වීමට අමතරව, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලීය ප්‍රාදේශීය මධ්‍යස්ථාන, කොළඹ, නුවර සහ මාතර සහ ළමා අධ්‍යාපන මධ්‍යස්ථානයට අනුබද්ධිත ආදර්ශ පෙර පාසල් 3හි කටයුතු සම්බන්ධීකරණය කිරීම  මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

**විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව** විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ සහ ශ්‍රී ලංකාවේ විශේෂ තත්වයන් යටතේ දක්වා ඇති අය ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ සමස්ත අරමුණ ඇතුව පිහිටුවන ලද අතර කෙටි කාලීන පාඨමාල ඇතුළුව විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රයේ  දැනට පාඨමාල 6 ක් පිරිනමනු ලබයි. එසේම විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පිළිබඳ ශාස්ත්‍රපති උපාධි නව වැඩසටහනක ද නියැළී සිටියි.

## 4.1.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

| විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන | අදියර | මාධ්‍ය | නව බඳවාගැනීම් | සම්පූර්ණ කරන ලද |
| ඉගෙනීමේ ආබාධ සහිත ළමයින්ට ඉගැන්වීම පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 52 | 52 |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව MI College - මාලදිවයින | සහතික පත්‍ර | ඉංග්‍රීසි | - | 10 |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධිය B.Ed (SNE) | උපාධි | සිංහල, ඉංග්‍රීසි | 80 | 61 |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGDSNE) | පශ්චාත් උපාධි | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 42 | 59 |
| පූර්ව ළමා විය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | | |
| පෙරපාසල් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල, ඉංග්‍රීසි | 404 | 295 |
| විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත පෙර පාසල් ළමයින්ට සහය දැක්වීම පිළිබඳ වැඩමුළුව | සහතික පත්‍ර | සිංහල | 25 | 25 |
| කථන හා භාෂා අපහසුතා සහිත ළමයින්ට සහය දැක්වීම පිළිබඳ වැඩමුළුව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 33 | 33 |
| ඔටිසම් පිළිබඳ වැඩමුළුව - සිංහල | සහතික පත්‍ර | සිංහල | 65 | 65 |
| පෙරපාසල් අධ්‍යාපන උසස් සහතිකපත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල, ඉංග්‍රීසි | 49 | 79 |
| පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව | ඩිප්ලෝමා | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 311 | 270 |
| ද්විතීය හා තෘතීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | | |
| පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල,ඉංග්‍රීසි | 50 | 50 |
| බහුශ්‍රේණි ඉගැන්වීම් වැඩසටහන් පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව | සහතික පත්‍ර | දෙමළ | 20 | 20 |
| ස්වාභාවික විද්‍යා අධ්‍යාපනවේදී උපාධිය | උපාධි | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 02 | 02 |
| නාට්‍ය හා රංගකලාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | උපාධි | සිංහල | 33 | 17 |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පශ්චාත් උපාධි | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 3043 | 2592 |
| අධ්‍යාපන දර්ශනපති උපාධිය | පශ්චාත් උපාධි | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 317 | - |
| ගුරු අධ්‍යාපනවේදී දර්ශනපති කලා උපාධිය (අන්තර්ජාතික) | පශ්චාත් උපාධි | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 37 | 49 |
| ගුරු අධ්‍යාපනවේදී දර්ශනපති කලා උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | - | 04 |
| අධ්‍යාපනපති උපාධිය | පශ්චාත් උපාධි | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | - | 12 |
| දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | - | 01 |

*11 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම - අධ්‍යාපන පීඨය*

## 4.1.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

| වැඩසටහන | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDSNE) | 75 | 41 | 23 |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධිය B.Ed (SNE) | 210 | | |
| පෙරපාසල් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාව | 536 | | |
| පෙරපාසල් අධ්‍යාපන උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 72 | | |
| පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව | 1138 | | |
| පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව | 50 | | |
| බහුශ්‍රේණි ඉගැන්වීම් පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව | 20 | | |
| ස්වාභාවික විද්‍යා අධ්‍යාපනවේදී උපාධිය | 30 | | |
| නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය | 88 | | |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | 321 | | |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 3884 | | |
| අධ්‍යාපන දර්ශනපති උපාධිය | 278 | | |
| ගුරු අධ්‍යාපනවේදී දර්ශනපති කලා උපාධිය (අන්තර්ජාතික) | 54 | | |
| අධ්‍යාපනපති උපාධිය | 317 | | |
| ගුරු අධ්‍යාපනවේදී දර්ශනපති කලා උපාධිය | 02 | | |

*12 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය - අධ්‍යාපන පීඨය*

## 4.1.4 නව පාඨමාලා / වැඩසටහන්

| පාඨමාලාව / වැඩසටහන | මාධ්‍ය | අදියර |
|---|---|---|
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය | ඉංග්‍රීසි | ශාස්ත්‍රපති |
| අධ්‍යාපනපති කලා උපාධිය | ඉංග්‍රීසි | ශාස්ත්‍රපති |

*13 වගුව : නව පාඨමාලා/ වැඩසටහන් - අධ්‍යාපන පීඨය*

## 4.1.5 මාර්ගගත පාඨමාලා

| පාඨමාලා කේතය සහ නම | අදියර | මාධ්‍ය |
|---|---|---|
| **විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | | |
| SNP8336 අධ්‍යාපනය තුළ නැගී එන ප්‍රවණතා | පශ්චාත් උපාධි | සිංහල, දෙමළ, ඉංග්‍රීසි |
| SNU5239 අධ්‍යාපනය තුළ නැගී එන ප්‍රවණතා | උපාධි | සිංහල, දෙමළ, ඉංග්‍රීසි |
| SNE 5247 ඇතුළත් වූ පංති කාමරය තුළ දරුවන්ගේ ගැටළු විසඳීම | උපාධි | සිංහල, දෙමළ, ඉංග්‍රීසි |
| **ද්විතීය හා තෘතීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | | |
| STP9540 ගුරු අධ්‍යාපනඥයා ඉගැන්වීම් ඉගෙනුම් විශේෂඥයෙකු ලෙස | ශාස්ත්‍රපති | ඉංග්‍රීසි |
| ESP2242 ගුරු අධ්‍යාපනඥයා අධ්‍යාපන තාක්ෂණවේදියෙකු ලෙස | ශාස්ත්‍රපති | ඉංග්‍රීසි |
| ESP2245 ගුරු අධ්‍යාපනඥයා පර්යේෂකයෙකු ලෙස | ශාස්ත්‍රපති | ඉංග්‍රීසි |
| STP9646 Learning Portfolio | ශාස්ත්‍රපති | ඉංග්‍රීසි |

***14 වගුව : මාර්ගගත පාඨමාලා - අධ්‍යාපන පීඨය***

## 4.2 ඉංජිනේරු තාක්ෂණ පීඨය

### 4.2.1 විශ්ලේෂණය



ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය තුළ ජීවිත කාලීන ඉගෙනුම් අවස්ථා ලබා දීම තුළින් විවෘත සහ දුරස්ථ ඉගෙනුම හරහා කාර්මික සහ තාක්ෂණ අවශ්‍යතා සපුරාගැනීම සහ ඵලදායී සහ තිරසාර සම්පත් භාවිතය තුළින් පර්යේෂණ සහ ශිෂ්‍යත්ව වලට සහාය දීම තුළින් විශිෂ්ටත්වය කරා ළඟා වීමයි.

පීඨය විසින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි, තාක්ෂණ විද්‍යාවේදී උපාධි, විද්‍යාවේදී දර්ශනපති සහ දර්ශනපති ආචාර්ය උපාධිය සිට පුළුල් පරාසයකින් යුත් වැඩසටහන් ඉදිරිපත් කරයි.

## 4.2.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

| වැඩසටහන | අදියර | මාධ්‍යය | නව බඳවාගැනීම් | සම්පූර්ණ කළ |
|---|---|---|---|---|
| කර්මාන්ත අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි, සිංහල | 108 | 43 |
| කාර්යාල යෙදවුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 56 | 56 |
| ඉංජිනේරු ඇඳීම් සඳහා AutoCAD ඵලදායී භාවිතය පිළිබඳ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 205 | 196 |
| 3D නිරූපකරණය සහ අතථ්‍ය තාත්වික ඉදිරිපත්කිරීම් ගොඩනැගීම සඳහා කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | - | - |
| ගතික වෙබ් නිර්මාණ පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 20 | 17 |
| ග්‍රැෆික් නිර්මාණ පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 61 | 61 |
| Application of Office පැකේජ හා පරිගණක දත්ත ගබඩා කළමනාකරණය සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 63 | 39 |
| පරිගණක දත්ත ගබඩා සහ ජාල නිර්මාණ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 16 | 16 |
| පරිගණකගත ගිණුම්කරණ පැකේජ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 30 | 30 |
| පරිගණක දත්ත ගබඩා සහ ජාල නිර්මාණ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 16 | 16 |
| ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 10 | 10 |
| තාක්ෂණවේදී උසස් ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | ඉංග්‍රීසි | - | 159 |
| මෘදුකාංග ඉංජිනේරු උසස් ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | ඉංග්‍රීසි | - | 20 |
| කර්මාන්ත අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | ඉංග්‍රීසි | - | 63 |
| තොරතුරු පද්ධති හා තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 56 | 24 |
| කර්මාන්ත අධ්‍යයන උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 406 | 63 |
| තාක්ෂණවේදී උපාධිය (ඉංජිනේරු) | උපාධි | ඉංග්‍රීසි | 972 | 154 |
| මෘදුකාංග ඉංජිනේරු උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 52 | 12 |
| තාක්ෂණවේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | - | 06 |
| තාක්ෂණ විද්‍යාපති උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | - | 03 |
| දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | 02 | 02 |

***15 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම – ඉංජිනේරු තාක්ෂණ පීඨය***

## 4.2.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

| වැඩසටහන | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| කර්මාන්ත අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලාව | 144 | 87 | 81 |
| තොරතුරු පද්ධති හා තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව | 120 | | |
| කර්මාන්ත අධ්‍යයන උපාධිය | 1177 | | |
| තාක්ෂණවේදී උපාධිය | 3898 | | |
| මෘදුකාංග ඉංජිනේරු උපාධිය | 133 | | |
| ඉදිකිරීම් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 30 | | |
| තාක්ෂණ විද්‍යාපති උපාධිය | 15 | | |

*16 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය - ඉංජිනේරු තාක්ෂණ*

## 4.2.4 නව පාඨමාලා/ වැඩසටහන්

| පාඨමාලාව/ වැඩසටහන | මාධ්‍ය | අදියර |
|---|---|---|
| MHZ3551 ඉංජිනේරු ගණිතය I වැඩසටහන – තාක්ෂණවේදී උපාධිය | ඉංග්‍රීසි | උපාධි |
| MHZ3552 ඉංජිනේරු ගණිතය II වැඩසටහන – තාක්ෂණවේදී උපාධිය | ඉංග්‍රීසි | උපාධි |
| MHZ4553 ඉංජිනේරු ගණිතය III වැඩසටහන – තාක්ෂණවේදී උපාධිය | ඉංග්‍රීසි | උපාධි |
| MHZ4256 පරිගණක සඳහා ගණිතය වැඩසටහන - මෘදුකාංග ඉංජිනේරු උපාධිය | ඉංග්‍රීසි | උපාධි |
| MHZ4367 ව්‍යවහාරික සංඛ්‍යාන වැඩසටහන - කාර්මික අධ්‍යයන උපාධිය | ඉංග්‍රීසි | උපාධි |
| MHZ3458- කෘෂිකර්මය සඳහා ගණිතය වැඩසටහන කාර්මික අධ්‍යයන උපාධිය | ඉංග්‍රීසි | උපාධි |
| MHJ4241 තාක්ෂණවේදයේ ඉතිහාසය වැඩසටහන – BTech & BIS | ඉංග්‍රීසි | උපාධි |
| TAI6549 - විලාසිතා දැක්ම නිෂ්පාදන වැඩසටහන - විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | ඉංග්‍රීසි | උපාධි |

*17 වගුව : නව පාඨමාලා/ වැඩසටහන් - ඉංජිනේරු තාක්ෂණ පීඨය*

## 4.2.5 මාර්ගගත පාඨමාලා

| පාඨමාලා කේතය සහ නම | අදියර | මාධ්‍යය |
|---|---|---|
| **සිවිල් ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව** | | |
| ඉංජිනේරු භූවිද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| **රෙදිපිළි සහ ඇඟළුම් තාක්ෂණය දෙපාර්තමේන්තුව** | | |
| TAI3342 විලාසිතා සංකල්පය | උපාධි | ඉංග්‍රීසි |
| TAI3540 මෝස්තර නිර්මාණය | උපාධි | ඉංග්‍රීසි |
| TAI3543 විලාසිතා නිර්මාණ සංකල්පය | උපාධි | ඉංග්‍රීසි |
| TAI4545 විලාසිතා නිර්මාණ ක්‍රියාවලිය | උපාධි | ඉංග්‍රීසි |
| TAI5346 කාර්මික ඇඟළුම් සේදීම හා නිමාව | උපාධි | ඉංග්‍රීසි |
| TAI5538 උසස් මෝස්තර නිර්මාණය | උපාධි | ඉංග්‍රීසි |
| TAM5540 රෙදිපිළි අලෙවිකිරීම | උපාධි | ඉංග්‍රීසි |
| TAM6540 විලාසිතා අලෙවිකරණය | උපාධි | ඉංග්‍රීසි |
| TAX4538 ඇඟළුම් නිෂ්පාදනය | උපාධි | ඉංග්‍රීසි |
| TAX4560 වියනලද රෙදිපිළි තාක්ෂණවේදය | උපාධි | ඉංග්‍රීසි |
| TAX6533 තාක්ෂණික රෙදිපිළි | උපාධි | ඉංග්‍රීසි |
| TAX6539 වැඩ අධ්‍යයනය | උපාධි | ඉංග්‍රීසි |
| TAX6560 උසස් වියන ලද රෙදිපිළි තාක්ෂණය | උපාධි | ඉංග්‍රීසි |

***18** **වගුව : මාර්ගගත පාඨමාලා - ඉංජිනේරු තාක්ෂණ පීඨය***

## 4.3 සෞඛ්‍ය විද්‍යා පීඨය

### 4.3.1 විශ්ලේෂණය




සෞඛ්‍ය විද්‍යා පීඨය යනු සෞඛ්‍ය විද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩි දියුණු කිරීමත් සමඟ 2015 ජූලි ආරම්භ කරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට අයත් පස්වැනි පීඨයයි. එය වර්තමානයේ හෙද, වෛද්‍ය රසායනාගාර විද්‍යාව, ඖෂධවේද, මූලික විද්‍යා, මනෝවිද්‍යා සහ උපදේශනය යන දෙපාර්තමේන්තු වලින් සමන්විත වේ.

**2018 වර්ෂය තුළ පීඨයේ ප්‍රධාන නිලධාරීන්:** පීඨාධිපති: මහාචාර්ය ජී.ආර්.රණවක; ප්‍රධානී/ මූලික විද්‍යා: මහාචාර්ය ආර්.යූ තන්ත්‍රිගොඩ (2018 පෙබරවාරි දක්වා) සහ එම්.ආර්.එම් හනීෆා මහතා (2018 මාර්තු සිට); ප්‍රධානී/වෛද්‍ය රසායනාගාර විද්‍යා: බී.බී.එස් ද සිල්වා මහතා (2018 ජූලි දක්වා) සහ ආචාර්ය.කේ.ඒ.ශ්‍රියානි (2018 අගෝස්තු සිට); ප්‍රධානී/ හෙද: ඒ.වී.පී මාධවී මෙය (2018 ජූලි දක්වා) සහ ආචාර්ය.ඩබ්ලිව්.එන්.ප්‍රියන්ති (2018 අගෝස්තු සිට); ප්‍රධානී/ ඖෂධවේද: පී.ඩබ්ලිව්.ජී.ඩී.පී සමරසේකර මෙය; ප්‍රධානී/ මනෝවිද්‍යාව සහ උපදේශන: ආචාර්ය.ජී.පී ගමගේ සහ සහකාර ලේඛකාධිකාරී: එස්.ඒ.ඩී.ඩී.එන් සමරසිංහ මිය.

**කාර්ය මණ්ඩලය:** අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය මුළු සංඛ්‍යාව 76ක් (ස්ථිර හා තාවකාලික යන දෙකම) සහ බාහිර කාර්ය මණ්ඩලය ආසන්න වශයෙන් 90 ක් 2018 වර්ෂය තුළ පීඨයේ සේවය කරන ලදි. නව අධ්‍යයන කාර්ය මණ්ඩලය 18ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවාගැනීම් 07 ක් සමඟ 2017 දී 19ක් වූ ස්ථිර කාර්ය මණ්ඩලය 2018 දී 45 දක්වා විශාල වශයෙන් වැඩි විය. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 13 දෙනෙක් දැනට පශ්චාත් උපාධි සුදුසුකම් (7 PhD, 3 MPhil, 3 MSc) සඳහා දේශීය හා විදේශීය ආයතන වල අධ්‍යයනය කරමින් සිටින අතර බාහිර මූලාශ්‍ර වලින් (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්ව විද්‍යාලය/ ඕස්ට්‍රේලියාව, නව මෙක්සිකෝ විශ්ව විද්‍යාලය/ ඇමරිකා එක්සත් ජනපදය, ඔක්ලන්ඩ් තාක්ෂණ විශ්ව විද්‍යාලය/ නවසීලන්තය) මෙන්ම ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය වෙතින් ද අරමුදල් සහ/හෝ උපකාරක පන්ති මුදල් ලැබීමට වාසනාවන්ත වී ඇත. මෙම වර්ෂය අතරතුර, පීඨ සාමාජිකයින් විසින් පර්යේෂණ ලිපි 14 ක් සමාලෝචනය කළ සඟරා වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති අතර ඉන් 6 ක් සූචිගත සඟරා වේ. තම පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා ඔවුන් දේශීය හා විදේශීය යන දෙකෙහිම සම්මන්ත්‍රණ වලට ද සහභාගි වූ අතර නිබන්ධන/ විස්තෘත නිබන්ධන/ පෝස්ටර් 48ක් සම්මන්ත්‍රණ ක්‍රියාවලියේදී ප්‍රකාශයට පත් කරන ලදි. 2018 ආබාධිතභාවය සහ සංවර්ධනය, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු ඇතුළුව ආබාධිත තත්ත්වයන් ජය ගැනීම පිළිබඳ අන්තර්ජාතික සමුළුවේදී මනෝවිද්‍යාව සහ උපදේශනය පිළිබඳ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය. එච්.එම්.සී.ජේ.හේරත් විසින් "ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ පුනරුත්ථාපන සේවා සංවර්ධනය" යන මාතෘකාව පිළිබඳ ප්‍රධාන දේශනය චීනයේ බීජිං වල දී පවත්වන ලදි. හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා වන සම්මාන ද්විත්වය ආචාර්ය.කේ.ඒ.ශ්‍රියානි විසින් සම්මන්ත්‍රණ වලදී දිනා ගන්නා ලදි. එනම්, එක් සම්මානයක් බහුවිධ

පර්යේෂණ පිළිබඳ දකුණු ආසියානු සම්මන්ත්‍රණයේදී සෞඛ්‍ය හා වෛද්‍ය විද්‍යා තේමාව යටතේ සහ අනෙක් සම්මානය ශ්‍රී ලංකා උපාධිධාරී හෙද පදනමේ ද්විවාර්ෂික සැසියේදී වශයෙනි.

**අධ්‍යයන වැඩසටහන්:** පෙර වර්ෂයේ සේම, හෙදකම පිළිබඳ විද්‍යාවේදී උපාධිය, වෛද්‍ය පර්යේෂණාගර විද්‍යාවේදී උපාධිය, ඖෂධවේදී උපාධිය සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් අඛණ්ඩව පිරිනමනු ලබන අතර අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා සුදුසුකම් සහිත සහ ප්‍රධාන වශයෙන් රජයේ රෝහල් සහ අනෙක් ආයතනවල සේවයේ නියුතු හෙදියන්, වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පීන්, තාක්ෂණවේදීන් හෝ ඖෂධවේදීන් සඳහා මෙම වැඩසටහන් තුනම පවත්වනු ලැබේ. මෙම වැඩසටහන් තුනේම විෂය මාලාව Sri Lanka Qualification Framework (SLQF) මාර්ගෝපදේශ වලට සමගාමීව සංශෝධනය හා ප්‍රතිව්‍යුහගත කරන ලදි. උ/ පෙ සමත් පාසල් හැරයන නවකයින් මෙන්ම වැඩකරන වෘත්තිකයන් සඳහා ද අවස්ථා සැපයීමට හැකි නව මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී



ගෞරව උපාධියක් පීඨය විසින් ආරම්භ කරන ලදි. සියළුම දෙපාර්තමේන්තු සිය ඉගෙනුම් උපකාරක සේවාවන් වැඩි දියුණු කිරීමට උත්සහ දැරීය: උදාහරණයක් වශයෙන් පාඨමාලා 40 ට වැඩි සංඛ්‍යාවක් මාර්ගගතව සහයෝගය දක්වන ලද අතර පාඨමාලා කිහිපයක පාසල් දින පටිගත කර පසුව නැරඹීමට ලබා දෙන ලද අතර අනෙක් ප්‍රාදේශීය සිසුන් වෙත ප්‍රවේශ වීමට වීඩියෝ සම්මන්ත්‍රණ සැසි කිහිපයක් පැවැත්විණ. පාඩම් ද්‍රව්‍ය ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් සැපයීමට වෛද්‍ය පර්යේෂණ විද්‍යා දෙපාර්තමේන්තුව මූලිකත්වය ගන්නා ලදි.

**ශිෂ්‍යයන්:** 2018 දී, පීඨයේ උපාධි වැඩසටහන් 4 සඳහා නව ශිෂ්‍ය බඳවාගැනීම් පසුගිය වසරට සාපේක්ෂව 20% කින් පමණ වැඩි වී ඇති අතර පීඨයේ සම්පූර්ණ උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව ආසන්න වශයෙන් 3980කි. ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08ක පිරිනමන හෙද උපාධිය සඳහා වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි වී ඇති අතර අනෙකුත් උපාධි 03 හි අධ්‍යයන ක්‍රියාකාරකම් කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පමණක් පවත්වනු ලැබේ. 2018 ජුනි පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවයේදී පීඨය විසින් හෙදකම පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරීන් 227ක සංඛ්‍යාවක් බිහි කරන ලදි. එමෙන්ම ප්‍රථම වතාවට වෛද්‍ය පර්යේෂණාගාර විද්‍යාවේදී ශිෂ්‍යයන් 20ක් උපාධි ලැබූ අතර ප්‍රථම වතාවට වෛද්‍ය පර්යේෂණ විශිෂ්ඨත්වය සඳහා වන නාලනී ද සිල්වා රන් පදක්කම ද ඇතුළත්ව එහිදී, උපාධි පදක්කම් 4ක්/ ත්‍යාග පිරිනැමිණ. මීට අමතරව, 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා හෙද විද්‍යා, වෛද්‍ය පර්යේෂණාගාර විද්‍යාවේදී සහ ඖෂධවේදී උපාධි වැඩසටහන් වල ඉහළ ජයග්‍රාහකයන් පීඨාධිපතිගේ කීර්තිමත් ශිෂ්‍ය ලැයිස්තුවට ඇතුළත් කිරීමෙන් පිළිගැනීමට ලක්විය.

**සෙසු ක්‍රියාකාරකම්:** මනෝවිද්‍යා සහ උපදේශන දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන උපදේශන ඒකකය සහ වෛද්‍ය රසායනාගාර විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන රෝග

විනිශ්චය පිළිබඳ රසායනාගාර සේවාවන්, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් වෙනුවෙන් අඛණ්ඩව සේවයෙහි නියුක්තව සිටී. උපදේශන ඒකකය සහ දෙපාර්තමේන්තු විසින් විශ්ව විද්‍යාල ප්‍රජාවගේ සෞඛ්‍ය හා සුබසිද්ධිය ප්‍රවර්ධනය කළ හැකි මාතෘකා පිළිබඳ සාකච්ඡා/ වැඩමුළු සංවිධානය කරන ලදි.

### 4.3.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

| සෞඛ්‍ය විද්‍යා පීඨය | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන | අදියර | මාධ්‍යය | නව බඳවාගැනීම් | සම්පූර්ණ කරන ලද |
| විද්‍යාවේදී හෙද (ගෞරව) උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 647 | 227 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී (ගෞරව) උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 124 | 20 |
| ඖෂධ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 83 | - |
| මනෝවිද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 68 | - |
| දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | 01 | - |
| එකතුව | | | **923** | **247** |

*19 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම - සෞඛ්‍ය විද්‍යා පීඨය*

### 4.3.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

| වැඩසටහන | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| විද්‍යාවේදී හෙද උපාධිය (BSc Hons Nursing) | 3273 | 30 | 47 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී උපාධිය (BMLS Hons) | 354 | | |
| ඖෂධ විද්‍යාවේදී උපාධිය (BPharm Hons) | 291 | | |
| මනෝවිද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය (BSc Hons in Psychology) | 68 | | |
| දර්ශනපති/ ආචාර්ය උපාධිය | 01 | | |

*20 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය - සෞඛ්‍ය විද්‍යා පීඨය*

### 4.3.4 නව පාඨමාලා/ වැඩසටහන්

| පාඨමාලාව/ වැඩසටහන | මාධ්‍ය | අදියර |
|---|---|---|
| මනෝවිද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය | ඉංග්‍රීසි | ගෞරව උපාධි අදියර 3-6 |

*21 වගුව : නව පාඨමාලා/ වැඩසටහන් - සෞඛ්‍ය විද්‍යා පීඨය*

## 4.3.5 මාර්ගගත පාඨමාලා

| පාඨමාලා කේතය සහ නම | අදියර | මාධ්‍යය |
|---|---|---|
| **හෙද විද්‍යා දෙපාර්තමේන්තුව** | | |
| NGU5303- හෙදවිද්‍යා පර්යේෂණ ක්‍රම | උපාධි | ඉංග්‍රීසි |
| NGU5405- ළමා රෝග පිළිබඳ හෙද විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| NGU5406- මනෝ චිකිත්සාව හා මානසික සෞඛ්‍ය හෙද විද්‍යා | උපාධි | ඉංග්‍රීසි |
| NGU6304- වෘද විද්‍යාත්මක හෙද විද්‍යා | උපාධි | ඉංග්‍රීසි |
| NGU6311- හෙද විද්‍යා පර්යේෂණ | උපාධි | ඉංග්‍රීසි |
| NGU6602- මහජන සෞඛ්‍ය හෙද විද්‍යා | උපාධි | ඉංග්‍රීසි |
| NGU6803- පර්යේෂණ ව්‍යාපෘති | උපාධි | ඉංග්‍රීසි |
| **වෛද්‍ය රසායනාගාර විද්‍යා දෙපාර්තමේන්තුව** | | |
| MDE3208 වෛද්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පීන් සඳහා ආරම්භක පාඨමාලාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU3303 සායනික ජෛව රසායනය | උපාධි | ඉංග්‍රීසි |
| MDU3306 වෛද්‍ය පරපෝෂ විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU4501 රුධිරවේදය II | උපාධි | ඉංග්‍රීසි |
| MDU4406 හිස්ටෝ ව්‍යාධි විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU4307 වෛරස අධ්‍යයන විද්‍යාව හා දිලීර විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU4209 සාමාන්‍ය ව්‍යාධි විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU5303 ප්‍රතිශක්ති විද්‍යාව හා මස්තුවේදය | උපාධි | ඉංග්‍රීසි |
| MDU5206 සෛල විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU5407 රසායනාගාර ස්වයංක්‍රීයකරණය හා උපකරණ සැකසීම | උපාධි | ඉංග්‍රීසි |
| MDU6301 සෛල ජාන විද්‍යාව සහ අණුක ජාන විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU6302 මහජන සෞඛ්‍ය ක්ෂුද්‍රජීවී විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU6503 සායනික ජෛව රසායනය III | උපාධි | ඉංග්‍රීසි |
| MDU6404 වෛද්‍ය රසායනාගාර තත්ත්ව කළමනාකරණය හා පැවරීම | උපාධි | ඉංග්‍රීසි |
| MDU6800 පර්යේෂණ ව්‍යාපෘති | උපාධි | ඉංග්‍රීසි |
| MDU6355 ප්‍රතිශක්ති පටක රසායන විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| MDU6451 පාරවිලයන හා බද්ධ කිරීමේ විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |

| පාඨමාලා කේතය සහ නම | අදියර | මාධ්‍යය |
| --- | --- | --- |
| **ඖෂධ විද්‍යා දෙපාර්තමේන්තුව** | | |
| FMU3203- ඖෂධ විද්‍යාව I | උපාධි | ඉංග්‍රීසි |
| FMU3302/FMU4357- භෞතික ඖෂධ විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| FMU3356- ඖෂධ කළමනාකරණය | උපාධි | ඉංග්‍රීසි |
| FMU4300-ව්‍යාධි විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| FMU4303- ඖෂධවේදය I | උපාධි | ඉංග්‍රීසි |
| FMU4501- ඖෂධ විද්‍යාව II | උපාධි | ඉංග්‍රීසි |
| FMU5207- ඖෂධ පර්යේෂණ හැඳින්වීම | උපාධි | ඉංග්‍රීසි |
| FMU5400- ඖෂධවේදය II | උපාධි | ඉංග්‍රීසි |
| FMU5403- ඖෂධ තාක්ෂණවේදය I | උපාධි | ඉංග්‍රීසි |
| FMU5406- ඖෂධ කළමනාකරණය අලෙවිකරණය හා ගිණුම්කරණය | උපාධි | ඉංග්‍රීසි |
| FMU6300- ඖෂධ ජෛවතාක්ෂණය හා ජාන ඉංජිනේරු විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| FMU6301- ජෛව රසායන | උපාධි | ඉංග්‍රීසි |
| FMU6302- චිකිත්සාව | උපාධි | ඉංග්‍රීසි |
| FMU6303- සායනික ඖෂධ විද්‍යාව I | උපාධි | ඉංග්‍රීසි |
| FMU6806- පර්යේෂණ ව්‍යාපෘති | උපාධි | ඉංග්‍රීසි |
| **මනෝවිද්‍යා හා උපදේශන දෙපාර්තමේන්තුව** | | |
| PLU3301-මනෝවිද්‍යාව හැඳින්වීම | උපාධි | ඉංග්‍රීසි |
| PLU3303-අභිප්‍රේරණය සහ හැඟීම් | උපාධි | ඉංග්‍රීසි |
| PLU3205-මනෝවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රීය ලිවීම් | උපාධි | ඉංග්‍රීසි |
| PLU3307- ආයුකාලය වර්ධනය කිරීම | උපාධි | ඉංග්‍රීසි |
| PLU3308- සමාජ මනෝවිද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |

***22 වගුව : මාර්ගගත පාඨමාලා - සෞඛ්‍ය විද්‍යා පීඨය***

# 4.4 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

## 4.4.1 විශ්ලේෂණය



මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවේ සමකාලීන ක්ෂේත්‍රයන්හි ශිෂ්‍යත්ව සහ පර්යේෂණවල වෘත්තීමය ප්‍රගමණය හා විශිෂ්ටත්වය සඳහා ගුණාත්මක අධ්‍යාපන අවස්ථා සැලසීම වෙනුවෙන් විවෘත දුරස්ථ ඉගෙනුම් මාධ්‍යය යොදාගැනීමට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය කැපවී සිටී.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව තුළ ප්‍රධාන ක්ෂේත්‍ර නියෝජනය කරමින් සමාජ අධ්‍යයන, නීති අධ්‍යයන, භාෂා අධ්‍යයන සහ කළමනාකරණ ආදී දෙපාර්තමේන්තු හතරකින් පීඨය සමන්විත වේ. තවද, අභිනවයෙන් ස්ථාපිත කළ තොරතුරු අධ්‍යයන ඒකකය විසින් 2018 වර්ෂයේ සිට පුස්තකාල සහ තොරතුරු අධ්‍යයනය ලෙස නව ක්ෂේත්‍රයක් එකතු කරන ලදි. පූර්ව උපාධි අධ්‍යයන වැඩසටහන් සිට පශ්චාත් උපාධි අදියර අධ්‍යයන වැඩසටහන් දක්වා උසස් අධ්‍යාපනය කරගෙන යාමට බහුවිධ අවස්ථා සැලසීම වෙනුවෙන් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය නොයෙක් ක්‍රියාමාර්ග ගෙන තිබේ. ඉංග්‍රීසි හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය සහ පුස්තකාල හා තොරතුරු අධ්‍යයන ශාස්ත්‍රවේදී උපාධිය හැර අනෙකුත් සියළුම ප්‍රථම උපාධි වැඩසටහන් සහ පූර්ව උපාධි වැඩසටහන් ප්‍රාදේශීය මධ්‍යස්ථාන නවයෙහිම පවත්වනු ලැබේ. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය ආසන්න වශයෙන් සිසුන් 15,000 කට පහසුකම් සපයන අතර සිසුන්ගේ සම්මාන වලට අනුව විවෘත විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ජනගහනයෙන් හරි අඩක් පමණ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය විද්‍යාර්ථීන්ට භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව හරහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වගකීම පීඨය විසින් බාරගෙන ඇත. 2018 වර්ෂයේදී පීඨය විසින් පූර්ව උපාධි වැඩසටහන් 12ක් පිරිනමන ලදි. ඒ අතරින් සමාජ විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන සුවිශේෂ භූමිකාවක් නිරූපණය කරයි.

අනෙක් පූර්ව උපාධි වැඩසටහන් සාර්ථකව නිමකිරීම පීඨය තුළ සහ විවෘත විශ්වවිද්‍යාලයේ අනෙක් පීඨවලද නොයෙක් උපාධි අවස්ථා විවර කරදෙනු ලබයි. 2018 දී පීඨය විසින් පිරිනමන කෙටි කාලීන පාඨමාලා, පූර්ව උපාධි, ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටමේ වැඩසටහන්වල සාරාංශය සහ ඉගෙනුම ලබන්නන්ගේ මුළු සංඛ්‍යාව වගුවෙන් දැක්වේ.

| වැඩසටහන | ශිෂ්‍ය සංඛ්‍යාව | සම්මානලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| පූර්ව උපාධි (12)* | 3,323 | 1,403 |
| උපාධි (5)* | 11,090 | 1,025 |
| පශ්චාත් උපාධි (4)* | 426 | 116 |
| දර්ශනපතිඋපාධිය/ ආචාර්ය උපාධිය (1)* | 5 | 1 (PhD) |
| **එකතුව (22)*** | **14,844** | **2,545** |

* වැඩසටහන් සංඛ්‍යාව වරහන් තුළ දක්වා ඇත.

පීඨය විසින් ක්ෂේත්‍ර හයකින් කෙටි පාඨමාලා පිරිනමන අතර 2018 වසරේදී ස්වේච්ඡා ඉඩම් අත්පත් කරගැනීම හා නැවත පදිංචි පිළිබඳ කෙටි පාඨමාලාවක් හඳුන්වාදෙන ලදි. 2018 වසරේදී 3014ක් වන සම්පූර්ණ අපේක්ෂකයන් සංඛ්‍යාව කෙටි පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කර ඇත.

පීඨයේ ලියාපදිංචි වූ ඉගෙනුම ලබන්නන්ගෙන් බහුතරයක් රැකියා නියුක්තිකයන් වන අතර පවුලේ සහ රැකියා අවශ්‍යතා සපුරාලමින් නිර්දේශිත නම්‍යශීලී කාල පරාසයක් තුළ විවෘත දුරස්ථ ඉගෙනුම් මාධ්‍ය භාවිතා කරමින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කරගැනීමට බලපොරොත්තු වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව පාලන කවුන්සිලය විසින් පත් කරන ලද සමාලෝචන කණ්ඩායම මගින් 2018 දී උපාධි වැඩසටහන් 4ක් සමාලෝචනය කරන ලද අතර පහත සඳහන් ශ්‍රේණි ලබාගන්නා ලදි.

| | වැඩසටහන | ප්‍රදානය කරන ලද ශ්‍රේණිය |
|---|---|---|
| 1 | ඉංග්‍රීසි හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | ඉතා හොඳයි (A) |
| 2 | කළමනාකරණ අධ්‍යයනවේදී උපාධිය | හොඳයි (B) |
| 3 | නීතිවේදී උපාධිය | හොඳයි (B) |
| 4 | සමාජ විද්‍යාවේදී උපාධිය | ඉතා හොඳයි (A) |

අධ්‍යයන වැඩසටහන්වල තත්වය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාවේ අපේක්ෂිත ලකුණු වලට අනුකූල වන බව ඉහත සමාලෝචන වාර්තාව පෙන්වා දේ.

2018 වර්ෂයේදී ඉගෙනුම ලබන්නන් 100 දෙනෙකු සඳහා පීඨාධිපතිගේ ප්‍රශංසා ලිපි නිකුත් කරන ලදි. පුස්තකාල හා තොරතුරු අධයනවේදී නව අධ්‍යයන වැඩසටහන සඳහා සහාය දැක්වීම වෙනුවෙන් තොරතුරු අධ්‍යයන ඒකකය පීඨය තුළ ස්ථාපිත කරන ලද අතර 2018 දී මෙම වැඩසටහන පුස්තකාලයාධිපති හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාල කාර්ය මණ්ඩලයේ නායකත්වය යටතේ මෙම වැඩසටහන ආරම්භ විය. නව කළමනාකරණ අධ්‍යයන පීඨයක් හා නව ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් දෙපාර්තමේන්තුවක් ඉල්ලුම් කරමින් වෙනත් යෝජනා ද්විත්වයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2017 දී ඉදිරිපත් කරන ලදි. එම යෝජනා ද්විත්වයම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2018 දී අනුමත කරන ලදි. කැපවුණු , පළපුරුදු ලත් කාර්ය මණ්ඩලයකින් පීඨය සමන්විත වන අතර, ඉන් 80%ක් පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගෙන ඇත. ජාතික සංවර්ධන ඉලක්ක වෙත ළඟා වෙමින් ඉගෙනුම ලබන්නන්ගේ අභිලාශයන් වෙත ප්‍රවිෂ්ටවීම උදෙසා උසස් තත්වයේ ඉගෙනුම් ප්‍රතිදානයන් නිපදවීම වෙනුවෙන් ඔවුන් සූදානමින් කැපවී සිටී.

## 4.4.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

| වැඩසටහන | අදියර | මාධ්‍යය | නව බඳවාගැනීම් | සම්පූර්ණ කරන ලද |
|---|---|---|---|---|
| ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 553 | 281 |
| සවන්දීමේ හා කථන කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 2782 | 2176 |
| මානව සම්පත් කළමනාකරණ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 1098 | 907 |
| අලෙවිකරණ කළමනාකරණ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 63 | 40 |
| සංචාරක හා හෝටල් මෙහෙයුම් කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 223 | 82 |
| කථන දෙමළ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | දෙමළ | 25 | 23 |
| කොරියන් භාෂා කෙටි පාඨමාලාව- මූලික | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 35 | 35 |
| කොරියන් භාෂා කෙටි පාඨමාලාව - මධ්‍යම | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 10 | 10 |
| ස්වෙච්ඡා ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 40 | 35 |
| සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 287 | 185 |
| ආධුනික/ සිංහල මූලික පාඨමාලාව | සහතික පත්‍ර | සිංහල | 291 | 118 |
| ආධුනික/ දෙමළ මූලික පාඨමාලාව | සහතික පත්‍ර | දෙමළ | 322 | 118 |
| ව්‍යාපාර හා වෘත්තීමය සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි උසස් සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 653 | 340 |
| ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍ය ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 57 | 47 |
| තරුණ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 82 | 26 |
| කළමනාකරණ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 1505 | 121 |
| නීතිවේදී උපාධිය | උපාධි | සිංහල,දෙමළ, ඉංග්‍රීසි | 699 | 370 |
| සමාජ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 1079 | 493 |
| ඉංග්‍රීසි හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 43 | 41 |
| පුස්තකාල තොරතුරු අධ්‍යයනය ශාස්ත්‍රවේදී උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 32 | - |
| ව්‍යාපාර/රාජ්‍ය පරිපාලන පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩල විධායක ශාස්ත්‍රපති උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | 49 | 45 |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | 31 | 28 |
| නීතිපති උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | 53 | 11 |
| සංවර්ධන අධ්‍යයනය හා රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | 17 | 14 |
| දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | - | 01 |
| **එකතුව** | | | **10029** | **5547** |

***23 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය***

## 4.4.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

| වැඩසටහන | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | බාහිර කාර්ය මණ්ඩලයද ඇතුළුව අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව | 866 | 78 | 26 |
| කළමනාකරණ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය | 3850 | | |
| ව්‍යාපාර/ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය විධායක ශාස්ත්‍රපති උපාධිය | 147 | | |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධිය | 99 | | |
| ඉංග්‍රීසි හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | 321 | | |
| ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍ය ඩිප්ලෝමා පාඨමාලාව | 127 | | |
| ව්‍යාපාර හා වෘත්තීමය සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි උසස් සහතික පත්‍ර පාඨමාලාව | 939 | | |
| ආධුනික/ දෙමළ මූලික පාඨමාලාව | 293 | | |
| ආධුනික/ සිංහල මූලික පාඨමාලාව | 200 | | |
| දෙමළ මූලික පාඨමාලාව | 149 | | |
| සිංහල මූලික පාඨමාලාව | 158 | | |
| නීතිවේදී උපාධිය | 4410 | | |
| නීතිපති උපාධිය | 120 | | |
| සහතික පත්‍ර / සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව | 426 | | |
| ඩිප්ලෝමා / තරුණ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 138 | | |
| සමාජ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධිය | 2477 | | |
| සංවර්ධන අධ්‍යයනය හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 60 | | |

***24 වගුව: ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය***

## 4.4.4 නව පාඨමාලා / වැඩසටහන්

| පාඨමාලාව/ වැඩසටහන | මාධ්‍යය | අදියර |
|---|---|---|
| මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය කෙටි පාඨමාලාව | ඉංග්‍රීසි | සහතික පත්‍ර |
| මූල්‍ය ගිණුම්කරණය කෙටි පාඨමාලාව | ඉංග්‍රීසි | සහතික පත්‍ර |
| පරිගණක මූලික ගිණුම්කරණය කෙටි පාඨමාලාව | ඉංග්‍රීසි | සහතික පත්‍ර |
| අලෙවිකරණය කෙටි පාඨමාලාව | ඉංග්‍රීසි | සහතික පත්‍ර |
| අලෙවි කළමනාකරණ කෙටි පාඨමාලාව | ඉංග්‍රීසි | සහතික පත්‍ර |

***25 වගුව: නව පාඨමාලා / වැඩසටහන් – මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය***

## 4.4.5 මාර්ගගත පාඨමාලා

| පාඨමාලා කේතය සහ නම | අදියර | මාධ්‍යය |
|---|---|---|
| යුධ කාව්‍ය | උපාධි | ඉංග්‍රීසි |
| DSU4323: පාරිසරික නොවන සන්නිවේදනය | උපාධි | ඉංග්‍රීසි |
| DSU4333: සංවර්ධන ආර්ථික විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| DSU4334: ජත්‍යන්තර ආර්ථික විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| DSU4335: මූල්‍ය ආර්ථික විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| DSU4353: ඥාතීත්වය, පවුල සහ විවාහය | උපාධි | ඉංග්‍රීසි |
| DSU4345: දේශපාලන සහභාගීත්වය, නියෝජනය සහ පාලනය | උපාධි | ඉංග්‍රීසි |
| DSU4355: ආගම, සමාජය සහ සංස්කෘතිය | උපාධි | ඉංග්‍රීසි |
| DSU4356: දේශපාලනය සහ සමාජ ව්‍යාපාර | උපාධි | ඉංග්‍රීසි |
| DSU4344: අන්තර්ජාතික සංවිධාන හා දේශාතික්‍රාන්ත ආණ්ඩුව | උපාධි | ඉංග්‍රීසි |
| DSU5356: එදිනෙදා ජීවිතය හා ජනවාර්ගිකත්වය | උපාධි | ඉංග්‍රීසි |
| DSU4346: රාජ්‍ය ප්‍රතිපත්තිය හා පරිපාලනය | උපාධි | ඉංග්‍රීසි |
| DSU5332: කෘෂි ආර්ථික විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| DSU5347: නීතිය හා දේශපාලනය | උපාධි | ඉංග්‍රීසි |
| DSU4332: සෞඛ්‍ය ආර්ථික විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| DSU3552: ශ්‍රී ලාංකික සමාජය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය | උපාධි | ඉංග්‍රීසි |
| DSU5336: නාගරික ආර්ථික විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| DSU4327: චිත්‍රපට හා නාට්‍ය රසාස්වාදය | උපාධි | ඉංග්‍රීසි |
| DSU5344: ගෝලීයකරණය වූ ලෝකයේ ශ්‍රී ලංකාව: ගැටළු හා අභියෝග | උපාධි | ඉංග්‍රීසි |
| DSU4336: රාජ්‍ය මුදල් | උපාධි | ඉංග්‍රීසි |
| DSU5346: සයිබර් දේශපාලනය හා ආණ්ඩු | උපාධි | ඉංග්‍රීසි |
| DSU4323: ආපදා ප්‍රගමනය පිළිබඳ සන්නිවේදනය | උපාධි | ඉංග්‍රීසි |
| DSU5323: ආයතනික සන්නිවේදනය හා ප්‍රතිරූප නැංවීම | උපාධි | ඉංග්‍රීසි |
| DSU5325: සන්නිවේදන ක්‍රියාමාලාව | උපාධි | ඉංග්‍රීසි |
| DSU5345: රාජ්‍යය, සමාජය හා පුරවැසියා: දේශපාලනික ජීවිතය පිළිබඳ ප්‍රමාණික මානයන් | උපාධි | ඉංග්‍රීසි |
| DSU5354: සෞඛ්‍ය හා සමාජය | උපාධි | ඉංග්‍රීසි |
| DSU5357: ගෝලීයකරණය, සංක්‍රමණය හා සමාජ වෙනස්කම් | උපාධි | ඉංග්‍රීසි |
| DSU4324: වෙළඳ ප්‍රචාරණය හා ප්‍රවර්ධනය | උපාධි | ඉංග්‍රීසි |

***26 වගුව : මාර්ගගත පාඨමාලා – මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය***

## 4.5 ස්වභාවික විද්‍යා පීඨය

### 4.5.1 විශ්ලේෂණය



*පීඨ දර්ශනය : "ජාතික ඉලක්ක සපුරා ගැනීම සඳහා කැපවෙමින් ද විද්‍යා ක්ෂේත්‍රයෙහි විවෘත හා දුරස්ථ අධ්‍යාපනයේ නායකත්වය විදහා දක්වමින් ද ඉගැන්වීම - ඉගෙනගැනීම හා පර්යේෂණ යන කාර්යයන්හි දී නව්‍යකරණය කෙරෙහි යොමු වීම.*

**පීඨයේ ප්‍රධාන අරමුණු:**

- සිය අධ්‍යයන, වෘත්තීය හා යාවජීව ඉගෙනුම් අරමුණු තුළින් සාර්ථකත්වයට පත් වන කාර්යක්ෂම හා අභිප්‍රේරිත පුද්ගලයන්ගේ නව පරපුරක් සංවර්ධනය කිරීම.
- ආධුනිකයන්ගේ උසස් අධ්‍යාපනය සහ වෘත්තීමය සංවර්ධනය සඳහා ජාතික අභිමතාර්ථ සහ ඉල්ලීම් මගින් දැනුවත් කරනු ලබන ගුණාත්මක වැඩසටහන් ඉදිරිපත් කිරීම.
- පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ ව්‍යවසාය ක්‍රියාකාරකම් සඳහා සහාය දැක්වීම හා ප්‍රවර්ධනය කිරීම.
- සහයෝගී හවුල්කාරීත්වය සහ පොදු සේවාවන් හරහා ප්‍රජාව හා ජාතිය සඳහා සහාය දැක්වීම.
- විවෘත ප්‍රවේශයේ නම්‍යශීලී පද්ධතියක් හරහා මූලික හා ව්‍යවහාර විද්‍යාවේ ව්‍යාප්තිය ඉහළ නැංවීම.

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලීය ස්වභාවික විද්‍යා පීඨයට විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය හරහා විද්‍යා උපාධි වැඩසටහන් ලබා දීම තුළ වසර 31කට අධික පළපුරුද්දක් තිබේ. උද්භිද විද්‍යා, රසායන විද්‍යා, පරිගණක විද්‍යා, ගණිත, භෞතික විද්‍යා සහ සත්ත්ව විද්‍යා යන දෙපාර්තමේන්තු 6න් පීඨය සමන්විත වේ. වර්තමානය වන විට ස්වභාවික විද්‍යා පීඨය, විද්‍යාව තුළ වෙනස් වන ක්ෂේත්‍රයන් පිළිබඳ ගුණාත්මක අධ්‍යයන වැඩසටහන් පුළුල් පරාසයක් තුළ ඉදිරිපත් කරයි. ඉදිරිපත් කරනු ලබන අධ්‍යයන වැඩසටහන්/ අධ්‍යයන පාඨමාලා ලැයිස්තුව පහත දැක්වේ.

- විද්‍යාවේදී උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී ඩිප්ලෝමාව
- පරිසර අධ්‍යයනපති උපාධිය (අන්තර් පීඨ වැඩසටහන)
- වෛද්‍ය කීට විද්‍යාව හා ව්‍යවහාරික පරපෝෂිතවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය
- අධ්‍යාපනවේදී උපාධිය (ස්වභාවික විද්‍යා) (අධ්‍යාපන පීඨය)
    - ක්ෂුද්‍රජීවී විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (මාර්ගගතව සබැඳි වැඩසටහන)

- පාරිසරික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව
- ස්වාභාවික සම්පත් හා පාරිසරික සංචාරක ඩිප්ලෝමා පාඨමාලාව
- රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වනජීවී සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
- විද්‍යාව සඳහා වන තනි පාඨමාලා



2018 ඔක්තෝබර් 9 වන දින පීඨ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පවත්වනු ලැබූ අතර එම උත්සවයේදී පීඨාධිපති ලැයිස්තු ප්‍රදාන එනම් කන්දයියා අනුස්මරණ ශිෂ්‍යත්ව ප්‍රදානය, නාලිනී රත්නසිරි ශිෂ්‍යත්ව ප්‍රදානය, බකීබෝල සමාජ ප්‍රදානය, සූ නෙට් ප්‍රදානය, බොට්සොක් සහ ස්පෙක්ට්‍රම් ප්‍රදානය යනාදිය සිදු කරන ලදි. වසර තුළ දී විද්‍යාපති උපාධිධාරීන් 366 ක් බිහිකොට ඇති අතර ඒ අනුව මේ දක්වා බිහි කළ උපාධිධාරීන්ගේ සංඛ්‍යාව 5271කි. 2017/2018 අධ්‍යයන වර්ෂයේ විද්‍යාපති උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වූ නව ශිෂ්‍ය සංඛ්‍යාව 881ක් විය.

පීඨයේ වාර්ෂික පර්යේෂණ සංසදය 2018 ජුනි 28 වන දින පවත්වන ලදි. උපාධිධාරීන්, පශ්චාත් උපාධිධාරීන් සහ ඩිප්ලෝමා මටටමේ අයගේ පර්යේෂණ කටයුතු අධීක්ෂණය කිරීම මගින් සහ ඊට අමතරව වෙනත් බොහෝ පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම මගින් විශ්ව විද්‍යාලීය පර්යේෂණ කෙරෙහි පීඨය දායකත්වය ලබා දී ඇත.

## 4.5.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

| ස්වභාවික විද්‍යා පීඨය | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන | අදියර | මාධ්‍යය | නව බඳවාගැනීම් | සම්පූර්ණ කරන ලද |
| රසායනාගාර තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | SLQF අනුවාදයට අනුකූලව ඉහළ නැංවීම සැකසෙමින් පවතී - නව ශිෂ්‍ය බඳවාගැනීම් 2020 දී සිදු කිරීමට නියමිතයි. | |
| වනජීවී සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි සහ සිංහල | SLQF අනුවාදයට අනුකූලව ඉහළ නැංවීම (වනජීවී සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව) නව ශිෂ්‍ය බඳාවාගැනීම 2019 දී සිදු කිරීමට නියමිතයි. | වැඩසටහන 2019 මැයි 30 වන දින ආරම්භ කෙරේ. |
| පරිගණක ජාල සුරක්ෂිතභාවය පිළිබඳ කෙටි පාඨමාලාව. | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 78 | 59 |
| ජුම්ලා සහ වර්ඩ්ප්‍රෙස් භාවිතයෙන් වෘත්තීය වෙබ් සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 42 | 42 |
| ආරම්භක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 16 | 11 |
| වෘත්තීය පරිගණක යෙදවුම් පිළිබඳ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 116 | 63 |
| පැළ අභිජනන තාක්ෂණ පිළිබඳ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 25 | 25 |
| උසස් වෙබ් සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 22 | 18 |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඉගැන්වීම පිළිබඳ ගුරු ශක්නුතාව වැඩි දියුණු කිරීමේ කෙටි පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 12 | දැනට සම්පූර්ණ කර නොමැත. |
| පරිගණක ජාල පද්ධති පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 30 | |
| පුද්ගලික පරිගණක යෙදවුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | 45 | |
| රසායනාගාර තාක්ෂණ උසස් සහතික පත්‍ර පාඨමාලාව | සහතික පත්‍ර | ඉංග්‍රීසි | අදියරෙන් ඉවත් විය | |
| විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | ඉංග්‍රීසි | පිටවීමේ සුදුසුකම | |
| ක්ෂුද්‍රජීවී විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | ඉංග්‍රීසි | - | 14 |
| ස්වභාවික සම්පත් හා පාරිසරික සංචාරක ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා | ඉංග්‍රීසි | SLQF අනුවාදයට අනුකූලව ඉහළ නැංවීම සැකසෙමින් පවතී - නව ශිෂ්‍ය බඳවාගැනීම් 2020 දී සිදු කිරීමට නියමිතයි. | දැනට සම්පූර්ණ කර නොමැත. |
| විද්‍යාවේදී උපාධිය | උපාධි | ඉංග්‍රීසි | 881 | 366 |
| පාරිසරික අධ්‍යයන විද්‍යාපති උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | 41 | 11 |
| වෛද්‍ය කීට විද්‍යා ව්‍යවහාරික පරපොෂිතවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | SLQF අනුවාදයට අනුකූලව ඉහළ නංවා ඇත. නව ශිෂ්‍ය බඳවාගැනීම 2019දී සිදු කෙරේ. | දැනට සම්පූර්ණ කර නොමැත. |
| දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය | පශ්චාත් උපාධි | ඉංග්‍රීසි | 03 | 03 |

*27 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම - ස්වභාවික විද්‍යා පීඨය*

## 4.5.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

| වැඩසටහන | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| විද්‍යාවේදී උපාධිය | 3841 | 148 | 47 |
| ක්ෂුද්‍රජීවී විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව | - | | |
| රසායනාගාර තාක්ෂණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACLT) | 01 | | |
| රසායනාගාර තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 03 | | |
| පරිගණක ජාල සහ ආරක්ෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 55 | | |
| වෘත්තීය පරිගණක යෙදවුම් පිළිබඳ කෙටි පාඨමාලාව | 85 | | |
| ජුම්ලා සහ වර්ඩ්ප්‍රෙස් භාවිතයෙන් වෙබ් සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 17 | | |
| ආරම්භක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කෙටි පාඨමාලාව | 16 | | |
| උසස් වෙබ් සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව | 22 | | |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඉගැන්වීම පිළිබඳ ගුරු ශක්නුතාව වැඩි දියුණු කිරීමේ කෙටි පාඨමාලාව | 12 | | |
| පරිගණකජාලකරණය සහ ආරක්ෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CCNS) | 33 | | |
| වෘත්තීය පරිගණක යෙදවුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CPCA) | 45 | | |
| ජුම්ලා සහ වර්ඩ්ප්‍රෙස් භාවිතයෙන් වෙබ් සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව | 42 | | |
| පාරිසරික විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - CESSD | පිටවීමේ මට්ටම පමණි | | |
| පාරිසරික අධ්‍යයන විද්‍යාපති උපාධිය -CESSD | 107 | | |
| වෛද්‍ය කීට විද්‍යා ව්‍යවහාරික පරපෝෂිතවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය | 03 | | |
| ශාක අභිජනන තාක්ෂණය පිළිබඳ කෙටි පාඨමාලාව | 25 | | |

***28* වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය - ස්වභාවික විද්‍යා පීඨය**

## 4.5.4 නව පාඨමාලා/ වැඩසටහන්

| පාඨමාලාව/ වැඩසටහන | මාධ්‍යය | අදියර |
|---|---|---|
| වනජීවී සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | ඉංග්‍රීසි | අදියර 2 (සහතික පත්‍ර පාඨමාලාව) |
| පාරිසරික බලපෑම් ඇගයීම (FNU6302) | ඉංග්‍රීසි | අදියර  6 (විශේෂ විෂය) |
| ආරම්භක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කෙටි පාඨමාලාව | ඉංග්‍රීසි | කෙටි පාඨමාලාව |
| උසස් වෙබ් සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව | ඉංග්‍රීසි | කෙටි පාඨමාලාව |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඉගැන්වීම පිළිබඳ ගුරු ශක්නුතාව වැඩි දියුණු කිරීමේ කෙටි පාඨමාලාව | ඉංග්‍රීසි | කෙටි පාඨමාලාව |

***29 වගුව : නව පාඨමාලා/ වැඩසටහන් - ස්වභාවික විද්‍යා පීඨය***

## 4.5.5 මාර්ගගත පාඨමාලා

| පාඨමාලා කේතය සහ නම | අදියර | මාධ්‍යය |
|---|---|---|
| **පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව** | | |
| CSU4300/CSU5315 මෙහෙයුම් පද්ධති | උපාධි | ඉංග්‍රීසි |
| CSU4303/CSU5316 පරිගණක ජාල | උපාධි | ඉංග්‍රීසි |
| **සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව** | | |
| ZYU3500-සත්ව ජීවය හා විවිධත්වය | උපාධි | ඉංග්‍රීසි |
| ZYU3301-ජෛව භූගෝල විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| ZYU4300-සත්ව සංවර්ධනය | උපාධි | ඉංග්‍රීසි |
| ZYU4303-සත්ව ස්වරූපය හා ක්‍රියාකාරීත්වය | උපාධි | ඉංග්‍රීසි |
| ZYU4301-පරිසර විද්‍යාවේ මූලධර්ම | උපාධි | ඉංග්‍රීසි |
| ZYU5300-ජලජ ජීව විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| ZYU5301-මත්ස්‍ය ජීව විද්‍යාව හා ධීවර කර්මාන්තය කළමනාකරණය | උපාධි | ඉංග්‍රීසි |
| ZYU5302-ජෛව විවිධත්වය සංරක්ෂණය හා කළමනාකරණය | උපාධි | ඉංග්‍රීසි |
| ZYU5304-පරපෝෂවේදය | උපාධි | ඉංග්‍රීසි |
| ZYU5307-ක්ෂීර ජීව විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| ZYU5309-පාෂාණීය විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| ZYU6300-කෘමි පළිබෝධ හ දෛශික කළමනාකරණය | උපාධි | ඉංග්‍රීසි |

| පාඨමාලා කේතය සහ නම | අදියර | මාධ්‍යය |
|---|---|---|
| ZYU6303-අණුක ජීව විද්‍යාව | උපාධි | ඉංග්‍රීසි |
| **ගණිත විද්‍යා දෙපාර්තමේන්තුව** | | |
| ADU3201 - මූලික සංඛ්‍යාලේඛන | උපාධි | ඉංග්‍රීසි |
| ADU3300 - දෛශික වීජ ගණිතය | උපාධි | ඉංග්‍රීසි |
| ADU3302 - අවකලන සමීකරණ | උපාධි | ඉංග්‍රීසි |
| ADU4300 - සංඛ්‍යාලේඛන බෙදා හැරීමේ සිද්ධාන්ත | උපාධි | ඉංග්‍රීසි |
| ADU4302 - දෛශික ගණනය | උපාධි | ඉංග්‍රීසි |
| ADU4303 - ව්‍යවහාරික රේඛීය වීජ ගණිතය සහ අවකලන සමීකරණ | උපාධි | ඉංග්‍රීසි |
| ADU5300 - රේඛීය ක්‍රම ලේඛනය | උපාධි | ඉංග්‍රීසි |
| ADU5302 - ගණිත ක්‍රම | උපාධි | ඉංග්‍රීසි |
| ADU5303 - නිව්ටන යාන්ත්‍ර විද්‍යාව II | උපාධි | ඉංග්‍රීසි |
| ADU5304 - මෙහෙයුම් පර්යේෂණ | උපාධි | ඉංග්‍රීසි |
| ADU5305 - සංඛ්‍යාලේඛන අනුමිතිය | උපාධි | ඉංග්‍රීසි |
| ADU5307 - සංඛ්‍යාත්මක ක්‍රම | උපාධි | ඉංග්‍රීසි |
| ADU5308 - ප්‍රස්තාර න්‍යාය | උපාධි | ඉංග්‍රීසි |
| PEU3202 - දෛශික අවකාශය | උපාධි | ඉංග්‍රීසි |
| PEU3300 - ගණිත තර්ක ශාස්ත්‍රය සහ ගණිත සාධනය | උපාධි | ඉංග්‍රීසි |
| PEU4300 - තථ්‍ය විශ්ලේෂණය I | උපාධි | ඉංග්‍රීසි |
| PEU4301 - තථ්‍ය විශ්ලේෂණය II | උපාධි | ඉංග්‍රීසි |
| PEU4302 - රේඛීය වීජ ගණිතය | උපාධි | ඉංග්‍රීසි |
| PEU4303 - කාණ්ඩ වාදය I | උපාධි | ඉංග්‍රීසි |
| PEU5300 - රිමාන් ඒකාබද්ධය | උපාධි | ඉංග්‍රීසි |
| PEU5302- සමායුක්ත වේදය | උපාධි | ඉංග්‍රීසි |

***30 වගුව : මාර්ගගත පාඨමාලා - ස්වභාවික විද්‍යා පීඨය***

# 5 කොටස - පර්යේෂණ සහ ප්‍රකාශන

# 5.0. පර්යේෂණ සහ ප්‍රකාශන

## 5.1 පර්යේෂණ ව්‍යාපෘති/ පත්‍රිකා

| පීඨය/ මධ්‍යස්ථානය | දෙපාර්තමේන්තුව | පර්යේෂණ ව්‍යාපෘති | ප්‍රකාශිත පත්‍රිකා | ඉදිරිපත් කළ පත්‍රිකා |
|---|---|---|---|---|
| අධ්‍යාපන | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය | 01 | 02 | 03 |
| | පූර්ව ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය | 01 | 01 | - |
| | ද්විතීය සහ තෘතීය අධ්‍යාපනය | 01 | 02 | 08 |
| ඉංජිනේරු තාක්ෂණ | කෘෂිකර්ම හා වැවිලි ඉංජිනේරු විද්‍යාව | - | 05 | - |
| | සිවිල් ඉන්ජිනේරු | - | 19 | - |
| | විදුලි සහ පරිගණක ඉංජිනේරු | 08 | 09 | - |
| | ඉංජිනේරු විද්‍යා ගණිතය හා දර්ශනය | - | 04 | 02 |
| | යාන්ත්‍රික ඉංජිනේරු | 08 | - | - |
| | පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය | 28 | 01 | 01 |
| සෞඛ්‍ය විද්‍යා | මූලික විද්‍යා | - | - | 09 |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යා | 13 | 05 | 03 |
| | හෙද | 01 | 04 | 22 |
| | ඖෂධවේද | 12 | 04 | 08 |
| | මනෝ විද්‍යා හා උපදේශන | 01 | 01 | 06 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | භාෂා අධ්‍යයන | 41 | 03 | 06 |
| | නීති අධ්‍යයන | - | - | - |
| | කළමනාකරණ අධ්‍යයන | 15 | 14 | 14 |
| | සමාජ විද්‍යා අධ්‍යයන | - | 14 | |
| ස්වභාවික විද්‍යා | උද්භිද විද්‍යාව | - | 14 | 08 |
| | රසායන විද්‍යාව | - | - | - |
| | පරිගණක විද්‍යාව | 02 | - | - |
| | ගණිතය | - | 05 | 09 |
| | භෞතික විද්‍යා | - | - | - |
| | සත්ව විද්‍යා | 06 | 09 | 16 |
| අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය | | - | - | - |
| ප්‍රාදේශීය අධ්‍යාපන සේවය | | - | 4 | 2 |
| පුස්තකාලය | | - | 06 | - |
| එකතුව | | **138** | **126** | **117** |

***31 වගුව : පර්යේෂණ ව්‍යාපෘති/ පත්‍රිකා***

ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඉංග්‍රීසි මාධ්‍යයෙන් සඳහන් කොටසෙහි ඇමුණුම්වල දක්වා ඇත.

## 5.2 ග්‍රන්ථ/ පේටන්ට්

| පීඨය/ මධ්‍යස්ථානය | පොත් වල පරිච්ඡේද | සම්පූර්ණ පොත් | ප්‍රකාශිත පේටන්ට් |
|---|---|---|---|
| අධ්‍යාපන | 02 | - | - |
| ඉංජිනේරු තාක්ෂණ | - | විදුලි සහ පරිගණක ඉංජිනේරු - 01 | පේෂකර්ම හා ඇඟළුම් තාක්ෂණ- 01 |
| සෞඛ්‍ය විද්‍යා | - | - | - |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | සමාජ අධ්‍යයන-02 නීති-02 | නීති-01 | භාෂා-01 |
| ස්වභාවික විද්‍යා | ගණිත 01 | - | - |

***32 වගුව: ග්‍රන්ථ/ පේටන්ට්***

## 5.3 සම්මාන

| පීඨය/ මධ්‍යස්ථානය | විශ්වවිද්‍යාල සම්මාන | ජාතික සම්මාන | ජාත්‍යන්තර |
|---|---|---|---|
| අධ්‍යාපන | 01 | - | - |
| ඉංජිනේරු තාක්ෂණ | කෘෂි කාර්මික සහ වැවිලි ඉංජිනේරු- 01 | කෘෂි කාර්මික සහ වැවිලි ඉංජිනේරු- 01 | |
| සෞඛ්‍ය විද්‍යා | - | 01 | 01 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | භාෂා- 01 | භාෂා - 01<br>සමාජ අධ්‍යයන - 01 | - |
| ස්වභාවික විද්‍යා | - | සත්ව විද්‍යා -03 | - |
| අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය | - | - | 01 |
| ප්‍රාදේශීය අධ්‍යාපන සේවා | - | - | 01 |

***33 වගුව: සම්මාන***

# 6 කොටස - මධ්‍යස්ථාන සහ ඒකක

## 6.0. මධ්‍යස්ථාන සහ ඒකක

## 6.1 ප්‍රාදේශීය අධ්‍යාපන සේවා

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් විවෘත හා දුරස්ථ ඉගෙනුම් මාධ්‍යය හරහා සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි දක්වා අධ්‍යයන වැඩසටහන් පිරිනමනු ලබයි. ප්‍රාදේශීය අධ්‍යාපන සේවා අංශය විසින් වැඩසටහන්වල පාඨමාලා ලබා දීම සඳහා යටිතල පහසුකම් හා ඉගෙනුම් සහාය සේවා සපයනු ලබයි.

නාවල, මධ්‍යම මණ්ඩපයේ පිහිටා ඇති ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන ලේකම් කාර්යාලය මධ්‍යම මණ්ඩපය හා ඉගෙනුම ලබන්නන් එකට යා කරයි. දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි ප්‍රාදේශීය මධ්‍යස්ථාන 09ක් හා අධ්‍යයන මධ්‍යස්ථාන 19ක් හරහා ශිෂ්‍යයාගේ දොරකඩ සමීපයෙහි හරවත් අධ්‍යාපන අවස්ථා සඳහා ඉඩකඩ සළසා ඇත. (රූපසටහන 1)




*රූපසටහන **2 :** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය ජාලය*

මෙම මධ්‍යස්ථාන ජාලය මඟින් තොරතුරු සැපයීම, ඉල්ලුම්පත්‍ර එකතු කිරීම හා ඉදිරිපත් කිරීම, ශිෂ්‍යයන් බඳවාගැනීම, උපදේශනය, පාඨමාලා ද්‍රව්‍ය බෙදාහැරීම, සැසි කළමනාකරණය එදිනෙදා පංති සහ විභාග

යනාදිය ඇතුලත් විවිධ සේවාවන් සපයනු ලබයි. කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයද ඇතුලුව විවෘත විශ්වවිද්‍යාලයේ මධ්‍යම මණ්ඩපය අක්කර 33ක් වූ භූමිභාගයක නාවල පිහිටුවා ඇත.

සබරගමුව පළාතේ ආධුනික ශිෂ්‍යයන්ගේ අධ්‍යනයමය අවශ්‍යතාවයන් සපුරාගත හැකිවන සේ 2017 වසරෙහි දී රත්නපුර අධ්‍යයන මධ්‍යස්ථානය ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ලෙස ඉහළ නැංවීමට හැකි විය. සෑම පළාතකම එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ විවෘත විශ්වවිද්‍යාල අරමුණ මෙමගින් සනාථ වී ඇත.

මාතලේ දිස්ත්‍රික්කයේ නව අධ්‍යයන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා පාලක සභා අනුමැතිය දැනටමත් ලැබී ඇති බව සඳහන් කළ යුතුය. මාතලේ නගරයේ ඉඩම් කොටසක් ඒ සඳහා වෙන් කරන ලද අතර මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම සිදුකරමින් පවතී. 2019 වර්ෂයේ මැද භාගයේදී මාතලේ අධ්‍යයන මධ්‍යස්ථානය උත්සවාකාරයෙන් විවෘත කිරීමට සැලසුම් කර ඇත. මෙම අධ්‍යයන මධ්‍යස්ථානය මාතලේ නගරයේ ස්ථාපිත කිරීමත් සමග සෑම දිස්ත්‍රික්කයකම එක් අධ්‍යයන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ අරමුණ ද ඉටු වනු ඇත.

2017 වර්ෂයේදී ලැබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, රත්නපුර හා බදුල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථාන සඳහා නව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. තවද, මන්නාරම හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක දෙකෙහි අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අක්කර 05ක භූමි ප්‍රමාණයක් වෙන් කරවා ගැනීමට එම දිස්ත්‍රික්ක දෙකෙහි ලේකම් කාර්යාල කටයුතු කර ඇත.

අනුරාධපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙහි ප්‍රධාන ගොඩනැගිල්ලට එකතු කරන ලද නව ගොඩනැගිල්ල සහ මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමද 2017 වසරෙහි මැද භාගයේදී සිදුවිය. ඉඩකඩ සහිත දේශන ශාලා, ශිෂ්‍ය රසායනාගාර හා නව සම්මන්ත්‍රණ ශාලා මගින් අනුරාධපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ධාරිතාව වර්ධනය කර ඇත.

මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙහි නව පුස්තකාල ගොඩනැගිල්ල ශිෂ්‍යයන් සඳහා බොහෝ පහසුකම් සපයනු ලබයි. සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීම හා ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ල විශාල කිරීම අවශ්‍ය අනුමැතිය සහිතව ඉක්මනින් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

බණ්ඩාරවෙල හා ගම්පහ අධ්‍යාපන මධ්‍යස්ථාන සහ කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයට අවශ්‍ය විභාග ශාලා සඳහා ඉල්ලීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. තවද මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයට නව බහු තට්ටු ගොඩනැගිලි සංකීර්ණයක් සඳහා ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

මහනුවර හා මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ශිෂ්‍යයන්හට තාවකාලික නේවාසික පහසුකම් සැපයීම සඳහා යෝජනාවක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර ඇත. දිවයින මුළුල්ලේම උසස් අධ්‍යාපන අවස්ථා පිවිසුම් ඉහළ නැංවීම සඳහා විවෘත විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පෘථුල කිරීමට ඉදිරිපත් කළ යෝජනාවක් මෑතක දී ගරු අග්‍රාමාත්‍යවරයා හා ගරු උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යවරයා සහභාගී වූ රැස්වීමක සාකච්ඡාවට බඳුන් වී ඇති බව වාර්තා විය.

## 6.2 පුස්තකාලය



ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය පුස්තකාල පද්ධතිය පුස්තකාල 9කින් සමන්විත වේ. එනම්, නාවල ප්‍රධාන විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පිහිටි ප්‍රධාන පුස්තකාලය සහ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, යාපනය, නුවර, කුරුණෑගල, මාතර සහ රත්නපුර පිහිටි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය ප්‍රාදේශීය මධ්‍යස්ථාන 8හි ප්‍රාදේශීය පුස්තකාල 8 වශයෙනි. ප්‍රධාන පුස්තකාලය, මාතර සහ නුවර මධ්‍යස්ථාන සතුව ඔවුන්ගේම ගොඩනැගිලි ඇත. පද්ධතිය සතු මුළු පොත් සංඛ්‍යාව 156047, වාර සටහන් නාමයන් - මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික දෙකෙහිම 31, විශ්වවිද්‍යාලය මගින් අනියුක්ත (subscribe) කර ඇති විද්‍යුත් සඟරා දත්ත සහ විද්‍යුත් ග්‍රන්ථ දත්ත 2, ශ්‍රව්‍ය-දෘශ්‍ය සම්පත් 3,223. මෙම සම්පත් හැර ඊ-ගබඩාව, ඩිජිටල් කියවීම් කාමර, ඩිජිටල් සම්පත් විවෘත ප්‍රවේශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සපයන ලද විශාල දත්ත ප්‍රමාණයක් වැනි පර්යේෂණ සහ විෂය සම්බන්ධ තොරතුරු සඳහා නිදහස් ප්‍රවේශ ලබා දෙන වෙබ් අඩවි ගණනාවක් ඇත. මෙම මාර්ගගත සම්පත් විශ්වවිද්‍යාල වෙබ් අඩවිය (http://lib.ou.ac.lk) හරහා පිවිසිය හැකි අතර සියළුම ප්‍රාදේශීය මධ්‍යස්ථාන පුස්තකාල වලින් ලබාගත හැක.

සාමාජිකයන් ලෙස මුළු පුස්තකාල පද්ධතියට සම්බන්ධිත පරිශීලකයන් 7961 කි. වසරකට ද්‍රව්‍ය සංසරණය වන ගණනය 32,314කි. වසරකට පුස්තකාලයට පැමිණීම් 77,843 කි. 2018 අතථ්‍ය පුස්තකාල පරිශීලකයන් සංඛ්‍යාව 164,000 ලෙස වාර්තා විය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල පුස්තකාල සේවාව විශ්වවිද්‍යාලීය සහ මාර්ගගත පරිශීලකයින්ට ලබාගත හැකිය. සපයන ලද ප්‍රධාන සේවාවන් වන්නේ පොත් සංසරණ සේවාවන් සහ ස්වයංක්‍රීය පුස්තකාල පද්ධතියක් හරහා පූර්ණ කාලීනව සක්‍රීය තොරතුරු විමසුම් සේවා: අධ්‍යයන විමසීම් සේවා- කවුන්ටරය මගින් සහ මාර්ගගතව: ලොව පුරා මූලාශ්‍ර හරහා ලේඛන බෙදාහැරීමේ සේවා; පරිගණක විද්‍යාගාර 2 හරහා අථත්‍ය සම්පත් ප්‍රවේශය: පරිගණක ප්‍රවේශය සමඟ සමූහ ඉගෙනුම් පහසුකම්: ලැප්ටොප් ණය සේවාව; සාකච්ඡා කාමර පහසුකම්; වායු සමීකරණය කරන ලද කියවීම් කාමර; ඉගෙනුම් ආධාරක වැඩසටහන් ආදිය.

මෙම පහසුකම් සැපයීම සඳහා විවිධ මට්ටමේ කාර්ය මණ්ඩලය ස්වයංක්‍රීය පරිසරයක වැඩ කිරීමේ ප්‍රවීණතාව ලබා ගැනීමට සහ දිවයින පුරා විසිරී ඇති විවෘත ඉගෙනුම් ජන සමාජයක් සඳහා සේවය කිරීම වෙනුවෙන් පුහුණු කර ඇත. තොරතුරු පාලනය කිරීම, ඉගෙනුම් සහ පර්යේෂණ සහය, මහජන සම්බන්ධතා පවත්වාගෙන යාම, ඉලෙක්ට්‍රොනික් හා වෙබ් මූලික සේවා නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම, හැසිරවීම සහ වෘත්තිය හා සමාජ උත්සව ආදිය සඳහා ඔවුන් විශේෂයෙන් පුහුණු කර ඇත. කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය ද ඇතුළුව මුළු පුස්තකාල පද්ධතියේ කාර්ය මණ්ඩලය සංඛ්‍යාව 51 කි.

## 6.3 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය




ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යයන සහ පරිපාලන වැඩකටයුතු වලට සහාය ලබා දීම අරමුණු කරගෙන පිහිටුවන ලදි. විශ්වවිද්‍යාලයේ ඵලදායී සේවකයන් ලෙස වැඩකටයුතු කිරීම සඳහා අවශ්‍ය වන හැකියාවන් සහ යෝග්‍යතාවන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන විවිධ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පහසුකම් සපයයි.

අධ්‍යයන කාර්ය මණ්ඩල සහ අනධ්‍යන යන සියළුම වර්ගවල කාර්ය මණ්ඩලයට වැඩමුළු පැවැත්වීම සිදු කරයි. මෙහිදී ලබා දෙන වැඩමුළු වල පරාස වැඩකරන පරිසරයේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම පමණක් නොව පුද්ගල වර්ධනයට සහ ජීවිතයේ සහ වැඩකරන ස්ථානයේ වැඩකටයුතු සමබර කර ගැනීමට සහාය ලබා දෙයි. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධානතම වැඩසටහන වන්නේ පරිවාස මට්ටමේ සිටින කථිකාචාර්යවරුන්ට පවත්වන උසස් අධ්‍යාපන ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාවයි. සියලුම පරිවාස කථිකාචාර්යවරුන්, කාර්ය මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ ස්ථිර කිරීම සඳහා උසස් අධ්‍යාපන ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් උසස් අධ්‍යාපන ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන් 4ක් සාර්ථකව සම්පූර්ණ කර තිබේ. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ට පවත්වන ප්‍රේරණ වැඩසටහන වෙනත් විශ්වවිද්‍යාලවල පවා ඇගයීමට ලක් වූ වැඩසටහනකි.



සේවක හවතුන්ගේ භාෂා කුසලතාව වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වාර්ෂිකව බොහෝ වැඩසටහන් පවත්වනු ලබයි. Toastmaster Speech Craft වැඩසටහන, අධ්‍යයන රචනා වැඩසටහන්, විශ්වවිද්‍යාලීය දෙමළ සහ ඉංග්‍රීසි සේවක හවතුන් ආවරණය වන සන්නිවේදන වැඩසටහන් එවැනි වැඩසටහන් කිහිපයක් වේ. මානසික සුබසිද්ධිය සඳහා අභිප්‍රේරණ වැඩසටහන් සහ උපදේශන වැඩමුළු ද වාර්ෂිකව සිදු කෙරේ. මෙම සියළුම වැඩමුළු සහ වැඩසටහන් සමගින් පාර්ශවකරුවන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය බලාපොරොත්තු වේ.





2018 වර්ෂය අතරතුර, කාර්ය මණ්ඩල මධ්‍යස්ථානය විසින් සියළුම කාර්ය මණ්ඩල වලට වැඩමුළු 30ක් පවත්වන ලදි. සේවක හවතුන් විශාල ප්‍රමාණයක් සියළුම වැඩසටහන් සඳහා සහභාගී වී ඇති අතර 50% ක් පමණ විශ්ව විද්‍යාල සේවකයින් සිය දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කර ගැනීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයෙන් ප්‍රතිලාභ ලබා තිබීම සතුටට කරුණකි.





## 6.4 වෘත්තීය උපදේශන ඒකකය



වෘත්තීය උපදේශන ඒකකය පීඨය හා එක්ව ශිෂ්‍යයන්ගේ හැකියාවන්, අභිලාෂයන්, බලාපොරොත්තු මත පදනම්ව ඵලදායි රැකියා අවස්ථා සඳහා මග පෙන්වීමට වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලබයි. රාජ්‍ය හා පුද්ගලික යන අංශ දෙකෙහිම අනාගත සේවායෝජකයින්ට අවශ්‍ය දැනුමෙන්, කුසලතාවයෙන්, ආකල්පවලින්, අභිප්‍රේරණය මගින් විද්‍යාර්ථීන් පුහුණු කරමින් මෙය සාක්ෂාත් කරගැනීම අරමුණයි.

### 2018 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වෘත්තීය උපදේශන ඒකකය මගින් පවත්වන ලද ක්‍රියාකාරකම්

- මාර්තු - පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව
- මැයි සිට ජූලි - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී ශිෂ්‍ය අධ්‍යයන සූදානම් පුහුණුව (StART@OUSL - පළමු වටය)
- ඉහත ත්‍රෛමාසික පුහුණු වැඩසටහන යටතේ අනිවාර්ය පාඨමාලා 2ක් වෛකල්පිත පාඨමාලාවක් විද්‍යාවේදී උපාධිය සඳහා සහ ඉංජිනේරු තාක්ෂණ උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සියළුම ශිෂ්‍යයන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලදි.
- ජූනි - ජීව දත්ත ලිවීම පිළිබඳ වැඩමුළුව, සාකච්ඡා වලට මුහුණ දීම සහ සේවායෝජකයාගේ අපේක්ෂා පිළිබඳ වැඩමුළුව.
- ජූලි- අධ්‍යාපනය සඳහා ගූගල් හඳුන්වාදීම පිළිබඳ වැඩසටහන
- සැප්තැම්බර් - අධ්‍යයන ලිවීම පිළිබඳ වැඩමුළුව
- ඔක්තෝබර් සිට 2019 ජනවාරි දක්වා - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී ශිෂ්‍ය අධ්‍යයන සූදානම් පුහුණුව (StART@OUSL - දෙවන වටය)
- ඉහත ත්‍රෛමාසික පුහුණු වැඩසටහන යටතේ අනිවාර්ය පාඨමාලා 2ක් වෛකල්පිත පාඨමාලාවක් BMS, BA සහ සෞඛ්‍ය විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලදි.
- ඔක්තෝබර් - ශිෂ්‍ය ගුරුවරුන් සඳහා ගුරු සංවර්ධනය පිළිබඳ වැඩමුළුව

## 6.5 මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය හරහා දැනුම ලබා දීමට හා ව්‍යාප්ත කිරීම සඳහා පිහිටුවා ඇත. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ අනුග්‍රහය සහිතව ශිෂ්‍යයන්ට පාඨමාලා ද්‍රව්‍ය ලබා දීම සඳහා 1982 වර්ෂයේදී විශ්ව විද්‍යාලය තුළ මුද්‍රණාලය පිහිටුවන ලදි.

පීඨ 5 මගින් පවත්වනු ලබන නොයෙක් පාඨමාලා සඳහා 35,000 කට අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් විශ්ව විද්‍යාලය තුළ ලියාපදිංචි වී ඇත. මීට අමතරව, පරිපාලන අංශ සඳහා අවශ්‍ය විවිධ ලිපි ද්‍රව්‍ය සහ වෙනත් ලිය කියවිලි මුද්‍රණය කිරීම ද මුද්‍රණාලය විසින් සිදු කරයි.

තවද, උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ අනුමැතිය සහිතව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වෙනත් විශ්ව විද්‍යාල සහ වෙනත් රාජ්‍ය ආයතන විසින් ඉල්ලා ඇති ද්‍රව්‍ය මුද්‍රණය කිරීම මුද්‍රණාලය විසින් බාරගෙන ඇත.

**මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලද පාඨමාලා ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය - 2018**

| | පාඨමාලා ද්‍රව්‍ය පිටපත් සංඛ්‍යාව | පාඨමාලා අත්පොත් පිටපත් සංඛ්‍යාව | වෙනත් ද්‍රව්‍ය පිටපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| ජනවාරි | 43,021 | - | 200 |
| පෙබරවාරි | 21,122 | 202 | 445,082 |
| මාර්තු | වැඩ වර්ජන කාලසීමාව | | |
| අප්‍රේල් | 16,048 | - | 54,732 |
| මැයි | 38,308 | 1,040 | 24,144 |
| ජුනි | 68,853 | 13,996 | 666,333 |
| ජුලි | 33,947 | - | 829,132 |
| අගෝස්තු | 30,345 | 2,560 | 414,632 |
| සැප්තැම්බර් | 49,476 | 1,436 | 173,722 |
| ඔක්තෝබර් | 57,015 | 4,190 | 171,681 |
| නොවැම්බර් | 21,454 | 190 | 129,017 |
| දෙසැම්බර් | 22,489 | 70 | 25,518 |
| **එකතුව** | **402,078** | **23,684** | **2,934,193** |

**උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථාන කාර්ය භාරය**

| විස්තරය | පිටපත් |
|---|---|
| විශ්වවිද්‍යාල දින දර්ශනය - නැගෙනහිර විශ්වවිද්‍යාලය | 200 |
| කළමනාකරණ මාර්ගෝපදේශ I කොටස - නැගෙනහිර විශ්වවිද්‍යාලය | 300 |
| කළමනාකරණ මාර්ගෝපදේශ II කොටස - නැගෙනහිර විශ්වවිද්‍යාලය | 300 |
| උපාධි සහතිකය - රුහුණු විශ්වවිද්‍යාලය | 1986 |
| රන් පදක්කම් සහතිකය - රුහුණු විශ්වවිද්‍යාලය | 72 |
| 2018 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේ උපාධිධාරීන්ට යැවිය යුතු ලිපිය | 1500 |
| IMechE ආරාධනා පත්‍රය | 40 |
| IMechE ශිෂ්‍ය පරිච්ඡේදය (A3) | 50 |
| IMechE ශිෂ්‍ය සිදුවීම් නිවේදනය | 50 |
| ආර්.කේ.ඩබ්ලිව් ගුණසේකර අනුස්මරණ දේශනයේ ආරාධනය | 350 |
| ආර්.කේ.ඩබ්ලිව් ගුණසේකර අනුස්මරණ දේශන ග්‍රන්ථය | 300 |
| වෘත්තීය සමිති වාර්ෂික වාර්තාව | 130 |
| LLM ශිෂ්‍ය ලොග් පොත | 200 |

## 6.6 ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ 2018 දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය පිහිටුවන ලදි. මෙය 2015 මාර්තු මස විශ්වවිද්‍යාලයට පවරන ලදි. අපගේ දැක්ම වන්නේ ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපනයේ සහ දිවයිනෙන් පිටත ප්‍රමුඛපෙලේ පහසුකම් සපයන්නා බවට පත් වීමයි.

එම දැක්ම සමඟ, මාර්ගගත අධ්‍යාපනයට සහය දැක්වීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය පහත සඳහන් පහසුකම් වලින් සමන්විත වේ.

- මාර්ගගත අන්තර්ගත සංවර්ධනය සහ කළමනාකරණය
- වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම්
- මාර්ගගත විභාග
- වැඩමුළු සහ පුහුණුව

2015 සිට 2018 දක්වා ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය විසින් මුහුණ දෙන ලද ප්‍රවර්ධන ගැටළු තිබූ අතර දැනට ඒවා විසඳමින් පවතී. 2019 වර්ෂයේදී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වීමට සහ පිහිටුවන ලද අරමුණ වෙනුවෙන් සේවය කිරීමට අපේක්ෂා කරයි.

## 6.7 ජාත්‍යන්තර සබඳතා ඒකකය

ජාත්‍යන්තර සබඳතා ඒකකය 2013 ඔක්තෝබර් මස ස්ථාපිත කරන ලදී. එය සංශෝධිත 1990 අංක 01 දරන විවෘත විශ්ව විද්‍යාල ආඥාපනතේ 19 වන කොටස සමඟ කියවිය යුතු 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 135 කොටස යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2016 අංක 9 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වේ.

ජාත්‍යන්තර සබඳතා අංශය උපකුලපතිගේ සෘජු අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂවරයෙකුගේ මෙහෙයවීම මත ක්‍රියාත්මක වේ. එහි පරිපාලන සහ මූල්‍ය කටයුතු කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ජාත්‍යන්තර සබඳතා අංශයේ අධ්‍යක්ෂ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රඥයෙක් වන අතර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හෝ ඊට ඉහළ මට්ටමේ පුද්ගලයෙක් වන අතර උපකුලපතිගේ නිර්දේශය මත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය මත පත් කරනු ලබයි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ලොව පිළිගත් මට්ටමේ අධ්‍යාපනයක් සහ පර්යේෂණ ලබා දීමට කැපවී සිටින අතර පූර්ණ සහ ගතික විශ්ව විද්‍යාල අත්දැකීමක් සහ ශක්තිමත් ජාත්‍යන්තර සබඳතාවන් හරහා උසස් දැනුමක් ලබා ගැනීමට අවස්ථාව සළසා දෙයි.

ආයතනයේ වර්ධනය වන අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට ප්‍රමාණවත් පීඨ සහ ආයතනික මට්ටමේ ගිවිසුම් තිබෙන බව තහවුරු කිරීමට ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය අපේක්ෂා කරයි. ජාත්‍යන්තර සබඳතා උපායමාර්ග සකස් කර ගැනීමේ දී සහ ලෝකයේ ඇති වෙනත් විශ්වවිද්‍යාල හෝ අනෙකුත් ආයතන සමඟ විධිමත් සබඳතා පාර්ශ්වකාරිත්වයන් ඇතිකර ගැනීමේදී ජාත්‍යන්තර සබඳතා අංශය විශිෂ්ට උපදෙස් සැපයීම සහ මගපෙන්වීම සිදු කරයි.

ජාත්‍යන්තර සබඳතා අංශයේ අරමුණු පහත සඳහන් වේ.

(අ) ආයතන, පීඨ, සනාතන සභාව සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ පාලක සභාව.

(ආ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විදේශ ආයතන සමඟ ඇතිකරගන්නා විධිමත් ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික එකඟතාවන් සහ සන්දේශයන් සකස් කිරීම සහ සමාලෝචනය කිරීම සම්බන්ධීකරණය කිරීම. (මෙතැන් සිට අවබෝධතා ගිවිසුම් ලෙස සඳහන් වන)

(ඇ) ශිෂ්‍යයන්ට සහ කාර්ය මණ්ඩලයට තම දායකත්වයන් ගෝලීය වශයෙන් සහයෝගීව ක්‍රියා කිරීම ට සහ බෙදාහදා ගැනීමට අවස්ථාව සළසා දීම.

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ට විදේශ රැකියා අවස්ථා සොයාගැනීමට යොමු කිරීම.

(ඉ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට ජාත්‍යන්තරව පිළිගත් පර්යේෂණ සහ ගුරුවරු සකස් කර ගැනීමට අවශ්‍ය අවස්ථාවන් තහවුරු කර දීම.

(ඊ) ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සහ ආර්ථිකයට දායකත්වය දක්වන වැදගත් පර්යේෂණ සහ ව්‍යාපෘති ජාත්‍යන්තරව ආරම්භ කිරීමට සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට සහාය දීම.

(උ) විදේශීය ශිෂ්‍යාන්ට , ගුරුවරුන්ට සහ අනෙකුත් අමුත්තන්ට ඔවුන් ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නැවතී සිටින කාලය තුළ අවශ්‍ය සහාය ලබා දීම.

(ඌ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වැඩසටහන් විදේශවල ප්‍රවර්ධනය කිරීම සහ සබඳතා ගොඩනගාගැනීම.

(එ) ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ රාජ්‍ය තාන්ත්‍රික දූත කණ්ඩායම් සහ විදේශ වල සිටින ලාංකීය දූත කණ්ඩායම් සමඟ සබඳතා සම්බන්ධීකරණය කිරීම.

ඉහත අරමුණු ළඟා කර ගැනීමේදී ජාත්‍යන්තර සබඳතා අංශය 2013 සිට 2018 දක්වා පසුගිය වසර පහක කාලය තුළ ක්‍රියාකාරකම් බොහොමයක සක්‍රිය ලෙස දායක විය. පහත සඳහන් වන්නේ 2018 වසර තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් වල කෙටි සාරාංශයකි.

**ජාත්‍යන්තර සබඳතා ඒකකයේ ක්‍රියාකාරකම් - 2018**

**2018 වසරේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්**

| අනු අංකය | ආයතනයේ නම | රට |
|---|---|---|
| 01 | නිව් මෙක්සිකෝ විශ්වවිද්‍යාලය | ඇමරිකා එක්සත් ජනපදය |

**සංවිධානය කරන ලද සහ පවත්වන ලද විශේෂ දේශන**

| | විශේෂිත දේශන මාතෘකාව | ඉදිරිපත්කරන ලද්දේ | විශ්වවිද්‍යාලය |
|---|---|---|---|
| 01 | Microbiome, වෛද්‍ය විද්‍යාවේ අනාගතය | ආචාර්ය ජානකී ලේල්වල ගුරුගේ | වොෂින්ටන් විශ්වවිද්‍යාලය - ඇමරිකා එක්සත් ජනපදය |
| 02 | ආපදා අධ්‍යාපනය සහ පර්යේෂණ කේන්ද්‍රීකරණය පිළිබඳ විවෘත හා දුරස්ථ ඉගෙනීම | කොන්දොකෙර් මොකඩ්ඩෙම් හොසේන්, PhD | උපකුලපති - බංගලාදේශ විවෘත විශ්වවිද්‍යාලය<br>ආපදා කළමනාකරණ සහ අවදානම් අධ්‍යයන ආයතනයේ ආරම්භක සහ මහාචාර්ය<br>සමාජ විද්‍යාව පිළිබඳ හිටපු මහාචාර්ය<br>ඩකා විශ්වවිද්‍යාලය |
| 03 | මනෝවිද්‍යාව පිළිබඳ ආචාරධර්ම : ගෝලීය හා ශ්‍රී ලාංකික සමාජය | මහාචාර්ය.ජීන් මරේසෙක් | ස්වාත්මෝර් විදුහල - Liberal arts<br>පෙනිසිල්වේනියාවේ, ස්වාත්මෝර් පිහිටි විදුහලකි<br>ඇමරිකා එක්සත් ජනපදය |
| 04 | විප්ලවීකරණය වන දර්ශනය හා අභ්‍යාස අධ්‍යාපනය හා විද්‍යාව | ආචාර්ය .රජීව් ජන්ග්‍යානි | ක්වන්ට්ලෙන් පොලිටෙක්නික් විශ්වවිද්‍යාලය -කැනඩාව |

**2018 ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පහසුකම් සපයන ලද - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී පවත්වන ලද විදේශීය වැඩමුළු**

| | වැඩමුළුවේ නම | නියෝජිතයන් | අනුබද්ධිත ආයතනය |
|---|---|---|---|
| 01 | මෝස්තර හා සංවර්ධනය පිළිබඳ CEMCA වැඩමුළුව | මහාචාර්ය.සොම් නයිදු හා ආචාර්ය. මනස් පණිග්‍රාහී | ආසියාව සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය අධ්‍යාපනික මාධ්‍ය මධ්‍යස්ථානය (CEMCA) ඉන්දියාව |
| 02 | ප්‍රාදේශීය ධාරිතා සංවර්ධනය ආසියානු හා පැසිෆික් පාරිසරික හා දේශගුණික විපර්යාස නීති සඳහා තාක්ෂණික සහාය ධාරිතාව ශක්තිමත් කිරීම. | දකුණු ඉන්දියානු 31 | ආසියානු සංවර්ධන බැංකුව |

**විදේශීය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී පවත්වන ලද වැඩමුළු**

| | වැඩමුළුවේ නම | නියෝජිතයන් | අනුබද්ධිත ආයතනය |
|---|---|---|---|
| 01 | හොංකොං විවෘත විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සමග ශිෂ්‍ය හුවමාරු සැසිය | ශිෂ්‍යයන් 30 | හොංකොං විවෘත විශ්වවිද්‍යාලය |
| 02 | විශ්වවිද්‍යාල චාරිකාව සඳහා මාලදිවයිනේ ශාස්ත්‍රපති සිසුන් | ශිෂ්‍යයන් 15 | AVIC විද්‍යාල - මාලදිවයින |

**2018 ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පහසුකම් සපයන ලද - බාහිර පර්යේෂණ ශිෂ්‍යයන්**

| | ශිෂ්‍ය සංඛ්‍යාව | අනුබද්ධිත විදේශීය විශ්ව විද්‍යාලය | ආරම්භක රට | කාල සීමාව |
|---|---|---|---|---|
| 01 | 7 | ලියුවන් සහ ලිම්බර්ග් විශ්ව විද්‍යාලය - බෙල්ජියම | බෙල්ජියම | මාස 6<br>(2018 නොවැ -2019 අප්‍රේ) |






**2018 ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පහසුකම් සපයන ලද - ක්‍රමවත් පාඨමාලා සඳහා විදේශීය ශිෂ්‍යයන්**

| | ශිෂ්‍ය සංඛ්‍යාව | වැඩසටහන | ආරම්භක රට | කාලසීමාව |
|---|---|---|---|---|
| 01 | 01 | පොදුරාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාර පරිපාලන/ රාජ්‍ය පරිපාලන විධායක ශාස්ත්‍රපති උපාධිය | මාලදිවයින | වසර 2 |
| 02 | 01 | ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය | මාලදිවයින | මාස 15 |
| 03 | 01 | යොවුන් සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව | පිලිපීනය | වසර 2 |

**2018 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය කාර්ය මණ්ඩලය සඳහා විදේශීය නිරාවරණ පුහුණුව**

| | විස්තරය | කාර්ය මණ්ඩල සංඛ්‍යාව | විශ්වවිද්‍යාලය | කාල සීමාව |
|---|---|---|---|---|
| **01** | දකුණු ඉන්දියානු විශ්වවිද්‍යාල වෙත විදෙස් නිරීක්ෂණ සංචාරය - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩලය | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩලය 10 | 1.අන්නා විශ්වවිද්‍යාලය<br>2. වෙල්ලෝර් තාක්ෂණ ආයතනය<br>3. භාරතීදාසන් විශ්වවිද්‍යාලය | 2018.03.04 – 2018.03.10 |
| **02** | සහකාර අධ්‍යක්ෂවරු සහ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා අධ්‍යක්ෂ සඳහා විදෙස් පුහුණුව, වවසන් විවෘත විශ්වවිද්‍යාලය - මැලේසියාව | සහකාර අධ්‍යක්ෂවරු සහ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා අධ්‍යක්ෂ 14 | වවසන් විවෘත විශ්වවිද්‍යාලය - මැලේසියාව | 2018.04.08 - 2018.04.12 |
| **03** | කළමණාකාර පරිපාලන යෝග්‍යතා සංවර්ධන වැඩසටහන පිළිබඳ විදෙස් නිරාවරණ පුහුණුව | පරිපාලන විධායක නිලධාරීන් 15 | පුත්‍රා විශ්වවිද්‍යාල - මැලේසියාව | 2018.12.02-2018.12.08 |

**විදෙස් විද්‍යාර්ථීන් 2018 දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළ සංචාරය**

| | විස්තරය | විද්වතාගේ නම | විශ්වවිද්‍යාලය |
|---|---|---|---|
| **01** | ආපදා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති අධ්‍යයන පටිපාටිය සංවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡාව. | කොන්දොකෙර් මොකඩ්ඩෙම් හොසේන්, PhD | උපකුලපති බංගලාදේශ විවෘත විශ්වවිද්‍යාලය |
| **02** | ශාස්ත්‍රීය හා පර්යේෂණ සහයෝගීතාව සඳහා හැකි අකාරයේ වැඩ පිළිවෙලක් සකස් කිරීම, විශේෂ ශාස්ත්‍රීය වැඩසටහන් හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සංවර්ධනය කිරීම හා සම්පාදනය කිරීම. | ආචාර්ය.බර්නෙට් මකන්දවීර් | මලාවි විශ්වවිද්‍යාලය |

**2018 ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පහසුකම් සපයන ලද වෙනත් අවස්ථා**

| | විස්තරය | කාල සීමාව |
|---|---|---|
| 01 | චීන නියෝජිතයන්ගේ සංචාරය (චීන විශ්වවිද්‍යාල 16) | 2018 පෙබරවාරි 5 |
| 02 | විශේෂ අධ්‍යාපන කෙටි පාඨමාලාව ප්‍රදානය කිරීම ආරම්භ කිරීම MI College මාලදිවයින | 2018 අගෝස්තු 3 |
| 03 | විවෘත විශ්වවිද්‍යාල ආසියානු සංගමයේ **34** වන වාර්ෂික සමුළුවේ සත්කාරකත්වය සැපයීම සඳහා **BID** යෝජනාව ඉදිරිපත් කිරීම (AAOU 2020) | 2018 ඔක්තොබර් 23 |
| 04 | විවෘත විශ්වවිද්‍යාල ජාත්‍යන්තර පර්යේෂණ සැසි සඳහා ප්‍රධාන කථිකයන්ට පහසුකම් සැලසීම .(iOURS) | 2018 නොවැ 29–30 |







## 6.8 ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය

2018 ජනවාරි - දෙසැම්බර් කාල පරිච්ඡේදය අතරතුර ව්‍යාපාර සම්බණ්ධීකරණ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ආරම්භ කර සහ/හෝ පවත්වාගෙන ගොස් ඇත.

**(අ) පේටන්ට් අයදුම්පත්‍ර ගොනු කිරීම සඳහා සහය දැක්වීම**

මේ වන විට ව්‍යාපාර සමබන්ධීකරණ මධ්‍යස්ථානය පේටන්ට් අයදුම්පත්‍ර 7ක් ගොනු කිරීමට සහය දක්වා ඇති අතර ඒ සඳහා  පහසුකම් සපයන අතරම පේටන්ට් අයිතිය පිළිබඳ වාර්තා ද සතුව ඇත.

**(ආ) ගෘහස්ථ සැරසිලි සඳහා අලංකරණ ඕකිඩ් පැළ සංවර්ධනය**

අලංකරණ ඕකිඩ් ව්‍යාපෘතියේ අරමුණ වන්නේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ ආචාර්ය.දර් ශනී වීරහේවා විසින් ක්‍රියාත්මක කරන පර්යේෂණය වාණිජකරණය කිරීමයි. LED ආලෝකකරණය සහ වාෂ්පකරය භාවිතයෙන් අලංකරණ ගෘහස්ථ පැළ සඳහා වාණිජකරණ මූලාකෘතියක් ගොඩ නැගීම මෙම ව්‍යාපෘතියේ අභිප්‍රාය වේ.




**(ඇ) නවෝත්පාදන ආහාර නිෂ්පාදන**

අප විසින් කෘෂිකාර්මික හා වැව්ලි ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ නවෝත්පාදන ආහාර නිෂ්පාදන සංවර්ධනය කිරීම සිදු කරයි.

(i) පෝෂ්‍යදායී ආහාරයට ගත හැකි පිඟන් කෝප්ප සහ හැඳි ගැරුප්පු




(ii) ජංගම දුරකථනය මගින් පාලනය වන වැඩසටහන් ගත කළ හැකි උණුසුම්/ සිසිල් ස්මාර්ට් කෑම පෙට්ටිය



පේටන්ට් නාමය : "ජංගම දුරකථන යෙදුමක් මගින් පාලනය වන සිසිල් ජල ස්මාර්ට් කෑම පෙට්ටිය දියුණු කිරීමට ක්‍රමයක්." කෙටි පණිවිඩයකින් ලබාදෙන විධානයක් මගින් කෑම පෙට්ටිය සිසිල් හෝ උණුසුම් වේ.

(iii) වියළි ආහාර

ආහාර වෙළඳ පොළේ වියළි ආහාර නිෂ්පාදන සඳහා වන එන්නත ලබා දෙන ලද අතර වර්ෂය අතරතුර අතිරික්ත ආහාර සැපයුම සඳහා ද විසඳුම් සලසන අතරම වියළි ආහාර ද්‍රව්‍ය සකස් කිරීමට පර්යේෂණ ක්‍රියාත්මක වේ.





(iv) "කොස්කටු" භාවිතයෙන් සකස් කරන ලද කට්ලට්

මෙම නිෂ්පාදනය "කොස්කටු" භාවිතයෙන් සකස් කරන ලද කට්ලට් වර්ගයකි. මෙය මාළු කට්ලට් හා සමාන රසයකින් යුක්ත වේ. පේටන්ට් අයදුම්පත්‍ර ගොනු කර ඇති අතර ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය මෙම තාක්ෂණය අලෙවි කිරීම සඳහා සාකච්ඡා සිදු කරමින් පවතී.

**(ඇ) ක්ෂේත්‍ර චාරිකා**

සහල් වර්ගවල ද්‍රව්‍ය භාවිතයෙන් සකස් කරන ලද නවෝත්පාදන ආහාර නිෂ්පාදන වාණිජකරණය කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අප Packaging Material (PVT) Ltd හි සංචාරයක නිරත විය. අවසාන පාරිභෝගිකයාගේ අවශ්‍යතා සඳහා නවෝත්පාදන නවීකරණය කිරීමට සහ නව නිපැයුම්කරුවන්ට රාමුවෙන් පිට සිතීමට සහයෝගයක් ලැබෙන ව්‍යාපාරයේ අවශ්‍යතා හඳුනා ගැනීමට මෙය මහඟු අවස්ථාවක් විය. පර්යේෂණ ක්ෂේත්‍රය තවදුරටත් පුළුල් කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි අවස්ථා අප විසින් හඳුනාගන්නා ලදි. නිෂ්පාදනය පුළුල් පරාසයක් මත අලෙවි කිරීම සඳහා තොරතුරු සොයා ගැනීමට මහඟු අවස්ථාවක් අපට හිමි වූ අතර එය පර්යේෂකයන්ට අභිප්‍රේරණ සැසියක් විය.



**තාක්ෂණික නැඹුරුව පිළිබඳ සම්මන්ත්‍රණ**

නව තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ දැනුවත්භාවය හා උපදේශනය සැපයීම වෙනුවෙන් තාක්ෂණික සාකච්ඡා මාලාවක් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලදි.

(අ) "Blockchain" සම්මන්ත්‍රණය ජූලි 05 දින ස්වභාවික විද්‍යා පීඨයේ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ.



(ආ) "Fintech හැඳින්වීම" පිළිබඳ සම්මන්ත්‍රණය

සැප්තැම්බර් 27 දින පෙ.ව 11.00ට ඉංජිනේරු තාක්ෂණ පීඨයේ සභා ශාලාවේදී Fintech තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය පැවැත්විණ.





(ඇ)"ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලිය සහ නිෂ්පාදන වාණිජකරණය" පිළිබඳ සම්මන්ත්‍රණය





**ව්‍යවසායකත්ව වැඩසටහන**

2016 සිට ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලීය ශිෂ්‍යයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කණ්ඩායම් 3 සඳහා ආරම්භක ව්‍යවසායකත්ව කෙටි පාඨමාලාවක් සැලසුම් කර ඉදිරිපත් කර ඇත.

## Open AgroHack'19

2019 පෙබරවාරි 22 සහ 23 දිනවල විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ Hackathon පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ. Hackathon සංකල්පය, වැඩසටහනේ පාර්ශවකරුවන්, පවත්වන ස්ථානය හා අභිප්‍රාය ආදි කටයුතු මේ වන විට අවසන් කර තිබේ. අනුරාධපුරය වෙත සිද්ධාන්ත සොයා යෑමේ සංචාරයක් 2019 ජනවාරි 9 වන දින සිදු කිරීමට නියමිත අතර පාලන කමිටුවේ සාමාජිකයින් සහ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය මෙම මෙහෙවර සඳහා සහභාගි වනු ඇත. කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ගැටළු Hackathon හිදී සාකච්ඡා කෙරෙනු ඇති අතර එහිදී කෘෂි කර්මාන්තය තුළ හඳුනාගත් ක්ෂේත්‍රයක් වෙනුවෙන් විසඳුම් ලබා දෙනු ඇත. අනුග්‍රාහකයින් විසඳුම මිලදී ගැනීම හෝ විසඳුම සපයන්නාට ව්‍යවසායකයෙක් බවට පත්වීම වෙනුවෙන් මූල්‍ය ආධාර ලබා දීම සිදු කරනු ලැබේ. කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ ගැටළු සඳහා විසඳුම් සෙවීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පවත්වන ප්‍රථම Hackathon මෙය වේ. විශ්වවිද්‍යාල වෙත මේ සඳහා ආරාධනා එවනු ලබන අතර ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය මෙයට අනුග්‍රාහකයන් සොයා ගැනීම වෙනුවෙන් කටයුතු කරනු ලැබේ

**පර්යේෂණ පරිගණක දත්ත ගබඩාව හා පර්යේෂණ ආකෘතිය සැකසීම**

කාර්ය මණ්ඩල පර්යේෂණ ආකෘතිය, කාර්ය මණ්ඩල ව්‍යාපෘති විස්තර සහ අවසන් වසර ශිෂ්‍ය ව්‍යාපෘති සමබන්ධ සියළුම තොරතුරු සංසන්දනය කිරීමට ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය දත්ත ගබඩාවක් සකස් කරමින් සිටී. තොරතුරු එකතු කිරීමෙන් සහ ගබඩා කිරීමෙන් පසු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය පර්යේෂණ බලපත්‍ර ගතකිරීම හා/හෝ වාණිජකරණය කිරීමේ හැකියාව ගවේශනය කිරීමට ව්‍යාපාර සමග සාකච්ඡා ආරම්භ කිරීමට ව්‍යාපාර සමබන්ධීකරණ මධ්‍යස්ථානය සැළසුම් කරමින් සිටී. මෙය විශ්වවිද්‍යාල- ව්‍යාපාර සහයෝගිතා ව්‍යාපෘති ආරම්භයට පහසුකම් සපයයි.

**නවෝත්පාදන මධ්‍යස්ථානය ඉදි කිරීම හා උපකරණ මිලදී ගැනීම**

CRC ගොඩනැගිල්ලට යාබද ගොඩනැගිල්ලේ සෞඛ්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පෙර භාවිතා කරන ලද දැනට භාවිතා නොකරන කාමර කිහිපයක් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් හඳුනාගෙන ඇත. උපකරණ අළුත්වැඩියා කිරීම සහ මිලට ගැනීම සඳහා AHEAD ප්‍රතිපාදන හරහා අරමුදල් වෙන් කර තිබේ. මධ්‍යස්ථානය උසස් වටිනාකමකින් යුත් උපකරණවලින් සමන්විත වේ.

AHEAD ව්‍යාපෘතියෙන් ලැබූ රුපියල් මිලියන 10ක ප්‍රතිපාදන නවෝත්පාදන මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා යොදා ගැනීමට භාවිතා කරනු ලැබේ. සම්පූර්ණයෙන් ස්ථාපිත කළ පසු මධ්‍යස්ථානයේ අපේක්ෂිත වාර්ෂික ආදායම රුපියල් මිලියන 1ක් වශයෙන් තක්සේරු කර ඇත. ප්‍රථම අදියර යටතේ රුපියල් මිලියන 4ක ප්‍රතිපාදන ලැබුණු අතර 34 කොටසේ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය සඳහා තෝරාගෙන ඇත. ලේසර් කැපීමේ උපකරණ, 3D මුද්‍රණ යන්ත්‍ර සහ සෙසු අවශ්‍ය උපකරණ ආදිය මධ්‍යස්ථානය සඳහා මිළදී ගනු ලැබේ. නවෝත්පාදන මධ්‍යස්ථානය සඳහා වන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට ආචාර්ය. එච්.ජී.පී.ඒ රත්නවීර ව්‍යාපාර සමබන්ධීකරණ මධ්‍යස්ථානය සමඟ එක්ව කටයුතු කරයි.

## 6.9 අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය






ස්වයං උපදේශන පාඨමාලා ද්‍රව්‍ය සැලැසුම් කිරීම සඳහා මඟපෙන්වමින් ද, අධ්‍යාපනික මාධ්‍යය සැළසුම් කිරීම හා සංවර්ධනය කිරීම, පාඨමාලා ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහතික කිරීම යනාදිය මඟින් අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය විවෘත විශ්වවිද්‍යාලයේ විශාල කාර්යභාරයකට උර දී සිටී. තවද සියලුම පීඨවල පාඨමාලා හා පාඨමාලා ද්‍රව්‍ය, (මාර්ගගත පාඨමාලා ද ඇතුළුව) සපයමින් සේවා සපයන ආයතනය ලෙස කටයුතු කරයි. මෙම මධ්‍යස්ථානය මගින් නිර්මාණය කරන ලද අධ්‍යාපනික වීඩියෝ පට සඳහා ජපානය, ඉරානය, යන රටවල් හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් ජාත්‍යන්තර සම්මාන 9ක් ලබාගෙන ඇත.

මෙම මධ්‍යස්ථානය ප්‍රධාන ඒකක දෙකකින් සමන්විත වේ. එනම් අධ්‍යයන හා පර්යේෂණ ඒකකය සහ නිෂ්පාදන ඒකකයයි (මාධ්‍යය නිවස).

**අධ්‍යයන හා පර්යේෂණ ඒකකය**

- මාර්ගෝපදේශනය සැළසීම, පාඨමාලා සැලසුම් කිරීම හා සංවර්ධනය සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමත් (මුද්‍රණය කිරීම, ශ්‍රව්‍ය-දෘශ්‍ය හා මාර්ගගත)
- විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම
- ස්වයං උපදේශන පාඨමාලා රචනය, ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨමාලා අන්තර්ගතයන් (මාර්ගගත පාඨමාලා ද ඇතුළුව ) සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම
- පාඨමාලා ද්‍රව්‍ය සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම හා උපකාර කිරීම (මුද්‍රිත, ශ්‍රව්‍ය-දෘශ්‍ය හා මාර්ගගත ) සියළුම මාර්ගගත පාඨමාලා ප්‍රවේශනය කිරීම හා පාලනය
- විවෘත විශ්වවිද්‍යාල පාඨමාලා ද්‍රව්‍ය හා අනිකුත් ප්‍රකාශන පිටපත් සංස්කරණය
- පාඨමාලා ද්‍රව්‍යවල ගුණාත්මක තත්ත්වය සහතික කිරීම සහ විවෘත හා දුරස්ථ ඉගෙනීම් පර්යේෂණ කරගෙන යාම යනාදිය මෙම ඒකකයේ වගකීම් අතර වැදගත් තැනක් උසුලයි.

පහත සඳහන් ක්‍රියාකාරකම් හා සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විද්වතුන් වෙනුවෙන් මාර්ගගත පාඨමාලා සංවර්ධනය කිරීම හා ලබා දීම සඳහා අධ්‍යාපනික තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය පහසුකම් සලසයි.

- ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවාව සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මාර්ගගත පාඨමාලා සම්බන්ධීකරණය කිරීම.
- ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ පරිශීලකයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම.
- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය පරිපාලනය කිරීම.
- මාර්ගගත පාඨමාලා නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විද්වතුන් පුහුණු කිරීම.
- මාර්ගගත පාඨමාලා ඇතුළත් කිරීමට පෙර සමාලෝචනය කිරීම.
- සියලුම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් හා ගුරුවරුන් වෙනුවෙන් උපකාරක මධ්‍යස්ථානයක් ලෙස සේවය කිරීම.

2018 වර්ෂය තුළ, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය විසින් නව මූඩ්ල් අනුවාද 2.3 පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 154 දෙනෙක් පුහුණු කරන ලද අතර නව මූඩ්ල් අනුවාදයෙහි මාර්ගගත පාඨමාලා සංවර්ධනය කිරීම වෙනුවෙන් නව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 28 දෙනෙක් පුහුණු කරන ලදි.

**නිෂ්පාදන ඒකකය (මාධ්‍යය නිවස)**

නිෂ්පාදන ඒකකය නැතහොත් මාධ්‍යය නිවස, අංග සම්පූර්ණ ඩිජිටල්කරණය වූ ඉතා පැහැදිලි රූපවාහිනී මැදිරි, හඬ කැවීම් හා ශ්‍රව්‍යාගාර, රූපලාවන්‍යාගාර සහ පශ්චාත් නිෂ්පාදන ඒකකය යනාදී අංගවලින් සමන්විත වේ. එසේම ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලයක්, විවිධ වීඩියෝ සිනමා පට එකතුවක් ද ඒකකය සතුවේ. මෙම මධ්‍යස්ථානයේ ග්‍රැපික් ඒකකය මගින් චිත්‍රක සැලසුම් කිරීම, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය සඳහා සජීවීකරණ කාර්යයන් සැළසුම් කිරීම යන වගකීම් ද ඉටු කරයි. විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනෙකුත් වැදගත් ශ්‍රව්‍ය දෘශ්‍ය පට ආවරණය කිරීම ද මෙම අංශයෙන් කරගෙන යනු ලබයි. උපාධි ප්‍රදානෝත්සවය හා අනෙකුත් සම්මාන ප්‍රදානෝත්සවවල දී නිසල ඡායා රූ ගැනීම ආදී සේවා සැපයීම පිළිබඳ වගකීම ඉටුකරන්නේද මෙම ඒකකයයි.



තවද අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය පාඨමාලා රචනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව පවත්වා ගෙන යෑම, මාර්ගගත පාඨමාලා සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම, මාර්ගගත පාඨමාලා සඳහා විද්‍යුත් උපදේශනය, නිබන්ධකරණය ආදී සේවා ද සපයයි.

තවද වර්තමානයේ වෛද්‍ය වෘත්තිකයන් සඳහා වයෝවෘද මනෝ චිකිත්සාව පිළිබඳ පූර්ණ මාර්ගගත පාඨමාලාව කරගෙන යනු ලබන්නේද මෙම අංශය මගිනි.

2018 වර්ෂය තුළ විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ නව අධ්‍යාපනික වීඩියෝ නිෂ්පාදන 32ක් අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය විසින් නිෂ්පාදනය කර ඇත.

අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය විසින් රූපවාහිනී මැදිරිය, වෙනත් පහසුකම් හා සේවාවන් උපයෝගී කරගෙන CERC ව්‍යාපෘතිය යටතේ කුලී පදනම මත සේවා සපයන අතර 2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 5.8ක තක්සේරු කරන ලද ලාභයක් සමඟ රුපියල්.10,370.350.00ක් මුදලක් උපයාගන්නා ලදි.

2018 වර්ෂයේදී, පොදු විෂය පථයක් ලෙස භාවිතා කිරීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විඩීයෝ පට ඇතුලත් කිරීම සඳහා ''OpenUTube'' ලෙස යූ ටියුබ් නාලිකාවක් හා ''Open Cast'' නමින් සියලුම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වීඩියෝ පට සඳහා විඩියෝ පට සුරක්ෂිතාගාරයක් ස්ථාපිත කරන ලදි.






## 6.10 උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය

උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලාංකික සමාජය අතර සහයෝගීතාව වර්ධනය කරගැනීමට පහසුකම් සැළසීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිහිටුවන ලදී. එසේම මෙම උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය හරහා විශ්වවිද්‍යාලයට හැකි අවස්ථාවල රටේ යහපත සඳහා තම මානව සහ භෞතික සම්පත් යෙදවිය හැකිය. උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය මෙහෙයවනු ලබන්නේ උපකුලපති තුමා සභාපතිත්වය දරන අධ්‍යක්ෂ සහ අධ්‍යයන, අනධ්‍යයන යන කාර්ය මණ්ඩල දෙකේම නම්කරන ලද සාමාජිකයන්ගෙන් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසිනි.

උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය පර්යේෂණ වැඩසටහන්, කෙටි පාඨමාලා, උපදේශන සේවා, දිගු පාඨමාලා, පුහුණු සහ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන පාඨමාලා පවත්වයි. අදාළ අධ්‍යයන දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩලයට එවන් පැවරුම් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කලින් යොදාගත් වැඩකටයුතුවලට බාධාවක් නොවන ආකාරයට මේ කටයුතුවලට සම්බන්ධ විය හැකිය. උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ පැවරුම් සකස් කර තිබෙන්නේ අධ්‍යයන කාර්ය මණ්ඩල විසින් වන අතර ඒවා වර්තමාන ප්‍රවණතාවන් සහ සමාජ අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව සකස් කර තිබේ. යම් කිසි බාහිර ආයතනයක් වන සේවාලාභියෙකුට ගැළපෙන ආකාරයේ විශේෂ කාරියකට සැකසූ වැඩසටහන්ද තිබේ. උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සනාතන සභාවේ අනුමැතිය ලද පසු සිදු කළ හැකිය. මෙම පැවරුම් සාර්ථකව සම්පූර්ණ කිරීමට අවශ්‍ය භෞතික සහ මානව සම්පත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ලබා දෙයි.

උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය නිරන්තරයෙන්ම ශ්‍රී ලාංකික ප්‍රජාව , විශේෂයෙන්ම රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය, රජයේ බලධාරීන්, සමාන අධ්‍යයන ආයතන ආදිය සමඟ තම අරමුණු ඉටු කර ගැනීම සඳහා තම විස්තීරණ මානව සහ භෞතික සම්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන අතර උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ පැවරුම්වලට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ කර ගැනීම සහ ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම සඳහා තම උපරිම සහාය ලබා දෙයි.

2018 වසරේ උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය පැවරුම් 304 ක් සඳහා අනුමැතිය ලබා දුන් අතර ඉන් 241ක් සාර්ථකව අවසන් කෙරිණි. සමහර පැවරුම් කෙටි පාඨමාලා වන අතර ඒවාට ඇහුම්කන්දීම සහ කථනය, මානව සම්පත් කළමනාකරණය, සංචාරක ව්‍යාපාරය සහ හෝටල් මෙහෙයුම්, කොරියන් භාෂාව, වෘත්තිමය පරිගණක යෙදවුම්, ශාඛ පැල කිරීමේ තාක්ෂණය, පරිගණක සහායක සැළසුම් කිරීම සහ ආකෘතිකරණය, වෘත්තීමය වෙබ් සැකසුම්, ඉගෙනුම් අපහසුතා ඇති දරුවන්ට ඉගැන්වීම, පර්යේෂණ ක්‍රමවේදය, මහජන පුස්තකාලය සහ විශ්වවිද්‍යාල පුස්තකාල ඇතුළු සිසැයුම, ඔට්සම් පිළිබඳ වැඩමුළු යනාදිය ඇතුළත් වේ.

# 7 කොටස – අනාගත සැළසුම්

## 7.0. අනාගත සැළසුම් - 2019

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විවෘත හා දුරස්ථ ඉගෙනුම් උසස් අධ්‍යාපන ආයතනය වශයෙන් එහි මෙහෙවරෙහි අරමුණු වෙත ළඟා වීමේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සේවාවන් තවදුරටත් ව්‍යාප්ත කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අනාගත වැඩසටහන් වලින් කිහිපයක් පහත දැක්වේ. මෙම ව්‍යාපෘති යෝජනා කිරීමේදී තිරසාර සංවර්ධනය පදනම් කර ගනිමින් පහත ව්‍යාපෘති සිදු කරනු ලැබේ.

1. විශ්වවිද්‍යාලයීය හරිත ප්‍රතිපත්තිය පාදක කරගනිමින් මධ්‍යම මණ්ඩපය හා කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය හරිත විශ්වවිද්‍යාලයක් ලෙසට පරිවර්තනය කරනු ලැබේ.
2. ජල ප්‍රතිචක්‍රීකරණය සහිත නවීන තාක්ෂණය භාවිතා කරමින් මධ්‍යම මණ්ඩපය හා කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා මලාපවහන හා ජලාපවහන පද්ධතියක් හඳුන්වා දෙනු ලැබේ.
3. නව අධ්‍යයන මධ්‍යස්ථානයක් මාතලේ ස්ථාපිත කිරීම මගින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය මධ්‍යස්ථාන ජාලය තවදුරටත් ව්‍යාප්ත වීම හා වඩාත් ශක්තිමත් කිරීම සිදු කෙරේ. එම ගොඩනැගිල්ල දැනට අළුත්වැඩියා කෙරෙමින් පවතින අතර මාතලේ අධ්‍යයන මධ්‍යස්ථානය 2019 වර්ෂය තුළ විවෘත කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම අවම වශයෙන් එක් අධ්‍යයන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ විශ්වවිද්‍යාලයේ අභිප්‍රාය මේ සමඟ ඉටු වේ.
4. මධ්‍යම මණ්ඩපය හා ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථාන ඉහළ නැංවීමේ අනෙකුත් ව්‍යාපෘති සැළසුම් කෙරෙමින් පවතින අතර 2019/2020 වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.
   i. සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා නව මහල් 5කින් යුත් ගොඩනැගිල්ල.
   ii. මධ්‍යම මණ්ඩපයේ සිව්මහල් විභාග ශාලාව.
   iii. විභාග අංශය අළුත්වැඩියා කිරීම.
   iv. මූලධන අංශය සඳහා කාර්යාලයීය ස්ථානය අළුත්වැඩියා කිරීම.
   v. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ දෙවන මහල අළුත්වැඩියා කිරීම.
   vi. කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය තුළ ශිෂ්‍ය අධ්‍යයන ප්‍රදේශ ඉදිකිරීම.
   vii. කුරුණෑගල හා මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථාන සඳහා තාවකාලික විභාග ශාලා.
   viii. නුවර සහ මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථාන සඳහා තාවකාලික නවාතැන් පහසුකම (TRF)
   ix. මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා නව විභාග ශාලාව.
   x. බදුල්ල,රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථාන තුළ හා ත්‍රිකුණාමලය, මන්නාරම, හැටන් අධ්‍යයන මධ්‍යස්ථාන තුළ නව මධ්‍යස්ථාන ඉදිකිරීම ආරම්භ කිරීම.
5. සීෂෙල්ස් ජනරජයේ හා මාලදිවයින ජනරජයේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් මාධ්‍ය හරහා ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහන් පිරිනැමීමෙන් දේශීය හා ජාත්‍යන්තර හවුල්කරුවන් සමග සහයෝගීත්වය වර්ධනය කිරීම.

6. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ක්‍රියාකාරකම් හා සංකීර්ණ පරිපාලන ව්‍යුහය, බලතල, රාජකාරි හා කාර්යය සමඟ විශ්වවිද්‍යාලය මුහුණ දෙනු ලබන අභියෝග පිළිබඳ කතා කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ආඥා පණත ප්‍රතිස්ථාපනය කරමින් පවතී. 2019 දී ආඥා පනත් කෙටුම්පත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා කෙරේ.

7. විශ්වවිද්‍යාලයීය ප්‍රධාන නිලධරයන්ගේ මගපෙන්වීම සහිතව ස්වකීය ස්ථාන වල අධ්‍යයන, පරිපාලනමය හා මූල්‍ය ක්‍රියාකාරකම් බොහෝමයක් පාලනය කිරීම සඳහා ප්‍රාදේශීය අධ්‍යාපන සේවා ප්‍රතිව්‍යුහගත කිරීම 2019 වර්ෂයේදී අවසන් කිරීමට කටයුතු කෙරේ.

8. සියලුම අධ්‍යයන හා කළමනාකරණ කාර්යයන් සඳහා අනුග්‍රහය දැක්වීමට පුළුල් කළමනාකරණ තොරතුරු පද්ධතියක් මෙන්ම ඉගැන්වීම් ඉගෙනුම් කාර්යය වෙනුවෙන් අනුග්‍රහය දැක්වීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල ව්‍යුහයකින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමන්විත වේ.

9. 2019 වර්ෂයේ අගභාගය වන විට සමස්ත මධ්‍යම මණ්ඩපය හා බොහෝ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වෙත WIFI පහසුකම සැපයීමට හැකි වනු ඇත.

10. ආයතනික පර්යේෂණ පැවැත්වීම සඳහා පර්යේෂණ යෝජනා දියුණු කිරීම සහ නවතම ප්‍රවණතා හා සංවර්ධන පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් වීම සඳහා වැඩමුළු පැවැත්වීමේ අරමුණ ඇතිව එංගලන්ත විවෘත විශ්වවිද්‍යාල සම්පත් දායකයෙකුගෙන් යුත් ඉගෙනුම් විශ්ලේෂණ පිළිබඳ වැඩමුළුවක් 2019 ජනවාරි පැවැත්වීමට සැලසුම් කරමින් පවතී.

11. විවෘත විශ්විද්‍යාල ආසියානු සංගමයේ 2020 වාර්ෂික සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමේ සත්කාරකත්වය විශ්වවිද්‍යාලය විසින් දරනු ඇත.

12. ජාතික ව්‍යාපෘතිය සඳහා පුස්තකාලය සම්බන්ධ වී ඇති අතර දිවයින පුරා පොදු පුස්තකාල බොහෝමයක් ස්වයංක්‍රීය කිරීම සිදුකර ඇත. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටා ඇති නගරවල ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙත පුස්තකාල සේවා උසස් කිරීම සඳහා මහජන පුස්තකාල සමඟ මෙම සහයෝගීතාවය වර්ධනය කිරීම සැලසුම් කිරීම.

13. ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා 2016 වර්ෂයේදී විශ්වවිද්‍යාලයට පැවරුවද, නොයෙක් ප්‍රවර්ධන ගැටළු හෙතුවෙන් එහි මෙහෙයුම් සමඟ එතරම් ඉදිරියට ගමන් කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වී ඇත. දැනට මෙම ගැටළු සාකච්ඡා කරමින් පවතින අතර පර්යේෂණයේ සාර්ථකත්වය, 2019 වර්ෂය තුළ එය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වනු ඇති අතර එය ස්ථාපිත කරන ලද අරමුණ වෙනුවෙන් මෙහෙවර කරනු ඇත.

14. විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සඳහා භෞතික යටිතල ව්‍යුහය උසස් කිරීමට සැලසුම් කෙරේ.

15. නව සන්නිවේදන පිළියමක්, විශ්වවිද්‍යාලය පුරා පුළුල් CCTV පද්ධතියක් හා ස්වයංක්‍රීය පැමිණීම හඳුන්වාදීමට පියවර ගනිමින් පවතී.

# 8 කොටස - ගිණුම්

# 8.0. ගිණුම්

## 8.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර:

| විෂය | | 2017 රු. | 2018 රු. |
|---|---|---|---|
| අ. | පුද්ගලික පඩිනඩි | 1,503,377,232 | 1,833,468,187 |
| ආ. | ගමන් වියදම් | 8,730,050 | 12,003,076 |
| ඇ. | සැපයුම් | 46,532,248 | 52,276,201 |
| ඈ. | නඩත්තු සේවා | 53,559,716 | 90,936,317 |
| ඉ. | කොන්ත්‍රාත් සේවා | 342,022,001 | 312,938,768 |
| ඊ. | වෙනත් | 275,600,005 | 241,051,827 |
| **එකතුව** | | **2,229,821,252** | **2,542,674,376** |

## 8.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර:

| විෂය | | 2017 රු. | 2018 රු. |
|---|---|---|---|
| අ. | ගෘහ උපකරණ සහ කාර්යාලීය උපකරණ පවරා ගැනීම | 148,905,806 | 116,026,371 |
| ආ. | යන්ත්‍රෝපකරණ පවරා ගැනීම | 7,126,108 | 9,008,809 |
| ඇ. | ගොඩනැගිලි හා සැලසුම් පවරා ගැනීම් | 55,869,211 | 82,049,827 |
| ඈ. | වෙනත් (පුස්තකාල පොත්, ලෝගු හා මොටර් රථ වාහන) | 14,128,638 | 14,030,997 |
| **එකතුව** | | **226,029,763** | **221,116,004** |

## 8.3 ව්‍යාපෘති ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සපයන ලද)

| | නම සහ විස්තර | මූල්‍ය සැපයූ ආයතනය | සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව (TCE) (රු.) | 2016 වියදම් | 2017 වියදම් | 2018.12.31 දිනට සමුච්චිත එකතුව | භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය (%) | ශෘහස්ථ අරමුදල් (DF)( රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | තොරතුරු පරිගණක තාක්ෂණ කුසලතා සඳහා ඒකාබද්ධ විවෘත අධ්‍යාපනික සම්පත් පාඨමාලා සංවර්ධනය (A.No.CA16-340) | පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය | 1,261,250.00 | 170,140.69 | 735,930.00 | 906,070,69 | 71.84 | - |
| 2. | 21 වැනි සියවසෙහි ඉගෙනුම් ලාභීන්ගේ විවිධ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන (A.No.CA16-xxx) | පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය | 2,070,060.31 | - | - | - | - | - |
| 3. | විද්‍යුත් ඉගෙනුම් පාඨමාලා සංවර්ධනය- ඉගැන්වීම හා ඉගෙන ගැනීම සඳහා උපදේශනාත්මක විඩියෝ නිෂ්පාදනය (C17-054) | පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය | 1,565,751.32 | - | - | 700,000.00 | 44.71 | - |
| 4. | "විවෘත අධ්‍යාපන සම්පත් හා විවෘත අධ්‍යාපන පුහුණු ප්‍රතිග්‍රහණය පිළිබඳව අධ්‍යාපනඥයන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අරමුණු කරගත් විශාල විවෘත මංගත පාඨමාලාවක් සැලසුම් කිරීම, සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම: සැලසුම් පදනම් වූ ධාරිතා සංවර්ධන වැඩසටහනකි"(19-ED 262) - අදියර **2** | පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය | 1,700,000.00 | - | - | 146,437.00 | 8.61 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 5. | විද්‍යුත් පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය | ප්‍රාදේශීය සභා හා පළාත් සභා අමාත්‍යාංශය | 15,000,000.00 | - | 8,181,293.00 | 11,841,293.00 | 78.94 | 15,000,000.00 |
| 6 | අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව පිරිනමන ගුරු අධ්‍යාපනඥයන් සඳහා පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව | ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය | 1,250,000.00 | - | 248,520.00 | 381,820.00 | 30.55 | 1,250,000.00 |
| 7 | “ශ්‍රී ලාංකික ප්‍රාථමික පාසැල් ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම” පිළිබඳව පවත්වන ලද පර්යේෂණය | යුනිසෙෆ් සංවිධානය | 1,791,350.00 | - | 1,215,000.00 | 1,264,000.00 | 70.56 | - |
| 8 | කාන්තා පුරුෂ සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය වෙනුවෙන් මූල්‍යාධාර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 770,000.00 | - | 6,640.00 | 57,008.22 | 7.40 | 770,000.00 |
| 9 | ECD ගුරු පුහුණුකරුවන් හා ECD ගුරුවරුන් සඳහා විෂයමාලා සංවර්ධන කෙටිකාලීන පුහුණු පැකේජය - ශ්‍රී ලංකා රජයේ ECD ව්‍යාපෘතිය යටතේ | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 956,425.00 | - | 128,598.00 | 582,134.00 | 60.87 | 956,425.00 |
| 10 | ග්‍රාමීය ගොවි කාන්තා ප්‍රජාව අතර ජංගම ඉගෙනීම ප්‍රවර්ධනය සඳහා කාන්තාව සවිබල ගැන්වීම | පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය | 1,423,245.94 | - | - | 821,277.41 | 57.70 | - |
| 11 | ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්ත සේවයේ නිර්යාත කෘෂි නිළධාරීන්ගේ කාර්යක්ෂමතා වර්ධනය සඳහා තොරතුරු පරිගණක තාක්ෂණයෙහි හාවිතය | පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය | 600,000.00 | - | 475,538.04 | 525,538.04 | 87.59 | - |
| 12 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය හා එක්ව ඒකාබද්ධව ගොවීන් සඳහා යාවජීව ඉගෙනුම් වැඩි දියුණු කිරීම.(A.No. CR18-299). | පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය | 1,766,500.00 | - | - | 178,354.06 | 10.10 | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 13 | ශ්‍රී ලාංකීය උසස් ද්විතීය පාසල් මට්ටමේ ගුරුවරුන් හා ශිෂ්‍යයන් විසින් පවත්වන පොදුරාජ්‍ය මණ්ඩලීය ඩිජිටල් අධ්‍යාපන නායකත්ව පුහුණුව ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන (A.No C-19-008) | පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය | 2,539,000.00 | - | - | 819,970.50 | 32.30 | - |
| 14 | විෂය බාහිර ක්‍රියාකාරකම් වල නිරත වන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ධෛර්යමත් කිරීම සඳහා අක්මුදල්. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 4,500,000.00 | - | 1,015,793.85 | 3,766,709.00 | 83.70 | 4,500,000.00 |
| 15 | ඉංජිනේරු තාක්ෂණ පීඨ ශිෂ්‍ය අධ්‍යයන සම්මන්ත්‍රණය | විද්‍යා තාක්ෂණවේදය හා පර්යේෂණ අමාත්‍යාංශය | 244,625.00 | - | - | 129,250.00 | 52.84 | 244,625.00 |
| 16 | පාරිසරික හා දේශගුණික විපර්යාස නීති ශක්‍යතාව "පුහුණුවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන" ශක්තිමත් කරමින් ABD කලාපිය ශක්‍යතා සංවර්ධන සහාය. | ආසියානු සංවර්ධන බැංකුව | 308,000.00 | - | - | 12,750.00 | 4,14 | - |
| 17 | අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය වවුනියා අධ්‍යයන මධ්‍යස්ථාන ගුරු අධ්‍යාපනඥයන් සඳහා කෙටි කාලීන පාඨමාලාව මෙහෙයවීම. | ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය | 675,000.00 | - | - | - | - | 675,00.00 |

## 8.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්):

| විෂය | | ප්‍රතිපාදන 2018 රු. | එකතුව 2018 රු. | ඉතිරිකිරීම්/ අතිරික්තය රු. |
|---|---|---|---|---|
| අ. | පුනරාවර්තන වියදම් - ව්‍යාපෘති හැර | 2,638,900,000 | 2,885,285,311 | 246,385,311 |
| ආ. | ප්‍රාග්ධන වියදම් - ව්‍යාපෘති හැර | 516,269,000 | 222,278,349 | 293,990,651 |
| එකතුව | | **3,155,169,000** | **3,107,563,660** | |

❖ ලැබිය යුතු දේ ක්ෂය වීම හා අපවය වීම ඇතුළුව (ශිෂ්‍ය)

## 8.5 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදනය කළ ආදායම):

| ආදායම් මාර්ගය | | ප්‍රතිපාදන 2018 රු. | එකතුව 2018 රු. | ඉතිරිකිරීම්/ අතිරික්තය රු. |
|---|---|---|---|---|
| අ. | ප්‍රථම උපාධි අධ්‍යයන කටයුතු | 621,601,725 | 514,052,856 | 107,548,869 |
| ආ. | පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු | 310,800,863 | 257,026,428 | 53,774,435 |
| ඇ. | වෙනත් | 50,097,412 | 41,429,611 | 8,667,801 |
| එකතුව | | **982,500,000** | **812,508,895** | |

## 8.6 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2018:

| විෂය | | සූත්‍රය | එක් ශිෂ්‍යයෙකු සඳහා වියදම රු. |
|---|---|---|---|
| අ. | එක් ශිෂ්‍යයෙකු සඳහා පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම/ ශිෂ්‍ය සංඛ්‍යාව | 72,157 |
| ආ. | එක් ශිෂ්‍යයෙකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග්ධන වියදම/ ශිෂ්‍ය සංඛ්‍යාව | 5,558 |

## 8.7 2018 වසරේදී ලැබුණු යටිතල පහසුකම්:

| යටිතල පහසුකම් විස්තර | වියදම රු. | භෞතිකමය ප්‍රගති ප්‍රතිශතය |
|---|---|---|
| සිව් මහල් ගොඩනැගිල්ල - යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 53,099,606 | ඉදිකිරීම් කටයුතු කෙරෙමින් පවතී |
| පස් මහල් ගොඩනැගිල්ල - සෞඛ්‍ය විද්‍යා පීඨය | 503,125 | ඉදිකිරීම් කටයුතු කෙරෙමින් පවතී |

# 9 කොටස - වෙනත් තොරතුරු/ මෙම වාර්තාවට අදාළ කාර්ය සාධනය

# 9.0. වෙනත් තොරතුරු/ මෙම වාර්තාවට අදාළ කාර්ය සාධනය

## 9.1 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. : එච්ඊඩී/ජී/ඕයූ/එෆ්ජ්/18 | ඔබේ අංකය / உமது இல. / Your No. : | දිනය / திகதி / Date : 2019 මැයි 31 දින |

උපකුලපති
විවෘත විශ්වවිද්‍යාලය

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 108(1) උපවගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිත 07 ට අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් වත්කම් ප්‍රත්‍යාගණනය කර හා එය නිවැරදිව සිදුනොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශන වලින් දක්වා ඇති ඉඩම් 11 ක වටිනාකම රු.149,950,000 ක් හා රු.236,567,269 ක් වටිනා පුස්තකාල පොත්වල සාධාරණ අගය (Fair Value) නිරූපණය නොවන බව නිරීක්ෂණය විය.

### (ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

වර්ෂ අවසාන තොග ශේෂය භෞතිකව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීම ආයතනයේ ගිණුම් ප්‍රතිපත්තිය වුවද ප්‍රධාන ගබඩාවේ තොගය රු.5,594,534 ක් ලෙජර් ගිණුමේ ශේෂය පදනම් කරගෙන ගිණුම්ගත කර තිබුණු අතර ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල රු77,991,842 ක් වූ තොගය භෞතික ශේෂය ලෙජර් ශේෂය සමඟ සැසඳීමක් නොකර ගිණුම් ගත කර තිබුණි.

### (ඇ) ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ රු.34,847,854 ක් වූ අස්පෘෂ්‍ය වත්කම්වල ඵලදායි ජීවිත කාලය තක්සේරු කර ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම්වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

**2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සමාජිකයෙකුට විශ්වවිද්‍යාලයට සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.**

**2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 751(1) | ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කරන ලද පාඨමාලා පොත් හා අධ්‍යයන ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල තොග පොත් නඩත්තු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 සහ 757 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත එවිය යුතු වුවද 2018 දෙසැම්බර් 31 දිනට රු.236,567,269 ක් පිරිවැය වූ පුස්තකාල පොත් හා රු.4,748,975 ක් පිරිවැය වූ උපාධි ලෝගු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 | වාහන ලොග් සටහන් පොත් හා දෛනික ධාවන සටහන් සම්බන්ධයෙන් තබා ගත යුතු ලේඛණ නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යයන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ<br>(i) XX වැනි පරිච්ඡේදයේ 3.1 | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන යායුතු අතර, ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණීම හා පිටව යන වේලාව සටහන් කළ යුතු වුවත් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශයේ නිලධාරීන් සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | xxvi වැනි පරිච්ඡේදයේ 3.2 හා 3.3 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් තුළින් හඳුනාගන්නා ස්ථාවර වත්කම් 115 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමෙන් පසු අදාළ ඌනතාවයට, නැතිවීමට හෝ හානියට වගකිව යුතු තැනැත්තා නියමකොට දැනගෙන එම තැනැත්තාගෙන් එය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අගය අයකර ගත යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඈ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය 2.1.7 වගන්තිය ප්‍රකාරව | නිලධාරියෙකු මාරු වී පැමිණ මාස 02 ක් ඇතුළත හෝ නිලධාරියෙකු මාරු වී ගොස් මාස 03 ක් ගත වීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂයන් නොපෙන්වීමට වගබලා ගත යුතු වුවද ඊට පටහැනිව නිලධාරීන් 08 කුගෙන් අයවිය යුතු රු.324,644 ක් නිරවුල් කර නොතිබුණි. |
| (ඈ) | උපකුලපතිවරයා විසින් නිකුත් කරන ලද 2010 දෙසැම්බර් 27 දිනැති අංක OU/F/IC/01 දරන උපදෙස් පත්‍රිකාව ප්‍රකාරව | අත්තිකාරම් මුදල් ලබාගත් දින සිට දින 30 ක් ඇතුළත නිරවුල් කළ යුතු බව දක්වා තිබුණද 2018 වර්ෂයේදී නිකුත් කරන ලද රු.1,221,719 ක් වටිනා අත්තිකාරම් 40 ක් නිරවුල් කිරීමේ කාලය දින 60 ද ඉක්මවා තිබුණි. |

**2.3** **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

**2.4** **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සැකසුරුවම් ලෙස, කාර්යක්ෂමව ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**

(අ) අතිරික්ත පොත් මුද්‍රණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පිරිවැය රු.21,283,087 ක් වූ පොත් 121,248 ක් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පවිත්‍රතා සේවාව වෙනුවෙන් ගිවිසුමට අනුව රු.1,568,800 ක් මාසිකව ගෙවනු ලබයි. එසේ වුවත් ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් යොදවා නොතිබුණු අතර පිරිසිදු කිරීම නිසි අයුරින් සිදු වී නොතිබුණි.

(ඇ) සෞඛ්‍ය විද්‍යා පීඨයේ පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2016 ඔක්තෝබර් 11 දින රු.මිලියන 402.5 ක් නිර්දේශ කර ඇති අතර එදින සිට වසර 02 කින් ඉදිකිරීමේ කටයුතු නිමකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටද අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඈ) අධ්‍යාපන පීඨයේ සිව්වන මහලේ වහලය අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව නතර වී තිබූ අතර ඒ සඳහා දරන ලද රු.5,392,936 ක වටිනාකම 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාම මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක්ම අදාළ කාර්ය නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. වෙනත් නිරීක්ෂණ

(අ) 1988 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා ගිවිසුම් කඩකල අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 14 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.48,085,752 ක මුදලින් කිසිදු මුදලක් ගිවිසුම් කඩකළ දින සිට සමාලෝචිත වර්ෂය දක්වාම අයකර ගෙන නොතිබුණු අතර ගිවිසුම් කඩකල තවත් නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.35,521,351 ක් වූ මුළු ගිවිසුම් ගත වටිනාකමින් රු.18,499,495 ක් පෙර වර්ෂය දක්වා අයකර ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම නිලධාරීන්ගෙන් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

(ආ) කාර්යමණ්ඩලයේ 56 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අය නොවූ සේවක ණය ශේෂය රු.2,497,789 ක් වූ අතර ඒ තුළ ආයතනය හැර ගිය කාර්යමණ්ඩලයේ 47 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,754,223 ක් විය.

(ඇ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර තිබුණද ආයතනයේ සමස්ත අරමුණු ඉටුකර ගැනිම කෙරෙහි අදාළ සැලසුම් උපයෝගී කර ගැනිම කෙරෙහි ඉහළ කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාළව කාර්යසාධන වාර්තා පිළියෙල කිරීමේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වන ලද අරමුණු ඉටු වී තිබේද යන්න පැහැදිලිව හඳුනාගැනීමට හැකිවන පරිදි එම වාර්තාව සකස් කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1,494 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 1,220 ක් විය. විශ්වවිද්‍යාලය විසින් 112 ක් වූ අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු 162 ක් පිරවීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධනය පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛ සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලය දැනුවත් වී තිබුණි. විශ්වවිද්‍යාලයේ තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන තිබූ නමුත් ඊට අදාළ වැඩසටහන් සැලසුම්වලට ඇතුළත් කිරීම, සංධිස්ථාන. හඳුනා ගැනීම, කාර්යසාධන දර්ශක හඳුනා ගැනීම, වැඩ සටහන් සම්බන්ධ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි 133 සහ 134 සඳහන් විධිවිධාන සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ චක්‍රලේඛ ප්‍රකාරව ආයතනයේ අභ්‍යන්තර පාලනයේ අඩුපාඩු හඳුනාගෙන ඒවා වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණනය යොදා ගැනීම කෙරෙහි කළමනාකාරීත්වය අවධානය යොමුකර නොතිබුණි.

(උ) විවෘත විශ්වවිද්‍යාලයට අදාළ ප්‍රාග්ධන වියදම් රජය මඟින් දැරීමටද අනෙකුත් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීම සඳහා පාඨමාලා ගාස්තු වැනි අභ්‍යන්තරික ආදායම් උපයෝගී කර ගැනීම සිදුකළ යුතුවේ. 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී රජයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන රු.මිලියන 207.4 කින් හෙවත් සියයට 19 කින් වැඩි වී තිබූ නමුත් උපයා තිබූ ආදායම රු.මිලියන 441.4 ක් හෙවත් සියයට 34 කින් අඩු වී තිබීමෙන් මෙම ආයතනය පවත්වා ගෙන යාමට රජයට දැරීමට සිදු වූ වැය බර වැඩි වෙමින් පැවතුණි.

(ඌ) විවෘත විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරන ඉඩම් 18 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.4,367,290,394 ක් විය. ඉන් නිත්‍යානුකූල හිමිකම් ලබානොගත් ඉඩම් 11 ක රු.266,539,328 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර ඇති බව නිරීක්ෂණය විය.

(එ) විශ්වවිද්‍යාලය සතු පුස්තකාලයන්හි භාවිතයට ඇති පොත්වල වටිනාකම රු.236,567,269 ක් විය. මේ අතරින් අධ්‍යයන මධ්‍යස්ථානවල ඇති පුස්තකාල වල ඉඩකඩ නිසි පරිදි කළමනාකරණය නොකිරීම ඇතැම පුස්තකාල කාමර වසා දමා තිබීම, භෞතික පොත් තොග ආගනනයක් සිදුනොකිරීම හා ප්‍රධාන පුස්තකාලයේ ස්ථාපිත කර තිබූ පරිගණක පද්ධතිය තුළින් නිවැරදි තොරතුරු ජනනය නොවීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

(ඒ) තොග සමීක්ෂණයෙන් හඳුනාගත් චලනය නොවන තොගය හා සෙමින් චලනය වන තොගයේ වටිනාකම තක්සේරු කර ගබඩාවෙන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඓ) ගිවිසුම් කඩකල නිලධාරීන්ගෙන් අයවිය යුතු අදායම හා කාලපරිච්ඡේදයේ ලද ආදායම සම්බන්ධයෙන් මූල්‍ය අංශයෙන් ලබාගත් තොරතුරු හා ආයතනික අංශයෙන් ලබාගත් තොරතුරු අතර පරස්පරතාවයක් පවතින බව විගණනය විසින් නිරන්තරයෙන් පෙන්වාදී තිබුණද ආයතන අංශයේ උපලේඛන සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල ස්ථාපිත කර ඇති විදුලිජනක යන්ත්‍රවල ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හා ක්‍රියාවිරහිත වීම් මෙන්ම විදුලි ජනක යන්ත්‍ර නිෂ්ක්‍රියව පැවතීම යන හේතු නිසා විදුලිය බිඳවැටීම්වලදී දැඩි අපහසුතාවයකට පත්වන අවස්ථා නිරීක්ෂණය විය.

(ඕ) දූරස්ථ අධ්‍යාපන ව්‍යාපෘතිය (DEMP) මගින් විශ්වවිද්‍යාලය වෙත 2009 වර්ෂයේදී ප්‍රදානය කර තිබූ රු.1,580,000 ක් වටිනා කුඩා පොලිතීන් ඇසුරුම් සකස්කළ හැකි යන්ත්‍රයක් සහ තවත් විශ්වවිද්‍යාලය සතු ස්ථාවර වත්කම් අයිතම 128 ක්ද නිශ්කාර්යව පැවතුණි.

(ඖ) විවෘත විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක සහ ඉතුරුම් ගිණුමක සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 14 කට සහ රු.මිලියන 10 කට වැඩි ශේෂයක් ඵලදායිව ආයෝජනය කිරීමට නොහැකිව නිශ්කාර්යව පැවතුණි.

(ක) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ප්‍රතිමාන සංග්‍රහය (Norms) ප්‍රකාරව සාමාන්‍යයෙන් වසර 04 කට වරක් සියලු පාඨමාලා නැවත සංශෝධනය කර යාවත්කාලීන කළයුතු වුවත්, විශ්වවිද්‍යාලයේ බොහෝ පාඨමාලා සම්බන්ධයෙන් එවැනි සංශෝධනයන් (Course Revise) සිදුකර නොතිබූ අතර ප්‍රමාද කාලය වර්ෂ 02 සිට වර්ෂ 24 දක්වා ඉහළ පරාසරයක් ගෙන තිබුණි.

(ඛ) විශ්වවිද්‍යාලයේ රු.3,000,000 ක් වූ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (OMIS) අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල 05 ක් යටතේ ස්ථාපනය කර තිබුණු අතර එම පද්ධතියේ පැවති අඩුපාඩු හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ග) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයන්ගේ අධ්‍යාපන කටයුතු වලට අදාළ වැඩසටහන් නිෂ්පාදනය ප්‍රධාන අරමුණ ඇතිව රු.මිලියන 306.3 ක් වටිනා ගොඩනැගිල්ලක රු.මිලියන 133.2 ක් වටිනා උපකරණ සහිතව පිහිටුවා ඇති අධ්‍යාපන තාක්ෂණ හා මාධ්‍ය අංශය (CETMe) මගින් වාණිජමය අරමුණු පදනම් කරගෙන බාහිර වැඩසටහන් නිෂ්පාදනයද සිදුකළ හැකිව තිබූ නමුදු ඉන් ආදායම් ඉපැයීමට හෝ ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා ඵලදායිව යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඝ) ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය 2010 වසරේදී ස්ථාපනය කර තිබුණි. 2015 මාර්තු 01 දින වන විට ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු විවෘත විශ්වවිද්‍යාලය වෙත පැවරීමත් සමඟ වර්තමානයේ විශ්වවිද්‍යාලය තුළ වූ ගොඩනැගිල්ලක එම ඒකකය පිහිටුවා තිබුණි. 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු.100,757,839 ක් උපයා තිබුණද එතෙක් ඉපැයූ විශාල ආදායමක් උපයා ගැනීම මඟහැරී තිබූ බැවින් එම ව්‍යාපෘතිය වර්තමානයේ ඉතා අවම මට්ටමින් භාවිතයට ගනිමින් පැවතුණි.

(ත) අයවැය ගත ආදායම් හා වියදම් සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී පිලිවෙලින් සියයට 32 සිට සියයට 1,379 දක්වා ප්‍රමාණාත්මක විචලතාවයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

11

මගේ අංකය
எனது இல.
My No.
VV/AC/02/A.Q./2018

ඔබේ අංකය
உமது இல.
Your No.
එච්ඊඩී/ජී/ඕයූ/එෆ්

දුරකථනය
தொலைபேசி
Telephone
853615
853777
856201
856202

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
இலங்கைத் திறந்த பல்கலைக்கழகம்
THE OPEN UNIVERSITY OF SRI LANKA

තැපැල් පෙට්ටිය 21
නාවල
නුගේගොඩ

அஞ்சற் பெட்டி 21
நாவல
நுகேகொட

Post Office Box 21
Nawala
Nugegoda


2019 ජූනි 14

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

**ශ්‍රී ලංක විවෘත විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

2019 මැයි 24 දිනැති ඔබ විසින් එවන ලද විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මාගේ අදහස් පහත සඳහන්වේ.

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------

2019-06-03 දින ජාතික විගණන කාර්යාලයේදී නියෝජ්‍ය විගණකාධිපති සමග පවත්වන ලද සාකච්ඡාවේදී එකඟ වූ පරිදි නීතිමය හිමිකම් තහවුරු නොවූ එහෙත් විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරනු ලබන ඉඩම් විශ්වවිද්‍යාල වත්කම ලෙස මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් නොකිරීමටත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන සටහන් යටතේ හෙළිදරව් කිරීමටත් 2019 වසරේ සිට කටයුතු කරනු ලැබේ.

එමෙන්ම පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2018 වසර තුලදී පුස්තකාලය සතු සියළුම පොත් භෞතිකව ගණනය කරන ලදී. නමුත් එම පොත්වල වටිනාකම අගය කිරීමේ කාර්යය සඳහා විශාල කාලයක් ගතවන බැවින් 2018 වසරේදී මූල්‍ය ප්‍රකාශන වල ප්‍රත්‍යාගණන අගයන් හෙළිදරව් කිරීමට නොහැකි විය. නමුත් 2019 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදි මෙම අගයන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

(i) තොග ගණනය කිරීමේදී විශ්වවිද්‍යාලය විසින් ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලබයි. ඒ අනුව ප්‍රධාන ගබඩාවේ තොගයත් අනෙකුත් ඒකක හා ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන සතු තොගයන්ද භෞතික තොග ශේෂය පදනම්ව ගිණුම්ගත කර ඇත.

නමුත් ප්‍රධාන ගබඩාවේ තොගය ගිණුම්ගත කිරීමේදී වරදක් සිදුවී ඇති බව පිළිගනිමි. තොග ගබඩාවේ වාර්ෂික තොග සමීක්ෂණ වාර්තාව අනුව 2018-12-31 දිනට පැවැති තොගය ගිණුම්ගත කිරීමට කටයුතු කලත් අතපසුවීමකින් සෙමින් චලනය වන තොගය දෙවරක් ගණනය වී ඇත. එම නිසා තොග ශේෂය රු. 403,617.00 ක් වැඩියෙන් ගිණුම් ගතවී ඇත.

එමෙන්ම ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල පොත් තොග ශේෂය ගණනය කිරීමේදී භෞතික ශේෂය, පොත් ශේෂය හා සැසැදීමක් සිදුකරනු ලබයි. මෙම කටයුත්ත 2019 වසරේ සිට ක්‍රමවත්ව සිදුකර ඒ සම්බන්ධ තොරතුරුද විගණනයට ලබාදීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

අසපෘෂ්‍ය වත්කම් යටතට OMIS හා Network පද්ධතියන් හා E-books ද ඇතුලත්වේ. OMIS පද්ධතිය අවුරුදු 10 ක් පුරාවට විශ්වවිද්‍යාලය තුල ක්‍රියාත්මක වන අතර, අනෙකුත් පද්ධතියන් හා E-books සම්බන්ධයෙන් ද ඒවායේ ජීවිත කාලය පිළිබඳ නිශ්චිත තහවුරුවක් කිරීමට අපහසුය. එම නිසා එම වත්කම් ක්‍රමක්ෂය කිරීමක් සිදුනොකරන ලදී. නමුත් ඔබ විසින් දක්වා ඇති පරිදි 2019 වසරේ සිට එම වත්කම්ද ක්‍රමක්ෂය කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශයවන්ගේ වගකීම
------------------------------------------------------------------------------------------

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
-----------------------------------------------------------------------

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
--------------------------------------------------------------

2.1

2.2

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 751(1) | පාඨමාලා පොත් හා අධ්‍යයන ද්‍රව්‍ය තොග නඩත්තු කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දී ඇති අතර එය දැන් යාවත්කාලීන කරනු ලබයි. |
| (ii) මුදල් රෙගුලාසි 756 සහ 757 | 2018 වසරේදී පුස්තකාල පොත් හා උපාධි ලෝගු සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර ඇත. පුස්තකාල පොත් සම්බන්ධව සමීක්ෂණ මණ්ඩලයෙන් ලබාදුන් නිර්දේශයන්ට අදාලව ගතයුතු |

| | |
|---|---|
| | ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් 2019 මාර්තු මාසයේදී පාලක සභාවට ද කරුණු ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා පාලක සභා අනුමැතියද ලැබී ඇත.<br><br>එමෙන්ම සමීක්ෂණ මණ්ඩල 12 ක් යටතේ ප්‍රධාන ගබඩාවේ තොග සමීක්ෂණය සිදු කර ඇති අතර, ඒ යටතේ උපාධි ලෝගු ද සමීක්ෂණයට භාජනය කර ඇත. |
| (iii) මුදල් රෙගුලාසි 1645 | වාහන ලොග් සටහන් පොත් නිසියාකාරව නඩත්තු කිරීම සඳහා සියළුම රියදුරු මහතුන් වෙත උපදෙස් ලබා දී ඇත. අළුතින් ලොග් සටහන් පොත් සියළුමවාහන සඳහා යොදා ගැනීමට මේ වනවිටත් කටයුතු කර ඇත. |
| (ආ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යයන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ | |
| (i) xx වැනි පරිච්ඡේදයේ 3.1 | විශ්වවිද්‍යාල පද්ධතියේම අධ්‍යයන කාර්යය මණ්ඩලය පැමිණීම සහ පිටවීම සටහන් කරනු නොලබයි. එමනිසා මෙය අප විශ්වවිද්‍යාලයට පමණක් සිදුකල හැකි කටයුත්තක් නොවන අතර, මේ සඳහා විශ්වවිද්‍යාල පද්ධතියේම වෙනසක්සිදුකල යුතුය. මේ පිළිබඳව 2014 වසරේ පැවති COPE රැස්වීමේදී ද සාකච්ඡාකල අතර, ඒ සඳහා ක්‍රමවේදයක් ඇති කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ද එකඟ විය. |
| (ii) xxvi වැනි පරිච්ඡේදයේ 3.2 හා 3.3 | තොග සමීක්ෂණ වාර්තා වලින් පසුව විගණන අංශය වෙතින් දන්වනු ලබන ඌනතා සහ ස්ථාවර වත්කම් නැතිවීම හා අහිමිවීම පිළිබඳ ලැබෙන වාර්තාවලට අනුව ඉදිරියේදී කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ඉ) ) 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය 2.1.7 වගන්තිය ප්‍රකාරව | වෙනත් විශ්වවිද්‍යාලවලට මාරුවී ගිය සේවකයින් 3 දෙනෙකුට අදාලව නිරවුල් නොවූ ණය ශේෂයන් පවතියි. එම ණය නිරවුල් කරන ලෙස අදාළ විශ්වවිද්‍යාල වලට දැනුම් දී ඇති අතර සිහි කැඳවීම් ද යොමු කර ඇත. මෙම ශේෂය 2019 වසර තුල නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර මේ වන විටත් ගෙන ඇත. |
| (ඊ) උපකුලපතිවරයා විසින් නිකුත් කරන ලද 2010 දෙසැම්බර් 27 දිනැති අංක OU/F/IC/01 දරන උපදෙස් පත්‍රිකාව ප්‍රකාරව | අත්තිකාරම් මුදල් දින 30 ක් ඇතුලත නිරවුල් කිරීමට විශ්වවිද්‍යාලය සැම විටම කටයුතු කරනු ලැබේ. ඔබ විසින් සඳහන් කර ඇති අත්තිකාරම් මුදල් වලින් අත්තිකාරම් මුදල් 31 ක් 2018-02-28 සිට 2018-04-17 දක්වා විශ්වවිද්‍යාල සේවක වැඩ වර්ජනය පැවතීම නිසා නිරවුල් කිරීම සිදු කර ඇත්තේ අප්‍රේල්, මැයි මාසවලදීය. ඉතිරි මුදල් අත්තිකාරම් මුදල් ලබාගත් දින සිට දින 30 ක් ඇතුලත නිරවුල් කර නොමැති බව පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති නොවීමට අදාල |

සියළුම අංශ ප්‍රධානීන් හා සෙසු කාර්යය මණ්ඩලය දැනුවත් කිරීමට දැනටමත් කටයුතු කර ඇත.

2.3

2.4 (අ) පෙර වර්ෂවලදී කරන ලද සමීක්ෂණයන්හිදී පොත් අතිරික්තයක් මධ්‍යම පොත් බෙදාහරීමේ මධ්‍යස්ථානයේ පවතින බව නිරීක්ෂණය වී ඇත. මෙලෙස පොත් අතිරික්තයක් ඇති වීමට බලපා ඇති හේතු වනුයේ,

i. පාඨමාලා සඳහා අයදුම් කරන ලද සිසුන් සියළුදෙනා එම පාඨමාලාව සඳහා ලියාපදිංචි නොවීම.

ii. එක් එක් වසරවලදී පාඨමාලා සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාවේ උච්ඡාවචනයන් සිදුවීම.

iii. සිසුන් ලියාපදිංචි වන අවස්ථාවේදී සිසුන්ට අවශ්‍ය පොත් ලබාදිය යුතුවීම හා ලියාපදිංචිවීම සඳහා පැමණේයැයි ශිෂ්‍ය සංඛ්‍යාව නිරවද්‍යයව නිර්මාණය කිරීමේ දුෂ්කරතාවය.

iv. පාඨමාලා සඳහා ලියාපදිංචි වීම සිදුකරන සියළු ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථාන වලට සිසුන් පැමිණේදැයි අපේක්ෂාවෙන් අවශ්‍ය පොත් සපයා තිබීමේ අවශ්‍යතාවය.

v. පාඨමාලා ගුණාත්මකභාවය ඉහළ දැමීම සඳහා පාඨමාලා පොත් වරින් වර සංශෝධනයට ලක්කළ යුතුවීම යන කරුණුය.

ඉහත දක්වා ඇති හේතු මඟින් සිදුවන පොත් අතිරික්තයක් වලක්වා ගැනීම හැකිතාක් දුරට නිවැරදි පුරේකථනයන් ඇසුරින් පොත් අතිරික්තයන් අවම කිරීමට කටයුතු කර ඇත. ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන වල පොත් අතිරික්තය වලක්වා ගැනීම සඳහා ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථානවල පොත් ශේෂයන්හි නිරවද්‍යතාවය OMIS පද්ධතිය හරහා දැනගත හැකිවන පරිදි තොරතුරු තාක්ෂණ අංශය මඟින් දැනටමත් ක්‍රමවේදයන් සකසා ඇත. මුද්‍රණ ඇණවුම් සකස් කිරීමේදී එම අතිරික්තයන් ද සැලකිල්ලට ගෙන මුද්‍රණය කිරීමට දැනට පියවර ගෙන ඇත.

(ආ) මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ ඇස්තමේන්තුව පරිදි විශ්වවිද්‍යාලයේ සනීපාරක්ෂක කටයුතු නිසි පරිදි සිදුකිරීමට දිනකට කම්කරුවන් 50 ක් සේවයේ යෙදවිය යුතු බව නිවැරදි කරුණක් වේ. එහෙත් අදාළ සේවා සැපයූ සමාගම බොහෝ අවස්ථාවල දී ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු සිදු නොකළ අතර, මේ සම්බන්ධයෙන් නිරන්තරවම අදාළ සමාගම වෙත වාචිකව සහ දුරකතනය හරහා මෙන්ම ලිඛිතව ද අවවාද සිදුකරන ලදී. නමුත් අදාළ සමාගම එම දුර්වලතා නිවැරදි කරගැනීමට කටයුතු නොකරන ලදී. එබැවින් ඉදිරි පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ඇගයීම් කටයුතුවලදී ඒ පිළිබඳව තරයේ කටයුතු සිදුකළ අතර, මෙම සමාගම තාක්ෂණික කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

(ඇ) සෞඛ්‍ය විද්‍යා පීඨයේ පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කර ඉදිකිරීමේ (Design & Build) ක්‍රමවේදය යටතේ කැබිනට් මණ්ඩලය විසින් පත් කල ප්‍රසම්පාදන කමිටුව (SCAPC) මගින් කෙරේ. ඊට අවශ්‍ය මූලික කටයුතු එනම් ලංසු ලේඛන සැකසීම 2017 අවසාන කාර්තුව වන විට නිම කර තිබූ අතර මේ වන විට තාක්ෂණ ඇගයීම් කමිටු සැසි පවත්වා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබා ගනු පිණිස කැබිනට් මණ්ඩලයට යොමු කර ඇත. කැබිනට් අනුමැතිය ඒ සඳහා ලද වහාම තෝරා ගත් කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කටයුතු කෙරේ.

(ඈ) අධ්‍යයන පීඨයේ සිව්වන මහලේ වහලය අළුත්වැඩියා කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව සිදු කරගෙන යාමේදී සුමනසේකර කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම (කොන්ත්‍රාත්කරු) විසින් සිදු කල ගිවිසුම් කොන්දේසි කඩ කිරීම මත කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදී. ඊට අදාළ නීතිමය

කටයුතු සිදු කෙරෙමින් පවතියි. ඒ කෙසේ වෙතත් ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාළ ඉතිරි වැඩ මේ වන විට සම්පූර්ණයෙන් පාහේ නිම කර ඇත.

3. වෙනත් නිරීක්ෂණ
-------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

(අ) නිලධාරීන් 14 දෙනා පිළිබඳ විස්තර පහත සඳහන් පරිදිවේ.

1. <u>ටී.එම්. කරුණාරත්න</u>

අයවිය යුතු වටිනාකම අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර තිබුණ ද, නිවාඩු සම්බන්ධයෙන් පැන නැඟී තිබූ ගැටළුවක් නිසා අයකර ගැනීම ප්‍රමාද වී ඇත. දැනට එය අභ්‍යන්තර විගණන අංශය වෙත යොමුකර ඇත.

2. <u>එස්.යූ. මුණසිංහ</u>

අර්ථසාධක අරමුදල නිදහස් කර ගැනීමේදී අදාල නිලධාරියා විසින් ඉදිරිපත් කළ යුතු ලියකියවිලිවල අඩුපාඩු නිසා අයකර ගැනීම ප්‍රමාද වී ඇත. අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස එස්. යූ. මුණසිංහ මහතා වෙත දන්වා යවා ඇතත්, ඔහු විසින් ඒවා ඉදිරිපත් කර නැත. නීති කටයුතු මඟින් එම මුදල අයකර ගැනීමට තීරණය කර ඇත.

3. <u>ඒ.ඒ.සී. කාංචනා</u>

විශ්වවිද්‍යාලය දන්වා ඇති ආකාරයට බැඳුම්කරය ගෙවීම පැහැර හැරීම නිසා නීති කටයුතු මඟින් බැඳුම්කරයේ වටිනාකම අයකර ගැනීමට 2019.01.03 රැස් වූ නිවාඩු කමිටුව තීරණය කර ඇත. නඩු පැවරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

4. <u>සී.ජේ. ගීගනගේ</u>

අර්ථසාධක අරමුදල නිදහස් කර ගැනීමේ දී ඉදිරිපත් කළ යුතු ලියකියවිලි සහ ජාතික හැඳුනුම්පතෙහි හා ගුවන් ගමන් බලපත්‍රයෙහි සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන තුරු, අදාල මුදල අයකර ගැනීම ප්‍රමාද වී ඇත. කෙසේ වෙතත් ඔහු විසින් ඒවා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අර්ථ සාධක අරමුදල නිදහස් කර ගැනීමට යොමු කර ඇත.

5. <u>ජේ.සී.ඩී. ප්‍රීතිවිරාජ්</u>

වැටුප් රහිත කාල සීමාවට අදාලව ගිවිසුමේ වටිනාකම ගණනය කිරීම පිළිබඳව ගැටළුවක් පැවතුනි. එම ගැටළුව නිරාකරණය කරන තුරු ගිවිසුමේ වටිනාකම අයකර ගැනීම ප්‍රමාද වී ඇත. එම ගණනය කිරීමේ ක්‍රමවේදය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දන්වා ඇති අතර, ඒ අනුව ගිවිසුම ගණනය කර ප්‍රීතිවිරාජ් මහතාට දන්වා ඇත. කෙසේ වෙතත් 2019.03.07 පැවති නිවාඩු කමිටුවේ දී ඔහුට එරෙහිව නඩු පැවරීමට තීරණය කරන ලදී.ඒ අනුව නඩු පැවරීමේ කටයුතු කෙරෙමින් පවතී.

6. <u>යූ.ජී. ජයසේකර</u>

මෙම නඩුව පවරා ඇත්තේ යූ.ජී. ජයසේකර මහතාට හා ඔහුගේ ඇපකරුවන්ට එරෙහිවයි. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (නීති හා ප්‍රලේඛන) විසින් 2018.08.20 දිනැති ලිපිය මඟින් පිලිතුරු සපයා ඇත.

7. <u>ටී.බී. අබේසේකර</u>

සම්පූර්ණ බැඳුම්කරය ජයවර්ධනපුර විශ්වවිද්‍යාල චක්‍රලේඛ අංක 03/2014 ප්‍රකාරව පවරා ඇත. ඒ අනුව බැඳුම්කරයේ වටිනාකමින් 25% එම විශ්වවිද්‍යාලයට ගෙවීමත් ඉතිරි 75% වෙනුවෙන් නව බැඳුම්කරයට ඇතුළත් වීමත් කර ඇති බව ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා USJP/AE/MGT/08/03/PF/179 සහ 2018.05.08 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. එම ලිපියේ

පිටපතක් ජොෂ්ඨ සහකාර (නීති හා ප්‍රලේඛන) විසින් 2019.03.18 දිනැති ලිපිය මඟින් විගණන අංශයට ඉදිරිපත් කර ඇත.

8. **ජේ.ඒ.එස්.ඩී.සේතුංග**

මුල් ණයකරු හා ඇපකරුවන් දී ඇති ලිපිනයන් හැරගොස් ඇති බැවින් ද ඔවුන්ගේ වර්ථමාන ලිපිනයන් සොයා ගැනීමට උත්සාහ කලද අසාර්ථක වූ බැවින්ද නඩු පැවරීමට නොහැකි වී ඇත. අර්ථසාධක අරමුදලේ ශේෂය බැඳුම්කරයේ කොටසක් ලෙස අයකර ගැනීමට උත්සාහ කලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012.10.22 දිනැති ලිපිය අනුව එය කළ නොහැකි වී ඇත.

9. **එච්.කේ.ඩී.ඒ.ටී.එන්. අන්නක්කගේ**

මුල් ණයකරු හා ඇප කරුවන් දී ඇති ලිපිනයන් හැර ගොස් ඇති බැවින්ද ඔවුන්ගේ වර්ථමාන ලිපිනයන් සොයා ගැනීමට උත්සාහකළ ද අසාර්ථකවූ බැවින්ද නඩු පැවරීමට නොහැකිවී ඇත. අර්ථසාධක අරමුදලේ ශේෂය බැඳුම්කරයේ කොටසක් ලෙස අයකර ගැනීමට උත්සාහකළ ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012.10.22 දිනැති ලිපිය අනුව එය ද කළ නොහැකිවී ඇත.

10. **ඩබ්.එස්.ටී. ෆෝන්සේකා**

නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකොට ඇත.

11. **එම්.කේ.එම්.පී.සී රාජපක්ෂ**

ගිවිසුම කඩ කළ මුල් අවධියේදීම නඩු පවරා ඇත. නමුත් මුල් ණයකරු හා ඇපකරුවන් දී ඇති ලිපිනයන් හැර ගොස් ඇති බැවින්ද ඔවුන්ගේ වර්ථමාන ලිපිනයන් සොයා ගැනීමට උත්සාහකළ ද අසාර්ථක වූ බැවින්ද ඉදිරි කටයුතු කිරීමට නොහැකිවී ඇත.

12. **එස්. දලුවත්ත**

ගිවිසුම කඩ කළ මුල් අවධියේ දීම නඩු පවරා ඇත. නමුත් මුල් ණය කරු හා ඇප කරුවන් දී ඇති ලිපිනයන් හැරගොස් ඇති බැවින්ද ඔවුන්ගේ වර්ථමාන ලිපිනයන් සොයාගැනීමට උත්සාහකළ ද අසාර්ථක වූ බැවින්ද ඉදිරි කටයුතු කිරීමට නොහැකිවී ඇත.

13. **පී. සමරනායක**

ගිවිසුම කඩකළ මුල් අවධියේදීම නඩු පවරා ඇත. නමුත් මුල් ණයකරු හා ඇපකරුවන් දී ඇති ලිපිනයන් හැරගොස් ඇති බැවින්ද ඔවුන්ගේ වර්ථමාන ලිපිනයන් සොයාගැනීමට උත්සාහකළ ද අසාර්ථක වූ බැවින්ද ඉදිරි කටයුතු කිරීමට

14. **වී.ජී.එස්. ඒකනායක**

ගිවිසුම කඩ කළ මුල් අවධියේදීම නඩු පවරා ඇත. නමුත් මුල් ණයකරු හා ඇපකරුවන් දී ඇති ලිපිනයන් හැරගොස් ඇති බැවින්ද ඔවුන්ගේ වර්ථමාන ලිපිනයන් සොයාගැනීමට උත්සාහකළ ද අසාර්ථක වූ බැවින්ද නඩුපැවරීමට නොහැකිවී ඇත.

(ආ) මෙම අය නොවූ සේවක ණය වලින් සේවකයින් 6 දෙනෙකුට අදාලව රු. 6,400.00 වූ ණය මුදල හැරුණු කොට ඉතිරි ණය මුදල්, සැපයුම් හා මුදල් චක්‍රලේඛ අංක. 40 හා 59 ට අනුව අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදි අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ.

(ඇ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම වසරින් වසර යාවත්කාලීන කර මහා භාණ්ඩාගාරය වෙත ද යවනු ලැබේ. මෙය පාදක කර මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන නිකුත් කරනු ලැබේ.

ක්‍රියාකාරී සැලැස්ම වසර 04 කට පිළියෙල කර තිබුනත් එය ප්‍රගති සමාලෝචනයක් කර වසරින් වසර යාවත්කාලීන කර විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ඉදිරිපත් කර අනුමැතිය ගනු ලැබේ.

(ඇ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2018.12.02 "Sunday Observer" පුවත්පත් දැන්වීමක් පලකර ඒ සඳහා ලැබූ අයදුම්පත් වලින් සෞඛ්‍ය විද්‍යා පීඨයේ හා ඉංජිනේරු තාක්ෂණ පීඨයේ බඳවා ගැනීම් සිදුකර අවසන් අතර, අධ්‍යාපන පීඨයේ බඳවා ගැනීම් සිදුකරමින් පවතී. ඉතිරි අධ්‍යයනාංශ සඳහා පුරප්පාඩු දැන්වීමක් පලකිරීමට කටයුතු කරමින් පවතී.

සමහර අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල තනතුරු "දරන්නාට පෞද්ගලික වනසේ" කාර්ය මණ්ඩල වාර්තාවේ සදහන් වන බැවින් ඒම තනතුරු පුරප්පාඩු වූ විට නැවත බඳවා ගැනීම් සිදුකල නොහැකි බැවින් අදාළ තනතුරු පුරප්පාඩු ලෙසම පවතී.

කෙසේ වෙතත් මේ වනවිට අධ්‍යයන හා අධ්‍යන සහායක කාර්ය මණ්ඩල තනතුරු කිහිපයක් පුරවා ඇත.

පරිපාලන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිදුකරනු ලැබේ.

බඳවා ගැනීම් පරිපාටියේ ඇති ගැටළු හේතුවෙන් මුද්‍රණාලාධිපති තනතුරු වෙනුවට සහකාර මුද්‍රණාලාධිපති තනතුර පිරවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුම් දී ඇත. ඒ අනුව, ඒ සඳහා පුරප්පාඩු දැන්වීමක් 2019-03-31 "Sunday Observer" පුවත්පතෙහි පලකර ඒ සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ/ප්‍රාදේශීය අධ්‍යාපන සේවා තනතුරු, චිත්‍රණ ශිල්පී තනතුරු, පුහුණු ඉංජිනේරු තනතුරු සඳහා පුවත් පත් දැන්වීම් පලකර ඒ සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ/ප්‍රාදේශීය අධ්‍යාපන සේවා තනතුර සඳහා නව බඳවා ගැනීම් නොකරන අතර සහකාර අධ්‍යක්ෂ/ප්‍රාදේශීය අධ්‍යාපන සේවා තනතුරේ උසස් වීම් මඟින් එම තනතුර පුරවනු ලැබේ.

අනධ්‍යයන සේවකයන් විශ්‍රාම යාම, සේවයෙන් ඉල්ලා අස්වීම, වෙනත් තනතුරුවලට පත්වීම වැනි හේතූන් නිසා පුරප්පාඩු ඇතිවන අතර, එම පුරප්පාඩු පිරවීමට නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැති ලබා ගත යුතුවේ. එම අනුමැතිය ලබා ගැනීමට යම් කාලයක් ගත වන අතර එතෙක් පුරප්පාඩු පිරවීමට නොහැකියි.

අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ බොහෝ තනතුර පුරප්පාඩු පිරවීමේ දී බඳවා ගැනීමේ පරිපාටි අනුව පළමුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතනය අතරින් අභ්‍යන්තරව අයදුම්පත් කැඳවිය යුතු වේ. එවිට මෙම විශ්වවිවද්‍යාලයේම සේවය කරන සේවකයින් එම තනතුරුවලට තේරී පත්වන අවස්ථාවලදී එක් තනතුරක පුරප්පාඩු පිරවෙන නමුත් වෙනත් තනතුරක් පුරප්පාඩු වේ. එවිට එසේ ඇතිවන පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නැවත අනුමැතිය ලබා ගත යුතුවේ.

එබැවින්, විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරුවල පුරප්පාඩු පිර වූවද මුළු පුරප්පාඩු සංඛ්‍යාවේ සැලකිය යුතු වෙනසක් ඇති නොවේ.

අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ බොහෝ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නාම ලේඛන ලබාගෙන එම නාම ලේඛනවල සඳහන් අයට අයදුම්පත්‍ර යවා ඒවා නැවත ගෙන්වා ගෙන බඳවා ගැනීම් සිදුකළ යුතු නිසා ඒ සඳහා ද සැලකිය යුතු කාලයක් ගතවේ.

අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු බාහිරව පිරවීමේදී පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවීමට අවස්ථාව ලබා දෙන්නේ නම් සහ දැනට සිටින සේවකයන් විශ්‍රාම යාම, සේවයෙන් ඉල්ලා අස්වීම, වෙනත් තනතුරුවලට පත්වීම වැනි හේතූන් නිසා ඇතිවන පුරප්පාඩු පිරවීමට නැවත අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගත යුතුය යන අවශ්‍යතාවය ඉවත් කරන්නේ නම් මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගතවන කාලය අවම කර ගත හැකි වේ.

2018 වර්ෂයේ දී ඒක ශ්‍රමික පිරිවැය වැඩිවී ඇත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 මගින් 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනයක් සිදුවීම නිසා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මූලික වැටුප පදනම් කරගෙන ගණනය කරනු ලබන දීමනා සහ ගෙවීම් වැඩිවීමත් නිසාය.

(ඉ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලය දැනුවත් වී ඇත.

විවෘත විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී හා සංයුක්ත සැලැස්ම (2016-2020) සකස් කරන ලද අවස්ථාවේදී තිරසාර සංවර්ධන අරමුණු ඇතුලත් කර පළියෙල කරන ලදී. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 04 "Widen Access to Education and Increase Opportunities for Life-long Learning" ඉටුකිරීම මූලික අරමුණවේ. එනමුත් ඉලක්ක අරමුණු ඉටුකර ගැනීමේදී ප්‍රමාදයන් සිදුවී ඇත. ඉදිරියේදී එම ප්‍රමාදයන් වලක්වා ඉලක්ක අරමුණු වෙත ලඟාවීමට කටයුතු සම්පාදනය කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙමි.

(ඊ) මුදල් රෙගුලාසි 133 සහ 134 සඳහන් විධිවිධාන සහ කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල චක්‍රලේඛන අනුව ආයතනයේ අභ්‍යන්තර පාලනයේ අඩුපාඩු හඳුනාගැනීම සහ ඒවා වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණකගේ සහාය ලබාගැනීම සඳහා මේ වන විටත් කටයුතු කර ඇත.මේ සඳහා අභ්‍යන්තර විගණ අංශයෙන්;

i. වාචික උපදෙස් අවශ්‍ය වූ සෑම විටම ලබාගැනීමට කටයුතු කර ඇත.

ii. අභ්‍යන්තර විගණන විමසුම් වාර්තා මගින් පෙන්වා දෙනු ලබන අභ්‍යන්තර පාලනයේ අඩුපාඩු හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම මෑත කාලයේ සිට වේගවත් කර ඇත.

අභ්‍යන්තර විගණනය විසින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු හා නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව විගණන කමිටුවේ ද අවධානය යොමු කර ඇත.

එමනිසා, ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අභ්‍යන්තර විගණනය යොදා ගැනිම වඩා වේගවත්ව නිසිපරිදි යොදා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(උ) 2017 ට සාපේක්ෂව 2018 වසරේ රජයෙන් ලද පුනරාවර්ථන ප්‍රදාන වල වැඩිවීමක් සිදුවී ඇතත්, එය ස්ථිර සේවක වැටුප් ගෙවීමට කිසිසේත් ප්‍රමාණවත් නොවුනි.

2018 වසරේ පැවති අඛණ්ඩ සේවක වැඩවර්ජනය හේතුවෙන් අධ්‍යයන කටයුතු අඩාල වීම, අභ්‍යන්තර ආදායම් ප්‍රභවයන්ගේ ලැබීම් අඩුවීමට හේතුවිය.

(ඌ) විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරනු ලබන ඉඩම් වලින් ඇතැම් ඉඩම් සඳහා විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූල හිමිකමක් නැතත් එම ඉඩම් වල නීත්‍යානුකූලව අයිතිය ලබාගැනීමට විශ්වවිද්‍යාලය නිරන්තරයෙන්ම කටයුතු කරමින් සිටියි.

(එ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මධ්‍යස්ථාන බොහෝමයක පුස්තකාලය වෙනුවෙන් වෙනම ඉඩක් මෙතෙක් කල් වෙන් කොට නොතිබුනි. එම පොත් පත් කබඩ් වල අසුරා පාඨකයන් වෙත ලබාදීමට ප්‍රමාණවත් පහසුකම් නොතිබීම නිසා ශිෂ්‍යයන් වෙත එම පොත් පත් නිසිලෙස ලබාදීම අරමුණු කොට ගෙන පුස්තකාල කමිටුව විසින් ගන්නා ලද තීරණයක් අනුව අධ්‍යයන මධ්‍යස්ථාන වල තිබූ සියළුම පොත් ආසන්නතම ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙත අනුයුක්ත කරන ලදී.
ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයන්හි වෘත්තීමය වශයෙන් පුහුණු කරන ලද පුස්තකාල කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කොට ඇති බැවින් එම පොත් පරිශීලනය සඳහා සිසුන් වෙත ලබාදීම කාර්යක්ෂමව සිදුවේ.

(ඒ) තොග සමීක්ෂණයෙන් හඳුනාගත් චලනය නොවන තොග ගබඩාවෙන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.

(ඓ) මූල්‍ය අංශයෙන් ලබාගන්නා තොරතුරුවලට අනුව ආයතන අංශයේ උපලේඛන සංශෝධනය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ඔ) ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයට භාරදෙන අවස්ථාවේ ක්‍රියා විරහිත හෝ අක්‍රියව පැවැති විදුලි ජනක යන්ත්‍ර, පරිගණක හා අක්‍රිය අනිකුත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා නිර්දේශිත ආයතන සමඟ ගිවිසුම් සකසා වාර්ෂිකව නඩත්තු කිරීම ආරම්භකර ඇත. අලුත් විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමෙන් පසුව මිලදී ගැනීමට නියමිතය.

(ඕ) පොලිතින් ඇසුරුම් යන්ත්‍ර විශ්වවිද්‍යාලයේ විදුලි හා පරිගණක අංශය වෙත ලබාදී ඇත.

(ඖ) අංක 7417821 දරණ ගිණුමෙහි ශේෂය 2019 වසරේ සිට අවම මට්ටමකින් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.

අංක 0174-1001-7-0350215 දරණ සේවක ගෙවීම් සම්බන්ධ ජංගම ගිණුමට සරප් විසින් එදිනෙදා බැංකු ගත කරනු ලබන මුදල් හා භාණ්ඩාගාරයෙන් පුනරාවර්ථන වියදම් සඳහා ලැබෙන මුදල් බැර කරනු ලබයි. වැටුප් හා අනෙකකුත් සේවක ගෙවීම් සිදු කිරීම සඳහා මෙම ගිණුමෙහි දෛනිකව සැලකිය යුතු ශේෂයක් පවත්වාගෙන යාමට විශ්වවිද්‍යාලයට සිදුවේ.

(ක) විගණන කමිටුවේ අවසාන කමිටු රැස්වීමේදී පැහැදිලි කල පරිදි සෑම වසර හතරකටම වරක් පාඨමාලා සංශෝධනය කළ යුතු බව Norms ලියවිල්ලෙහි සඳහන් වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ගුරුවරුන්ගේ Norms සඳහන් ව ඇත්තේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකල යුතු අවම කාර්යන් පිළිබඳවයි. මෙම ලියවිල්ලට අනුව අධ්‍යයන කාර්යය මණ්ඩලය අවුරුදු 04 ක් තුල අවම වශයෙන් පාඩම් 16 ක් වත් කල යුතුවේ. වර්තමානයේ විශ්වවිද්‍යාලය සතුව පාඨමාලා 1000 ක් පමණ ඇති අතර, එක පාඨමාලාවක සාමාන්‍ය පාඩම් සංඛ්‍යාව 25 ක් පමණ වේ. එම නිසා පාඨමාලාවන්ට අදාල සියළු පාඩම් 25,000 කට වඩා තිබේ. සියළු අධ්‍යයන කාර්යය මණ්ඩල Norms වලට අදාලව කළයුතු උපරිම පාඩම් වසර 04 ක් තුල 6,000 ක් පමණ වේ. එම නිසා මෙමඟින් පාඨමාලා සෑම වසර 04 කට වරක් සංශෝධනය කල නොහැකි බව පැහැදිලිවේ. කෙසේ වෙතත් අවශ්‍ය අවස්ථාවලදී පාඨමාලා සංශෝධනය කිරීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත.

(ඛ) 2018 වර්ෂයේ නොවැම්බර් මාසය වන විට නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් විකසනය (Development) කිරීම සඳහා නව සේවක මණ්ඩලයක් සේවයට බඳවා ගෙන, අදාළ මූලික වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(ග) විශාල පිරිවැයක් වියදම් කොට නවීන තාක්ෂණික උපකරණ සහිතව ඉදිකරන ලද මාධ්‍ය මන්දිරය මඟින් පෙර බාහිර පටිගත කිරීම් සිදුකොට අතිරේක ආදායම් උපයා තිබුන ද මේ වන විට ප්‍රමාණාත්මක කාර්ය භාර්යක් ඉටු නොවන බව විගණන වාර්තාවෙහි සඳහන් කොට ඇත.

මෙම ආයතනය පිහිටුවා වසර 24 ක් ගතවී ඇති අතර, පටිගත කරන උපකරණ වසර 8 කට පෙර ඩිජිටල් තාක්ෂණයට පරිවර්ථනය කර ඇත. මෙම ආයතනය ප්‍රධාන වශයෙන් ගොඩ නඟන ලද්දේ අධ්‍යයන පීඨවල ශ්‍රව්‍ය-දෘෂ්‍ය අධ්‍යයන ද්‍රව්‍ය නිපදවීම සඳහා වුවත්, පෙර සිටම මෙම ආයතනයේ තාක්ෂණික උපකරණ නඩත්තුවට හා විශ්වවිද්‍යාලයට ආදායම් ඉපයීම සඳහා ද දායකත්වයක් දැරීමට, ආදායම් උපයන ආයතනයක් ලෙස කටයුතු කිරීමට සිදුවිය.

විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ද්‍රව්‍ය නිපදවීම සඳහා දායකත්වය සලකා බැලුවහොත් 2017/2018 වසර වල මානව ශාස්ත්‍ර පීඨය සඳහා වීඩියෝ වැඩසටහන් 26 ක් ද, සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා වැඩසටහන් 24 ක් ද, ඉංජිනේරු තාක්ෂණ පීඨය සඳහා වැඩසටහන් 04 ක් ද, ස්වභාවික විද්‍යා පීඨය සඳහා වැඩසටහන් 06 ක් ද නිපදවා ඇත. ඒ සමඟම විශ්වවිද්‍යාල ආචාර්යවරුන් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් නිපදවීම සඳහා සිදුකල පුහුණු වැඩසටහන් වලදී මෙම මධ්‍යස්ථානය උපරිම ලෙස දායකත්වය දක්වා ඇත.

ඒ සමඟම විශ්වවිද්‍යාලයේ සිදුකරනු ලබන සියළුම වැදගත් අවස්ථා වල ශ්‍රව්‍ය-දෘෂ්‍ය ආවරණය සිදුකරනු ලබන්නේද මධ්‍ය මධ්‍යස්ථානය මඟිනි. ඒ අනුව විශ්වවිද්‍යාලයේ සිදුකරන සියළුම උත්සව, ආරාධිත දේශණ සහ අනෙකුත් විශේෂ අවස්ථාවලදී අදාල ඡායාරූප ගතකිරීම සහ ඒවා රැස්කර තැබීමත් මාධ්‍ය මන්දිරය මඟින් සිදු කරනු ලබයි.

ඔබ විසින් සඳහන් කර ඇති අයුරින් වසර 05 කට පමණ පෙර මාධ්‍ය මන්දිරයේ ශබ්දාගාරය කුලියට දීම මඟින් ප්‍රමාණාත්මක ආදායමක් ඉපයීම සිදුවූ අතර, ප්‍රධාන ලෙස එම සේවාව ලබාගනු ලැබුවේ ජාතික රූපවාහිනී ආයතනයයි. නමුත් වත්මන් තත්ත්වය වන්නේ රාජ්‍ය රූපවාහිනී නාලිකා මෙන්ම පෞද්ගලික නාලිකා ද ඔවුන්ගේ ම ශබ්දගාර ගොඩනගා ඇති අතර, නව තාක්ෂණය මඟින් කුඩා ඉඩක වඩා හොඳින් පටිගත කර ගැනීමට හැකියාවක් ලැබීමෙන් ශබ්දාගාරයක් ලෙස මාධ්‍ය මධ්‍යස්ථානයේ ඉල්ලුම පහත බැස තිබීමයි.

එසේ නමුත් වර්තමානයේ වසර 05 කට කාලයක සිට විවෘත විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවය සහ සහතික ප්‍රදානෝත්සවය ආවරණය කිරීම සහ උපාධිලාභීන්ගේ ඡායාරූප කරනය සිදුකිරීම මඟින් ද ඉහත ආදායම් ඉපයීමට සමානවම වාර්ෂික ප්‍රමාණාත්මක මුදලක් උපයන බව දන්වා සිටිමි.

පසුගිය කාලය තුල මාධ්‍ය මධ්‍යස්ථානය මඟින් උපයන ලද මුදලින් සියළුම පිරිවැය සහ විශ්වවිද්‍යාලයේ විවිධ අංශ වලට වෙන් කල ප්‍රතිශතයන් හැර මධ්‍යස්ථාන අරමුදල වශයෙන් රු. 43,491,268/- ක් 2018-12-31 වන විට රැස්කරගෙන ඇත. 2017 වසරේ ලබා ඇති මුළු ආදායම රු. 7,307,500.00 වන අතර, එයින් මධ්‍යස්ථාන අරමුදලට රු. 2,955,697.00 ක මුදලක් බැරකොට ඇත. 2018 වසරේ මුළු ආදායම රු. 10,370,350.00 වූ අතර, අරමුදලට රුපියල් මිලියන 4.1 ක මුදලක් බැර කිරීමට අපේක්ෂිතව ඇත.

පසුගිය වසර 07 ක පමණ කාලයක් තුල අවශ්‍ය තාක්ෂණික උපකරණ සහ බොහෝ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මුලුමනින්ම මධ්‍යස්ථාන අරමුදලින් මුදල් වැයකල බවද සඳහන් කරමි.

ඒ අතර මාධ්‍ය මධ්‍යස්ථානයේ නව අංගයක් ලෙස මෙම අංශය මඟින් නිපදවා ඇති වීඩියෝ වැඩසටහන් Open Youtube හරහා පොදුවේ කාහටත් නැරඹීමටත්, Open Cast හරහා විශ්වවිද්‍යාල ප්‍රාජවටත් නැරඹීමේ පහසුකම් සලසා ඇත. ලෝකයේ විවිධ රටවලින් පැමිණෙන විද්වතුන්ගේ දැනුම බෙදාහැරීම සහ සංග්‍රහ කිරීම සඳහා දේශන මාලාවක් පවත්වා ඒවා අන්තර්ජාලයට මුදාහැරීමටත් මාධ්‍ය මධ්‍යස්ථානය මඟින් සිදු කරයි.

ආරම්භයේදී මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලය 45 කට ආසන්න පිරිසකින් සමන්විතව කටයුතු කල ද දැනට අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලය 20 ක පමණ පිරිසක් දායකත්වයෙන් වුවද විශ්වවිද්‍යාලීය පීය සඳහා සේවා සපයන්නෙකු ලෙසත්, ආදායම් උපයන මධ්‍යස්ථානයක් ලෙසත් ප්‍රමාණාත්මක සේවාවක් සිදුකර ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි.

